# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 14,421 — 1965 ජූනි 11 වැනි සිකුරාදා — 1965.6.11**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)

# I වැනි කොටස: (II) වැනි ජේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)



| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු | 657 | තෝරාපල් වෛද්‍ය හා වෙනත් වෛද්‍ය විකිණීම | 690 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය | 662 | ආණ්ඩුවේ නොවන දැන්වීම | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම | 663 | රට හිම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම | 689 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම | — |
| ඔඩුබෑහිරුදිය විකිණීම | 689 | විවිධ දැන්වීම | — |



## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි

**දීමනා.**—ජෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

**3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස්පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩදෙනු ලැබේ. නිලධාරීයා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට $7\frac{1}{2}$ කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවාවෙහි සිටින්නන්ට හැර සෙසු අයට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්තම් මිස, යථා යෝග්‍ය පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරනු ලබන නව ප්‍රවේශකයන්ගේ ආධුනික/පරීක්ෂා කාලය අවුරුදු තුනක් වන්නේ ය.

(ii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාත්, විශේෂයෙන් ම වර්ෂ 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පනවා ඇති ව්‍යවස්ථා වලට මෙන් ම මින්මතු පනවනු ලබන ව්‍යවස්ථා වලට ද අනුකූලව නව ප්‍රවේශකයන් ක්‍රියා කළ යුතුය.

(iii) (ඒ) ඔවුන් තම ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයයෙන් ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(බී) ආධුනික/පරීක්ෂා කාලය ගතවී අවසන් වූ විට සේවයෙහි ස්ථිර කරන්නේ වෙනත් කරුණු අතර කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීණතා තත්ත්වය තෙක් වර්ග කර ඇති සිංහල ප්‍රවීණතා පරීක්ෂණවලින් ඔවුන් නියමිත කාලසීමා ඇතුළත සමත්වීම උඩය. නියමිත කාලසීමාව ඇතුළත මෙම ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත්වීමට අපොහොසත් වුවහොත් ඒවා සමත්වන තෙක්, ලැබිය යුතු පඩි වැඩිවීම් නොගෙවා හැරීම එහි ප්‍රතිඵලය වන්නේ ය. තම ආධුනික/පරීක්ෂා කාලය කෙළවර වන විට කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීණතා තත්ත්වයේ විභාගයෙන් සමත් නොවන යම් නිලධාරියෙක් වේ නම් ඔහුගේ සේවය කෙළවර කළ හැකි වන්නේ ය.

**සංලක්ෂ්‍යය.**—සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබා රාජ්‍ය සේවයට බැඳෙන අය සේවයෙහි ස්ථිර කිරීමට පෙර සිංහල ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත්වීමේ නියමයෙන් නිදහස් වෙති.

(iv) මෙම ධුරයෙහි සේවය ස්ථිර කරන දින සිට අවුරුදු දෙකක් ඇතුළත සිංහල භාෂාව පිළිබඳව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීණතා තත්ත්වයේ කාර්යක්ෂමතා කඩඉම පරීක්ෂණය කින් සමත්වීමටද ඔවුන්ට නියම වනු ඇත.

**5. අවශ්‍ය සුදුසුකම්.**—(i) තමා ලාංකිකයකු වූ බවට සෑහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවකු විසින් ඉදිරිපත් කළ යුතුය. "ලාංකික" යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

(ii) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට උසස් විභාගයකින් සමත්ව සිටීම අවම අධ්‍යාපනික සුදුසු කම් ලෙස නියම්කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන්නකු සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලත් සිංහලයකු වෙතොත් ඔහු ජ්‍යෙෂ්ඨ

7. අයදුම්පත් හා ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක් ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වෙනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි වලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්පත් ලැබුනු බව දන්වනු ඇත. සත් දිනක් ඇතුළත තම අයදුම්පත ලැබුනු බව දන්වන ලිපියක් නොලත් අයදුම්කරුවෙකු වෙත් නම්, වහාම ඒ බව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත දැන්විය යුතුය. කිසියම් අයදුම්කරුවෙකු මෙම අවශ්‍යතාවය පැහැර හැරියොත් තම අයදුම්පත සලකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමි වනු ඇත.

බී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1965 ජූනි මස 7 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහලේකම්
ගොඩනැගිල්ලේ රාජ්‍ය සේවා කොමිෂන්
සභා කාර්යාලයේදී ය,
තැපැල් පෙට්ටිය 500.

6–487—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

---

## දකුණු කොළඹ රික්වෙස්ට් උසාවියේ කාර්යාල කාර්ය සහායක තනතුර

අධිකරණ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවල සේවය කරණ ඉහත සඳහන් පුරප්පාඩු වී ඇති තනතුරට උසස් වීමට හිමිකම් ඇති කණිෂ්ඨ සේවකයින් ගෙන් එම තනතුර සඳහා වූ ඉල්ලුම් පත් 1965 ජූලි මස 1 වැනි දින දක්වා මා විසින් භාර ගනු ලැබේ. ඉල්ලුම් පත් ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය.

අයදුම්කරුවන් තම අයදුම්පත්වල පහත සඳහන් විස්තර සඳහන් කළ යුතුය :—

(අ) වයස :————.

(ආ) අධ්‍යාපනික සුදුසුකම් (සමත් වී ඇති උසස් ම විභාගය) :————.

(ඇ) රජයේ සේවයට පත් වූ දිනය :————.

(ඈ) දැනට, සේවා තත්ත්වය :————.

ජේ. ජී. ඇල්. සවාරිස්,
රික්වෙස්ට් කොමසාරිස්, දකුණු කොළඹ.

1965 මැයි මස 28 වන දින,
දකුණු කොළඹ රික්වෙස්ට් උසාවියේ දීය.

6–401—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

### පුරප්පාඩුවක්—I වෙනි පංතියේ ගොඩනැංවීම් පෝර්මන් තනතුර

මණ්ඩලීය සංවිධානයේ සිවිල් ඉංජිනේරු කොට්ඨාසයේ 1 වෙනි පංතියේ ගොඩනැංවීම් පෝර්මන් තනතුර සඳහා ඉල්ලුම්පත් එවන මෙන් ලංකාවේ පුරවැසියන්ට මෙයින් ආරාධනය කරනු ලැබේ.

2. පඩි ක්‍රමය.—(සියලු දීමනා ඇතුළුව) මසකට :—
රු. 350—රු. 15 × 15—රු. 575.
රු. 440 ට හා රු. 515 ට ප්‍රථම කාර්යක්ෂමතා කඩයිම.

සැ. යු.—තෝරා ගනු ලබන අපේක්ෂකයා ඔහුට ඇති සුදුසුකම් හා පළපුරුද්ද අනුව යථෝක්ත පඩික්‍රමයේ සුදුසුපියවරක තැබිය හැක.

3. සුදුසුකම්.—

(i) 1965.6.1 වෙනිදට වයස අවුරුදු 25 ට නොඅඩුවූද 40ට නොවැඩිවූද විය යුතුයි.

(ii) කණිෂ්ඨය හෝ ඊට සමාන විභාගයකින් සමර්ථ වී සිටිය යුතුයි. ගණිතයෙන් හා සිංහලෙන් සමර්ථ වී ඇත්නම් වඩා හොඳය.

(iii) පිළිගත් ගොඩනැංවීම් ඉංජිනේරු ආයතනයක හතර අවුරුදු ආධුනිකත්වයකුත් ඉන්පසු වානේ හා රින්පෝස්ට් ගොඩනැඟිලි ගැලවීම හා ඉදිකිරීම ගැන 3න් අවුරුද්දක ප්‍රායෝගික පළපුරුද්දක් තිබීම.

(iv) විදුලි වාප වැල්ඩිං කිරීමය, ගෑස් වැල්ඩිං කිරීමය, රිවෙට් කිරීමය, රින්පෝස්ට් තැබීමය යන මේවා ගැන පළපුරුද්දක් හා ටෙම්ප්ලේට්ස් හා ජිග් අඑවූ පිළියෙළ කිරීම ගැන හැකියාවක් තිබීම.

(v) ලංකා කාර්මික විද්‍යාලයේ ගොඩනැංවීම් ඉංජිනේරු පාඩම් මාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කළ අයදුම්කරුවන්ට හෝ බඩු ප්‍රමාණ සටහන්පත්‍ර, උපකරණ ලැයිස්තු පිළියෙළ කිරීම ගැන හැකියාවක් තිබෙන අය හා කම්කරු පාලනය ගැන පළපුරුද්දක් ඇති අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

4. සංයුක්ත මණ්ඩලවල සිටින්නාවූද දැන්වීම් අනුව සුදුසුකම් ඇත්තාවූද නිලධාරීන් එවන ඉල්ලුම්පත්‍ර සැලකිල්ලට භාජන කරන්නේ ඒ නිලධාරීන් දැන් සේවය කරන සංයුක්ත මණ්ඩලයේ සභාපති මහතා හෝ සාමාන්‍යාධිකාරී මහතා ඔවුන් (පත්කිරීමට) තේරුණොත් තම සේවාවෙන් නිදහස් කිරීමට එකඟ වෙතොත් පමණකි. ඉල්ලුම්පත්‍ර සංයුක්ත මණ්ඩලය මගින් එවිය යුතුයි.

5. සේවා කොන්දේසි.—තේරුණ අපේක්ෂකයා 1 වෙනි වතාවේදී තුන් අවුරුදු ප්‍රවාසන කාලයක් පිට පත්කරනු ලැබේ. ඔහුට පහත පෙනෙන දේ කිරීමට නියම කරනු ලැබේ :—

(1) පත්වීමට කලින් ශාරීරික යෝග්‍යතාව සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණයකින් සමර්ථ වීම ;

(2) දැනටමත් පනවා ඇත්තාවූද කලින් කල පනවන්නාවූද මණ්ඩලීය ව්‍යවස්ථාවන් හා රෙගුලාසි පිළිපැදීම ;

(3) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම වස්, ප්‍රවාසන කාලය තුළදී මණ්ඩලය විසින් නියම කරන ප්‍රමාණයට සිංහලෙන් ප්‍රවීණත්වයක් ලබා ගැනීම ;

(4) මණ්ඩලීය අර්ථ සාධක අරමුදල සඳහා පඩියෙන් සියයට 10 ක් දායක මුදල් ගෙවීම. ඔහු වෙනුවෙන් ගෙවන මණ්ඩලීය දායක මුදල් සියයට 15 කි ;

(5) ලංකාවේ කොයි පෙදෙසහිත්, මණ්ඩලීය සංවිධානයේ කොයි කොට්ඨාසයෙහිත් සේවය කිරීම.

6. ඉල්ලුම්පත්‍ර මෙම දැන්වීමට පහතින් දක්වා ඇති ආදර්ශ පෝර්මය අනුව පිළියෙළ කර කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි සිටින ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවකමණ්ඩල කළමනාකාරතැන වෙත 1965 හේ ජූනි මස 28 වෙනිදට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ එවිය යුතුයි.

1965 හේ ජූනි මස 1 වෙනි දින,
කොළඹ 5, කිරුළ පාරේ,
200 වෙනි ස්ථානයේදීය.

ලංකා ගමනාගමන මණ්ඩලයේ
සේවකමණ්ඩල කළමනාකාරතැන.

## ලංකා ගමනාගමන මණ්ඩලය

### I වෙනි පංතියේ ගොඩනැංවීම් පෝර්මන් තනතුර සඳහා අයදුම් පත

1. සම්පූර්ණ නම :————.

2. ලිපිනය :————.

3. උපන් දිනය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණන්න.)

4. 1965.6.1 වෙනිදට වයස : අවුරුදු :————, මාස :————, දවස් :————.

5. විවාහකද, අවිවාහකද යන වග :————.

6. (අ) සාමාන්‍ය අධ්‍යාපනය :—

| සිට | දක්වා | පාඨශාලාවේ හෝ විද්‍යාලයේ නම |
|---|---|---|
| ———— | ———— | ———— |
| ———— | ———— | ———— |

(ආ) සමත්වූ උසස්ම විභාගය :————.
(දිනයන් සහිත ගත් විෂයයන් දක්වන්න. පිටපත් අමුණන්න.)

7. (අ) උසස්/වෛධික අධ්‍යාපනය :—

| සිට | දක්වා | කාර්මික විද්‍යාලය හෝ විශ්ව විද්‍යාලය | පාඨශාලාවේ නම |
|---|---|---|---|
| ———— | ———— | ———— | ———— |
| ———— | ———— | ———— | ———— |

(ආ) සමත්වූ විභාග :————.
(වෘත්තීය හා/හෝ වෛධික සුදුසුකම්, ගත් විෂයයන් සමග දිනයන් සඳහන් කරන්න. පිටපත් අමුණන්න.)

8. සිංහලෙන් සමත් වූ උසස්ම විභාගය :————.

9. ප්‍රායෝගික පුහුණුව (ආධුනිකත්වය) :—

| සිට | දක්වා | සමාගමේ හෝ ආයතනයේ නම |
|---|---|---|
| ————. | ————. | ————. |
| ————. | ————. | ————. |

10. පුහුණුවීමෙන් පසු ලැබූ පළපුරුද්ද :————.
(ස්වාමියාගේ නම, දැරූ තනතුරු, කළ කර්තව්‍යයන් දිනයන් සමග කෙටි විස්තරයක් දක්වන්න.)

11. පාසැලින් අස්වූ ද සිට කළ රැකියාවන් :————.

12. දන් දරන තනතුර හා පඩිය :————.

13. අයදුම්කරුවා පිළිබඳ තොරතුරු දැනගත හැකි අයගේ නම් හා ලිපිනයන් :—
(1) ————.
(2) ————.
(3) ————.

14. සහතික දෙනු ලැබූ අයගේ නම් :—
(1) ————.
(2) ————.
(3) ————.

15. මීට ප්‍රථම ලං.ග.ම. යේ යම්කිසි තනතුරක් ඉල්ලුම් කළේද ?
එසේනම්, එහි ප්‍රතිඵල :————.

16. තමා උසාවියකදී ක්‍රිමිනල් වරදකට වරදකරුවෙකු වී සිටියේද ?
එසේනම්, විස්තර දක්වන්න.

මා මෙහි සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මින් සහතික කරමි. යම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව තෝරා ගැනීමට කලින් සොයාගත හොත් එයින් මා නුසුදුස්සෙකු වියහැකි නියාව හා තෝරා ගැනීමෙන් පසුව සොයාගතහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකර දමනු හැකි නියාව මා දන්නා බවත් මෙයින් ප්‍රකාශ කරමි.

————.
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

6–499—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රියැදුරු පුරප්පාඩු

ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රියැදුරු තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර එවන ලෙස ලංකාවේ පුරවැසියන්ට මෙයින් ආරාධනය කරනු ලැබේ.

2. යටත් පිරිසෙයින් පහත සඳහන් වූ සුදුසුකම් වත් ඉල්ලුම් කරුවන්ට තිබිය යුතුයි :—

(අ) අධ්‍යාපනය.—7 වෙනි ප්‍රමාණය (සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි).

සැලකිය යුතුයි.—(i) පාඨශාලා සහතිකය අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් අනුමත කරන ලද ෆෝර්මයෙහි ලියන ලද්දක් විය යුතුයි.

(ii) වඩා උසස් ඉගෙනීමක් ඇති අයගෙන් සෑහෙන ප්‍රමාණයක් ඉල්ලුම්පත්‍ර නොලැබුණ හොත් යටත් පිරිසෙයින් පස්වෙනි ප්‍රමාණයෙන් හෝ සමර්ථ වූවත් එවන ඉල්ලුම් පත්‍ර සැලකිල්ලට භාජන කරනු ලැබේ.

(අ) වයස.—1965ගේ ජූලි මස 1 වෙනිදට 25ක් අවුරුද්දකට අඩු නොවිය යුතුයි. 45ක් අවුරුද්දකට වැඩි නොවිය යුතුයි.

(ඇ) උස.—අඩි 5 යි අඟල් 3 යි.

(ඈ) බර.—රාත්තල් 100 යි.

(ඉ) බලපත්‍රය.—මෝටර් වාහන (බස්) පැදවීමේ ප්‍රවීණතා සහතිකයක් (බලපත්‍රයක්) 1965.7.1 වෙනිදාට පෙර ලබා සිටිය යුතුයි.

(ඊ) පළපුරුද්ද.—බරවාහන (ලොරි හා/හෝ බස්) පැදවීම සම්බන්ධයෙන් 1965.7.1 වෙනිදා වන විට එක් අවුරුද්දක පළපුරුද්දක් තිබිය යුතුයි.

3. ඉල්ලුම්කරුවන් මොනම බරපතල මෝටර් රථ (ධාවන) වරදකට හෝ ක්‍රිමිනල් වරදකට අසු නොවූ අය විය යුතුයි.

4. සම්මුඛ පරීක්ෂණයකින් තෝරාගනු ලබන ඉල්ලුම්කරුවන්ට මණ්ඩලීය වෛද්‍ය නිලධාරී මහතා හෝ මණ්ඩලයෙන් නම් කරන වෙන යම්කිසි වෛද්‍ය නිලධාරී මහතකු වෙත ගොස් වෛද්‍ය පරීක්ෂණයක් කරවා ගැනීමට නියම කරනු ලැබේ. ඔවුන් පත් කිරීමට තෝරා ගන්නේ බස් රියැදුරුවරුන් වශයෙන් සේවය කිරීමට ශාරීරික සනීපය අතින් සුදුසු බවට සහතික කරනු ලැබුවොත් පමණකි.

5. පත් කිරීමට තෝරාගනු ලබන අයට දෙසතියක හෝ ඊට වැඩි කාලයක පුහුණුවක් දෙනු ලැබේ. ඒ කාලය තුළදී දවසට රු. 3 බැගින් වූ දීමනාවක් ගෙවනු ලැබේ. පුහුණුවීම සාර්ථක ලෙස නිම කළ පසු රු. 180—7.50—රු. 300 පඩි ක්‍රමයේ මසකට රු. 180ක වේතනයක් පිට එක් අවුරුද්දක ප්‍රවාසන කාලයක් උඩ ඔවුන්ට පත්වීම් දෙනු ලැබේ.

6. ඉල්ලුම් පත්‍ර මෙහි පහත දක්වා ඇති ආදර්ශ ෆෝර්මය අනුව ෆුල්ස්කැප් කඩදාසි පලුවක ඉල්ලුම්කරුවාගේම අත් අකුරෙන් ලියා, ලියුම් කවරයක දමා, "පීබීබී ශාඛාව" යන්න කවරයේ වම් පැත්තේ ඉහළ කෙළවරේ ලකුණු කොට ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවක මණ්ඩල කළමනාකාර මහතා වෙත එවිය යුතුයි. ඉල්ලුම් පත්‍ර ෆෝර්ම මේ මණ්ඩලයෙන් දෙනු නොලැබේ.

7. ඉල්ලුම් පත්‍රය සමග උප්පැන්න සහතිකය, අධ්‍යයනික සහතික, චරිත සහතික, පළපුරුදු සහතික යන මේවායේ පිටපත් එවිය යුතුයි. ඉල්ලුම් පත්‍ර සමග සහතික පත්‍රවල මුල් පිටපත් නොඑවිය යුතුයි. ඒවා ආපසු එවීම ගැන ඇප විය නොහැකි බැවිනි.

8. ඉල්ලුම් පත්‍ර බාරගැනීම 1965 හේ ජූලි මස 1 වෙනිදා නවත්වනු ලැබේ.

9. ඉල්ලුම් පත්‍ර බාරගැනීම නවත්වන දිනයෙන් පසුව ලැබෙන හෝ යථෝක්ත නියමයන්ට නොගැලපෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. මණ්ඩලීය සේවයෙන් අස්කරන ලද්දවුද සහ මණ්ඩලීය විනයානුකූල හේතුන් පිට මණ්ඩලීය සේවයෙන් පහකරන ලද්දවුද සේවකයන්ගේ ඉල්ලුම් පත්‍ර බාරගනු නොලැබේ.

11. සියලු ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වනු ලැබේ.

ලංකා ගමනාගමන මණ්ඩලයේ
සේවකමණ්ඩල කළමනාකාරතැන.

200, කිරුළ පාර,
කොළඹ 5, 1965.6.11.

### ඉල්ලුම් පත්‍ර ෆෝර්මය (ආදර්ශය)

1. සම්පූර්ණ නම :————.
2. පදිංචි ස්ථානයේ ලිපිනය :————.
3. (i) උපන් දිනය :————.
(ii) 1965.7.1 වෙනිදට වයස : අවුරුදු :——, මාස :——.
4. අධ්‍යාපන සුදුසුකම් :————.
(සමර්ථවූ ඉහළම ප්‍රමාණයත් භාෂා මාධ්‍යයත්—එනම් සිංහලද, දෙමළද, ඉංග්‍රීසිද යන බවත් සඳහන් කරන්න.)
5. (i) ප්‍රවීණතා සහතිකයේ (බලපත්‍රයේ) අංකය හා දිනය : ————.
(ii) මෝටර් වාහන (ලොරි) පැදවීමට බලපත්‍රය දීර්ඝ කළ දිනය : ————.
(iii) මෝටර් වාහන (ලොරි) පැදවීමට බලපත්‍රය දීර්ඝ කළ දිනය : ————.
6. උස : අඩි :——, අඟල් :——.
7. බර : රාත්තල් :————.
8. පළපුරුද්ද පිළිබඳ විස්තර :————.
9. විශේෂ සුදුසුකම් ඇතොත් ඒවා :————.
10. දැන් රක්ෂාව කරතොත් එය :————.
11 ඉල්ලුම්කරුවා පදිංචි වී සිටින ආදායම් දිස්ත්‍රික්කය සහ ඡන්ද කොට්ඨාශය :————.

මා විසින් දන්වා ඇති යථෝක්ත විස්තර සත්‍ය බවත් මොනම ක්‍රිමිනල් වරදක්වත් ගැන උසාවියකදී මා වරදකරුවකු වූ/නුවූ බවත්, නැතහොත් මගේ ඇඟ බැඳලා ඇති/නැති බවත් මෙයින් ප්‍රකාශ කරමි.

මා වරදකාරයා වූ/මගේ ඇඟ බඳින ලද්දාවූ වරදවල් පිළිබඳ විස්තරත්, ඒ නඩුවල අංකත් මෙසේය :————.

මා විසින් මෙහි දක්වා ඇති විස්තර අසත්‍ය බැව් ඔප්පු වුවහොත් තනතුරට පත්වූ කොයි අවස්ථාවකදී වුවත් මා සේවාවෙන් පහකර දමනු ලැබීමට පුළුවන්වන බැව් මම දනිමි.

————.
ඉල්ලුම්කරුවාගේ අත්සන.

දිනය :————.

6–481—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

## කම්කරු දෙපාර්තමේන්තුව

### කම්කරු නිලධාරි තනතුරු

III වන පන්තියේ කම්කරු නිලධාරි තනතුරු සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙම තනතුරු ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිතවේ.

2. මෙම ගැසට් I වන කොටසේ II වන ඡේදයෙහි පළවී ඇති රාජ්‍ය සේවා තනතුරු වලට අදාල පොදු කොන්දේසි කියවා බලන්න.

3. පහත සඳහන් ආකෘති පත්‍රය අනුව පිළියෙල කළ ඉල්ලුම් පත්‍ර 1965.6.26 වන දිනට හෝ ඊට පෙර කම්කරු කොමසාරිස්වරයා වෙත ලැබෙන සේ එවිය යුතුයි.

4. සෑම ඉල්ලුම් කරුවෙක්ම තමා 1965.6.26 වන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු බවටද අවුරුදු 30 ට වැඩි නොවන බවටද සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි. රජයේ සේවකයින් වෙනුවෙන් උපරිම වයස් සීමාව අවුරුදු 40කි.

5. අපේක්ෂකයෝ පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරීන් හෝ තමන්ගේ වෘත්තියෙහි නිරතවීමට හිමිකම් ලබා දෙන වෘත්තීය සුදුසුකම් ලැබූවන් විය යුත්තාහ. රජයේ සේවයෙහි අවුරුදු 10ක සේවා කාලය සම්පූර්ණ කර ඇත්තාවූත්, අඩු ගනනේ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත්වූත්, රජයේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගෙන්ද, ඉල්ලුම් පත්‍ර සලකා බලනු ලැබේ. එහෙත් එසේ කරනු ලබන්නේ, ඔවුන්, ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් පුද්ගලිකවම අසමාන්‍ය කුශලතා ඇත්තවුන් බවට සහතික කරනු ලබන්නේ නම් පමණි. සැ. යු.—යටත් පිරිසෙයින් කලා හෝ, විද්‍යා හෝ වාණිජ පිළිබඳ මධ්‍ය විභාගයෙන්වත් සාමාර්ථය ලබා තිබේ නම් යුද්ධ සේවා අනුග්‍රහය යටතේ සුදුසුකම් ලැබූ සේවා මුක්ත භටයන්ට සහ අනික් අයටද මෙම තනතුරු සඳහා ඉල්ලුම් කළ හැක.

6. රජයේ සේවයෙහි ස්ථිර සහ විශ්‍රාම වැටුප් හිමි නිලධාරියෙකු තෝරා ගනු ලැබුවහොත්, ඔහු අදාල දෙපාර්තමේන්තුව ඔහු නිසා ඇතිවන ඇබෑර්තුව වැඩ බැලීමේ ක්‍රමයක් අනුව මිස අන් ක්‍රමයකින් අවුරුදු තුනකට නොඅඩු කාලයක් සඳහා පුරවා නොතැබීමට සූදානම් වේ නම්, වැඩ බැලීමේ තත්ත්වයකට පත් කල හැක. පත් කිරීම සඳහා තමා තෝරාගනු ලබන්නේ නම් දෙපාර්තමේන්තු ප්‍රධානියා තමා මුදා හැරීමට හෝ තමාගේ තනතුර වැඩ බැලීමේ කාලය තුළ හිස්ව තැබීමට හෝ සූදානම් නැත්නම් තමා දරන පදවියෙන් ඉල්ලා අස්වීමට සූදානම් වන බවට නිලධාරියා තම ඉල්ලුම් පතේ ප්‍රකාශයක් කර තිබේ නම්, ඉල්ලුම් පත්‍රය ගැන සලකා බලනු ඇත.

7. පත්වීම් අවුරුදු තුනක කාලසීමාවක් සඳහා ආධුනික තත්ත්වයට යටත්වනු ඇත.

8. මෙම තනතුරුවලට අදාල වැටුප් ක්‍රමය මෙසේය :—

(i) III වන පන්තිය රු. 2,940—120 වැඩිවීම් 8 කින්—රු. 3,900 (රු. 3,420 ට පෙර කාර්යක්ෂමතා කඩඉම).

II වන පන්තිය රු. 4,080—180 වැඩිවීම් 7 කින් රු. 5,340— (රු. 4,800 ට පෙර කාර්යක්ෂමතා කඩඉම).

I වන පන්තිය රු. 5,580—240 වැඩිවීම් 5 කින් රු. 6,780යි.

(ii) I වන, II වන සහ III වන පන්ති අඛන්ඩ කාල ක්‍රමයකට යටතේ වේ.

9. දිවයිනේ ඕනෑම පළාතක සේවය කරන මෙන්ද අවශ්‍ය වන පරිදි ගමන් බිමන් සිදුකරන මෙන්ද, ඉල්ලුම් කරුවන්ට නියම කරනු ලබන අතර, ඔවුහු සේවා තත්ත්වයෙහි තිබෙන පිළිගත් වාහනයක් තබාගත යුත්තාහ. මුදල් රෙගුලාසිවලට අනුව, ගමන් වියදම් ගෙවනු ලැබේ.

10. ඉල්ලුම් පත් හෝ ඒ පිළිබඳ වෙනත් ලියකියවිලි කම්කරු කොමසාරිස් වරයාට ඔහුගේ පදවි නාමයෙන් ආමන්ත්‍රණය කර යැවිය යුතු වන අතර දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ නමකට ඒවා යැවිය යුතු නොවේ.

11. ඉල්ලුම් පත්‍ර ලැබුනු විට ඒ බව දන්වනු ලැබේ.

කම්කරු කොමසාරිස්.

1965 ජූනි මස 7 වැනි දින,
කොළඹ, කම්කරු දෙපාර්තමේන්තුවේ දීය.

## ඉහත සඳහන් ආකෘතිය

### කම්කරු නිලධාරි තනතුරු සඳහා ඉල්ලුම් පත්‍රය

මෙම ඉල්ලුම් පත්‍රය ඉල්ලුම්කරු විසින් පුරවා 1965.6.26 දින හෝ ඊට පෙර කොළඹ 3, ගාලු මුවදොර, පහල වැව පාරේ, කම්කරු කොමසාරිස් තුමාට ලැබෙන සේ යැවිය යුතුය :—

1. පෙළපත් නාමය :————.

වෙනත් නම් :————.

ලිපිනය :————.

2. (අ) උපන් දිනය :————.

(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)

(ආ) 1965.6.26 වන විට වයස : අවුරුදු :—— මාස :——.

(ඇ) ජාතිය :————.

3. උපන් ස්ථානය :—

(අ) ඉල්ලුම්කරුගේ :————.

(ආ) ඉල්ලුම්කරුගේ පියාගේ :————.

(ඇ) ඉල්ලුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තාගේ :————.

(ඈ) ඉල්ලුම්කරුගේ පිය පාර්ශ්වයේ මීමුත්තාගේ :————.

ඉල්ලුම්කරු ලංකාවේ උපත ලබා සිටිනම්, (අ) වගන්තිය ඇතුළු (ආ) වගන්තිය හෝ (ඇ) සහ (ඈ) යන වගන්ති දෙකම පිරවිය යුතුය. ඉල්ලුම්කරු ලංකාවේ උපත ලබා නැතිනම් (අ) වගන්තිය ඇතුළු (ආ) වගන්තිය සහ (ඇ) වගන්තිය හෝ (ඇ) සහ (ඈ) යන වගන්ති දෙකම පිරවිය යුතුය.

4. විවාහක හෝ අවිවාහක යන වග :————.

5. ඉල්ලුම්කරුගේ—

(අ) උස :————.

(ආ) පපුවේ වට මැනුම :————.

6. අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් :————.

(සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි)

7. (අ) උපස්ථම්භක ගිනි, ගගන ප්‍රහාර නිවාරක හෝ මහජනා රක්ෂක හමුදාවල අඛන්ඩ සේවා කාලය :————. වන දින සිට ———— දක්වා.

(ආ) සටන් භට හමුදාවේ සේවා කාලය :———— වන දින සිට ———— දක්වා.

(සැ. යු.—සේවයෙන් අස්වීමට හේතුව දක්වමින්, (අ) සහ (ආ) සඳහන් කරුණු ඔප්පු කිරීම සඳහා සහතික පත්වල පිටපත් ඇමිණිය යුතුයි.)

8. රජයේ සේවයෙහි යෙදී සිටින්නේ නම් ඉල්ලුම්කරු 1965.6.26 වන දිනට අවුරුදු 10ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබේද ? :————.

(දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය අමුනන්න).

9. ඉල්ලුම්කරුට පහත දැක්වෙන භාෂාවන් ව්‍යක්ත ලෙස කථා කළ හැකිද ? :————.

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

10. ඉල්ලුම්කරුට පහත දැක්වෙන භාෂාවන් කියවීමට හා ලිවීමට පිළිවන්ද ? :—.

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

11. පාසැලින් හෝ විද්‍යාලයෙන් අස් වූ පසු කළ රැකියාවන් : ————.

12. කම්කරුවන් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී ඉල්ලුම්කරු කවර පළපුරුදුකම් ලබා තිබෙන්නේද ? :————.

13. ඉල්ලුම්කරුට කම්කරු නීතින් සම්බන්ධ කිසියම් දැනීමක් තිබේද ? :—

(අ) ප්‍රාදේශික :————.

(ආ) සාමාන්‍ය :————.

14. ඉල්ලුම්කරුට ලංකාවේ වතුවල හෝ කාර්මික ආයතනවල හෝ නියුක්ත කම්කරුවන් හෝ තත්ත්වයන් ගැන දැනීමක් තිබෙන්නෙහිද ? එසේ නම් ඉල්ලුම්කරු එම දැනීම ලබා ගත්තේ කෙසේදැයි සඳහන් කරන්න :————.

15. ඉල්ලුම්කරුට සංචාරය පිළිබඳ පළපුරුද්දක් තිබේද ? : ————.

(අ) දිවයින තුළ :————.

(ආ) එතෙර :————.

16. ඉල්ලුම්කරුගේ ඉල්ලුම් පත්‍රයට පිටුවහලක් වශයෙන් දැක්වීමට අදහස් කරන වෙනත් හිමිකම් ඇතොත් ඒවා : ————.

17. ඉල්ලුම්කරුගේ හැකියාව හා චරිතය පිළිබඳ විමසනු ලැබිය හැකි විශිෂ්ඨ පුද්ගලයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :—

1. ————.
2. ————.

18. සහතික පත් ලබා ගත්තේ කවුරුන්ගෙන්ද? (ලඟදී ලබා ගත් සහතික පත් තුනකට නොවැඩි ගණනක පිටපත් අමුණන්න. ඒවායේ මුල් පිටපත් එවිය යුතු නොවේ)

1. ————.
2. ————.
3. ————.

මෙම ඉල්ලුම් පත්‍රයේ මවිසින් සඳහන් කර ඇති කරුණු සත්‍ය හා නිවැරදි බව මම මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම්කිසි කරුණක් අසත්‍ය හෝ වැරදි සහගතයැයි මා තෝරා ගැනීමට කලින් දැනගතහොත් මෙම තනතුර සඳහා නුසුදුස්සකු කරනු ලැබීමටත්, එසේම පත්වූවාට පසු දැනගතහොත් කිසිම වන්දියක් නොමැතිව සේවයෙන් පහකරනු ලැබීමටත් හැකි බවද මම හොඳින් දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

6–519—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

---

## අවිස්සාවේල්ල මහෙස්ත්‍රාත් උසාවියේ කාර්යාල කාර්ය සහායක තනතුර

අධිකරණ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවල සේවය කරන, ඉහත සඳහන් ඇබෑර්තු වී ඇති තනතුරට උසස්වීමට හිමිකම් ඇති කණිෂ්ඨ සේවකයින්ගෙන් ඉහත සඳහන් තනතුර සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

ඉල්ලුම් පත්, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් 1965 ජූනි 30 වෙනි දිනට ප්‍රථම මා වෙත ලැබෙන සේ එවිය යුතුයි.

එස්. බී. ගුණවර්ධන,
අවිස්සාවේල්ල මහෙස්ත්‍රාත්.

මහෙස්ත්‍රාත් උසාවිය,
අවිස්සාවේල්ල, 1965.6.5.

6–442—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## රාජකීය විද්‍යාලය

### අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) ප්‍රථම වර්ෂයේ පන්තිවලට ශිෂ්‍යයන් බඳවා ගැනීම

ඉහත සඳහන් පන්තිවල කලා අංශයේ (ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ මාධ්‍යයන්හි) හා ඉන්ජිනේරු අංශයේ (ඉංග්‍රීසි මාධ්‍යයේ) ඉගෙනීමට සම්පූර්ණ සුදුසුකම් ඇති ශිෂ්‍යයන් කිහිපදෙනකු ඇතුලත් කර ගැනීමට ඉඩකඩ තිබේ. වෛද්‍ය අංශයේ පන්තිවල ඉඩකඩ නැත.

අප කාර්යාලයෙන් ඉල්ලුම් පත්‍ර ලබාගෙන 1965 ජූනි මස 22 වැනි අගහරුවාදා දහවල් 12ට පෙර මෙම කාර්යාලයට එවිය යුතුය.

බී. ඒ. ප්‍රේමරත්න,
වැ. විදුහල්පති.

රාජකීය විද්‍යාලය,
කොළඹ 7,
7. 6. 65.

6–507—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

---

අංකය : 1/23/4/8(ජී)

## නිවැරදි කිරීමයි

### සාමාන්‍ය ලිපිකරු සේවයේ විධායක ලිපිකරු පන්තියේ දෙවන ශ්‍රෙණියේ නිලධාරීන් සඳහා නියමිත ජාතිකභාෂාවන් හා ගිණුම් පිළිබඳ පරීක්ෂණය

1965 මැයි 13 වැනි දින අංක 14,399 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ I කොටසේ (II) ඡෙදයේ 539 වැනි පිටුවේ පළවී ඇති දැන්වීමේ අමරතුංග, ඇම්. යන නමට යටින් පහත දැක්වෙන නමද ඇතුළත්කර කියවිය යුතුයි :—

| නම | | දෙපාර්තමේන්තුව | | විෂයයන් |
|---|---|---|---|---|
| අසන්, ඇස්. ජී. | ... | වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් | ... | පහල සිංහල (බී) |

6–226—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

---

## විභාග දෙපාර්තමේන්තුව

### ගුරු විද්‍යාලයීය ප්‍රවේශ පරීක්ෂණය (විශේෂ පන්ති) 1965

ඉංග්‍රීසි පාඨමාලාව සඳහා ඇතුළුවීමේ සුදුසුකම් 1965 වර්ෂයට පමණක් ප්‍රතිශෝධනය කිරීමට තීරණය කොට තිබේ. පහත දැක්වෙන සුදුසුකම් ඇති අයදුම්කරුවන්ට 1965 විභාගයේ දී ඉංග්‍රීසි පාඨමාලාව හැදෑරීමට ඇතුළුවීමට තරග කළ හැකි ය.

(i) ඉංග්‍රීසි ගුරු සහතිකය හෝ ඉංග්‍රීසි උපගුරු සහතිකය හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය (ඉංග්‍රීසි) එසේ නැත් නම්

(ii) පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතිකය. තවද පහත සඳහන් විෂයයන් එම සහතිකයෙහි හෝ අමතරව සමර්ථ වූ අධ්‍යාපන පොදු සහතිකයක (සාමාන්‍ය) හෝ ඇතුළත්ව තිබිය යුතු ය. ඉංග්‍රීසි භාෂාව "ඒ" නිර්දේශය හෝ ඉංග්‍රීසි භාෂාව "බී" නිර්දේශයෙන් සම්මාන සාමාර්ථ්‍යය හෝ ඉංග්‍රීසි සාහිත්‍යය එසේ නැත් නම්

(iii) පහත දැක්වෙන විෂයයන් ඇතුළත්ව විෂයයන් හයකින් වාර එකකදී හෝ දෙකකදී ලබන ලද අධ්‍යයන පොදු සහතික පත්‍රය (සාමාන්‍ය)

(1) සිංහල/දෙමළ භාෂාව.

(2) ඉංග්‍රීසි භාෂාව "ඒ" නිර්දේශය හෝ ඉංග්‍රීසි භාෂාව "බී" නිර්දේශයෙන් සම්මාන හෝ ඉංග්‍රීසි සාහිත්‍යය.

1965 අප්‍රේල් 30 වැනි දින පළවූ ගැසට් නිවේදනයේ 7 (ඒ) (i), (ii), (iii) යන ඡේද ඉහත (i), (ii), (iii) පරිදි ප්‍රතිශෝධනය කරන ලදී.

2. අන්‍ය පාඨමාලා සඳහා දැනට ඉල්ලුම් පත්‍ර එවා ඇති එහෙත් ඉංග්‍රීසි පාඨමාලාව හැදෑරීමට දැන් ඇතුළුවීමට කැමති අයදුම්කරුවන් ලියාපදිංචි ලිපියකින් ඒ බව දැක්විය යුතු සි. නම හා ඉල්ලුම් කරන ලද මධ්‍යස්ථානය සඳහන් කරමින් ඉංග්‍රීසි ද ඉල්ලුම් පත්‍රයට ඇතුලත් කරන ලෙස ඒ ලිපිවලින් ඉල්ලුම් කළ යුතුය.

3. මෙතෙක් ඉල්ලුම් පත්‍ර එවා නැති එහෙත් දැන් ඉංග්‍රීසි පාඨමාලාවට සුදුස්සන්වන අයදුම්කරුවන් මේ මස 22 වැනි දින හෝ එයට පෙර මෙම කාර්යාලයට ලැබෙනසේ ඉල්ලුම් පත් එවිය යුතු සි. ආදර්ශ ඉල්ලුම් පත්‍රය 1965 අප්‍රේල් 30 වැනි දින දරන ගැසට් නිවේදනයේ ඇත.

4. අන්‍ය පාඨමාලාවනට අළුත් අයදුම්පත් භාරගනු නොලැබේ.

5. විභාගය 1965 සැප්තැම්බර් 2 වැනි දින පටන් ගැනෙන සේ කල් දමා ඇත.

එච්. එල්. විමලසූරිය,
වැ. බ. විභාග කොමසාරිස්.

1965 ජූනි මස 5 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

6–439—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

## විභාග දෙපාර්තමේන්තුව

### අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගය, දෙසැ. 1965

මින් පෙර වතාවකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයකට ඉදිරිපත් වී ඇති අයදුම්කරුවන් 1965 දෙසැම්බර්හි නැවත විභාගයකට පෙනී සිටීමේ දී දෙසැම්බර් 1965 සිට ක්‍රියාත්මක වන අලුත් නිර්දේශ පත්‍ර ඇති විෂයයන් පිළිබඳ පරණ නිර්දේශ පත්‍ර අනුව (එනම් අගෝස්තු 1965 දක්වා ක්‍රියාත්මක වූ නිර්දේශ පත්‍ර අනුව) උත්තර ලිවීමට විධිවිධාන යොදනු ලැබේ.

මෙම විෂයයන් පිළිබඳ ප්‍රශ්න පත්‍රවල එවැනි අයදුම්කරුවන් සඳහා විශේෂ ප්‍රශ්න යොදනු ලැබේ. එහෙත් විශේෂ ප්‍රශ්න පත්‍ර ඔවුන් සඳහා දෙනු නොලැබේ.

(i) භෞතික, රසායන හා ජීව විද්‍යා පිළිබඳ එවැනි අයදුම්කරුවන්ට 11 වැනි පත්‍රයේ දී පරණ නිර්දේශය අනුව ප්‍රශ්න තෝරා ගත හැකි වන්නේ ය. එය ඔවුන් සඳහා පැ 3 ක පත්‍රයක් වන්නේ ය. ඔවුන් 1 වැනි පත්‍රයට (විනාඩි 45) පෙනී සිටීම අවශ්‍ය නැත.

සැලකිය යුතුයි.—පළමු වතාවේදී විභාගයට පෙනී සිටින පාසැල් අයදුම්කරුවන්ට පත්‍ර දෙකකි. එනම් පළමුවැනි පත්‍රය (විනාඩි 45 යි).

දෙවැනි පත්‍රය (පැය 2 යි.)

(ii) උද්භිද විද්‍යාව, සත්ව විද්‍යාව වෙන වෙනම හදාරා ඇති ශිෂ්‍යයන්ට ඒ විෂයයන් සඳහා විශේෂ ප්‍රශ්න පත්‍ර පිළියෙළ කරනු ලැබේ.

(iii) සෞඛ්‍ය විද්‍යාව, කෘෂිකර්ම විද්‍යාව යන විෂයයන් සඳහා පරණ නිර්දේශය අනුව පෙනී සිටින ශිෂ්‍යයන්ට පළමුවැනි පත්‍රයට උත්තර දීම අනවශ්‍ය ය.

(iv) චිත්‍ර කර්මය විෂයයෙන් පරණ නිර්දේශය අනුව ඉදිරිපත් වන්නන් විභාගයට පැමිණිය යුත්තේ පළමු පත්‍රයට උත්තර දීම පිණිසය. ඔවුන් සඳහා විශේෂ ප්‍රශ්න මෙම පත්‍රයේ ඇතුළත් වේ.

(v) නිර්දේශ පත්‍රය වෙනස් කොට ඇති අන්‍ය විෂයයන් සඳහා පරණ නිර්දේශය අනුව අවශ්‍ය ප්‍රශ්න ගණන තෝරා ගැනීමට හැකිවන පරිදි ප්‍රශ්න පත්‍ර සකස් කරනු ලැබේ.

2. පළමුවරට විභාගයට පෙනී සිටින පාසැල් අයදුම්කරුවන් අනිවාර්යයෙන් ම අලුත් නිර්දේශ අනුව උත්තර ලිවිය යුතුය. පෞද්ගලික අයදුම්කරුවන්ට අලුත් හෝ පරණ හෝ නිර්දේශ අනුව උත්තර ලිවීමට තෝරා ගත හැකිය.

3. නියමිත පොත් පමණක් වෙනස් වන විෂයයන් සඳහා පරණ පොත් එනම් අගෝස්තු 1965 දක්වා ක්‍රියාත්මක වූ පොත් අනුව ප්‍රශ්න තනනු නොලැබේ.

එච්. එල්. විමලසූරිය,
වැ. බ. විභාග කොමසාරිස්.

1965. 6. 8 දින,
කොළඹ 2,
මැලේ වීදියේ
විභාග දෙපාතර්මේන්තුවේදීය.

6–517—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### 1965/66—හෙදි ඇබෑසි විදුහල්වලට ඇතුළත් කරගැනීම සඳහා අපේක්ෂිකාවන් තෝරීමේ විභාගය

අංක 14,047 හා 65.5.28 දින දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කාණ්ඩයේ (II) වැනි ඡේදයේ අංක 566 දරණ පිටුවේ සඳහන් නිවේදනයට ඔබේ අවධානය යොමු කරමි. දෙපාර්තමේන්තුවේ සේවිකාවන්ට ඉහල වයස් සීමාව අවුරුදු 35ක් වන අතර, ඔවුන්ගේ විවාහක හෝ අවිවාහක තත්ත්වය නොසලකා අනෙකුත් සුදුසුකම් තිබේ නම් මෙම විභාගයට පෙනී සිටීමට අයදුම් පත් එවිය හැක.

1963.6.1 වන දින සිසු හෙදි විභාගයට පෙනී සිටි අයදුම් කරුවන්ට ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ 14 වැනි ඡේදයේ සංලක්ෂ්‍යය යටතේ ඉල්ලා ඇති පරිදි විභාග අංකය සඳහන් කිරීමට නොහැකි නම් එම අංකය නොමැතිව ඉල්ලා ඇති අනිකුත් විස්තර ඇතුලත් ඉල්ලුම් පතක් 1965.6.18 වනදා නොඉක්මවා එවිය යුතු ය.

ජ්‍යෙෂ්ඨත්වය අනුව තෝරා ගනු ලබන අවුරුදු 45 දක්වා හා අනිකුත් අනුග්‍රහයන් දී ඇති දෙපාර්තමේන්තුවේ සේවක සේවිකාවන්ට අංක 478 හා 65.4.26 දාතම පොදු චක්‍ර ලේඛයට අවධානය යොමු කරමි.

එම්. ජේ. ද. එස්. ජයසේකර,
සෞ. සේ. අධ්‍යක්ෂ වෙනුවට.

1965 ජූනි මස 7 වන ද, කොළඹ,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ දී ය.

6–518—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

---

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## රජයේ ගබඩා දෙපාර්තමේන්තුව

### මෝටර් රථවාහන මිලදී ගැනීම

කොළඹ, මහා භාණ්ඩාගාරයේ 218 වෙනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැපැල් ලිපිනය—තැ. පෙ. 500, (කොළඹ) විසින් පහත සඳහන් මෝටර් වාහන මිලදී ගැනීම සඳහා 1965 ජූලි මස 6 වෙනි දින පෙ. ව. 9.30 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ :—

කාණ්ඩය :—1.

හම්බර් සුපර් ස්නයිප් නො. 3 ශ්‍රී 5000
ක්‍රයිස්ලර් වැලියන්ට් නො. 4 ශ්‍රී 6000
හම්බර් හෝක් කාර් නො. 4 ශ්‍රී 4000
වොක්ෂෝල් ක්‍රෙස්ටා නො. 4 ශ්‍රී 7000
චවලර්ට් "ඉම්පාලා" නො. 4 ශ්‍රී 6000
නෑෂ් රැම්බ්ලර් නො 4 ශ්‍රී 7000

කාණ්ඩය :—2.

ෆෝර්ඩ් ඇන්ගිලීයා නො. 4 ශ්‍රී 8000
ඔස්ටින් ඒ. 60 නො. 4 ශ්‍රී 7000
මොරිස් මිනි මයිනර් නො. 4 ශ්‍රී 8000
ස්කොඩා කාර් නො. 2 ශ්‍රී 8000
හිල්මන් සුපර් මින්ක්ස නො. 4 ශ්‍රී 7000
මොරිස් ඔක්ස්ෆෝඩ් සැලූන් නො. 3 ශ්‍රී 3000
ෆෝර්ඩ් පැල්කන් සැලූන් කාර් නො. 3 ශ්‍රී 8000
මොරිස් මිනි මයිනර් නො. 4 ශ්‍රී 8000
ඔස්ටින් ඒ. 7—4 ශ්‍රී 8000
වයම්ෆ් එස්ටේට් කාර් 4 ශ්‍රී 8000

කාණ්ඩය :—3.

විලි ජීප් නො. 2 ශ්‍රී 5000
විලිස් ස්ටේෂන් වැගන් නො. 3 ශ්‍රී 7000
හෝල්ඩන් ස්පෙෂල් ස්ටේෂන් සේඩන් 3 ශ්‍රී 2000

සතියේ දිනවල පෙ. ව. 10.00 සිට 12.00 දක්වාද ප. ව. 2.00 සිට 4.00 දක්වාද, සෙනසුරාදා දිනවල පෙ. ව. 10.00 සිට 12.00 දක්වා ද මෙම වාහන කොළඹ 2, ශ්‍රීමත් සිත්තප්පලම් මාවතේ රජයේ ගබඩා දෙපාර්තමේන්තුවේදී පරීක්ෂා කර බැලිය හැක.

1965 ජූලි මස 6 වෙනි දින පෙ. ව. 9.30 ට මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්යාලයේදී විවෘත කරනු ලැබේ.

ඉහත සඳහන් වේලාව තුළදී ටෙන්ඩර් විවෘත කරණ ස්ථානයේ පෙනී සිටීමට ටෙන්ඩර් කරුවන්ට ඉඩදෙනු ඇත.

කොළඹ 2, ශ්‍රීමත් සිත්තප්පලම් මාවතේ ගබඩා දෙපාර්තමේන්තුවේ ගබඩා අධිකාරී තැනගෙන් ලබාගත් ෆෝර්මවල අනු පිට පතකින් යුක්තව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු ය.

ඉහත් දක්වා ඇති එකිනෙක කාණ්ඩවල එකක් හෝ සැම කාරයක් වෙනුවෙන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීම සඳහා ගබඩා දෙපාර්තමේන්තුවේ දී හෝ පිටපළාත්වල නම් ප්‍රාදේශීය කච්චේරිවලදී රු. 500ක තැන්පත් මුදලක් බැඳ ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ විටක, 1965 ජූලි මස 5 වෙනි දින දවල් 12.00 දක්වා ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ.

වැඩි විස්තර රජයේ ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැකිය.

කැ. රූපසිංහ,
ගබඩා අධිකාරී.

1965 ජූනි 7 වෙනිදා.

6–509—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

## රාජකීය ලංකා ගුවන් හමුදාව

කොළඹ, සෙනේට් ගොඩනැගිල්ලේ රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් රාජකීය ලංකා ගුවන් හමුදාවේ කටුනායක සහ චීන වරාය සේනා ස්ථානවලට 1965/66 මුදල් වර්ෂය තුළදී අළුත් මාළු සැපයීම සඳහා වූ 1965 ජූලි මස 1 වෙනි දින පෙරවරු 9.30 දක්වා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර ලබා ගැනීම පිණිස කොළඹ, ශ්‍රීමත් චිත්තම්පලම් මාවතේ, ගුවන් හමුදා මූලස්ථානයේ, සිවිල් පාලක නිලධාරී සහ ගණකාධිකාරී තුමා වෙත රුපියල් හැත්තෑපහක (රු. 75) මුදලක් තැන්පත් කර රිසිට් පතක් ලබාගත යුතුයි. එකක් හෝ සේනා ස්ථාන දෙකම සඳහා හෝ ටෙන්ඩර් පත් ඉදිරිපත් කළහැක. වර්ෂ 1965 ජූනි මස 30 වෙනි දින පස්වරු 12 වන තෙක් ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ.

3. සියළුම ටෙන්ඩර් පත් අනුපිටපතක් සමග මුද්‍රා තබන ලද කවරයක බහා එහි වම් පැත්තේ උඩ කෙළවරේ "රාජකීය ලංකා ගුවන් හමුදාවට අළුත් මාළු සැපයීම සඳහා 1965 ජූලි මස 1 වෙනි දින වසනු ලබන ටෙන්ඩරය" යයි සඳහන් කර කොළඹ, සෙනේට් ගොඩනැගිල්ලේ, රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා වෙත එවිය යුතුයි.

4. පළමුවෙනි ඡේදයේ සඳහන් කර ඇති වේලාවේදී ටෙන්ඩර් පත් විවෘත කරනවිට ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ බලය ලත් නියෝජිතයන්ට පෙනී සිටීමට ඉඩදෙනවා ඇත.

5. වැඩි විස්තර කොළඹ 2, පාසන්ස් පාරේ පිහිටි ගුවන් හමුදා මූලස්ථානයෙන් දැනගැනීමට හැක.

ඊ. ආර්. අමරසේකර,
ගුවන් කොමදෝරු,
ගුවන් හමුදාපති.

6–483—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

### ලුණු මිදෙල්ල හා මිල්ල ලෑලි සැපයීම

කොළඹ වරාය කොමිෂන් සභාවේ ප්‍රධාන ඉංජිනේරුතැනගේ දැව අංගනය වෙත (වඩුමඩුවේ පෝර්මන් අංශයට) පහත දක්වෙන මිම් ප්‍රමාණයන්ගෙන් යුත් ඇද පලුදු ආදියෙන් තොර මිල්ල ලෑලි ඝන අඩි 1,500 ක් හා ලුණුමිදෙල්ල ලෑලි ඝන අඩි 1,000 සපයා භාරදීමට මිළ ගණන් ඉදිරිපත් කරන ලෙස මෙයින් ආරාධනා කරමි.

මිල්ල—දිග අඩි 12 සිට ඉහලට, පළල අගල් 10" සිට ඉහළට හා ඝනකම අගල් 3"—4" දක්වා.

ලුණුමිදෙල්ල—දිග අඩි 12 සිට ඉහළට, පළල අගල් 10" සිට ඉහළට හා ඝනකම අගල් 1/2"—1" දක්වා.

මිළ ගණන් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තුවන අය මෙම දෙපාර්තමේන්තුවෙන් නියෝග ලැබී සති දෙකක් ගතවීමට පෙර එම දැව තොගය සපයා භාරදීමට සූදානම්ව සිටිය යුතුයි.

මේ සඳහා ඉදිරිපත් කරන මිළ ගණන් කරුණාකර 1965 ජූනි මස 18 වෙනි සිකුරාදට පෙර ප්‍රධාන ඉංජිනේරුතැන වෙත ලැබීමට සලස්වන්න.

ශ්‍රී. ම. බ. දෙලපිහිල්ල,
වරාය කොමසාරිස් තැන වෙනුවට.

වරාය කොමිෂන් සභා කාර්යාලයේදීය.

6–496—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

---

## යුද හමුදා මූලස්ථානය

1965 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1966 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ පහත සඳහන් සේවාවන් කරදීම සඳහා, 1965 ජූලි 5 වැනි දින පෙරවරු 9.30 දක්වා කොළඹ 1, සෙනේට් ගොඩනැගිල්ලේ රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර්පත්‍ර භාරගනු ලැබේ :—

(අ) කොළඹ, පනාගොඩ, ත්‍රිකුණාමලේ, යාපනේ, අම්පාරේ, මන්නාරම, රිදියාගම, සිවතුරෙයි, අයියකච්චි, වෙම්පන් තුන්ඩු, කන්තලේ සහ මුලතිව්හි පිහිටා ඇති යුද හමුදා කඳවුරුවලට එළවළු සහ පළතුරු සැපයීම.

(ආ) දියතලාවේ පිහිටා ඇති යුද හමුදා හා රාජකීය ලංකා ගුවන් හමුදා කඳවුරුවලට ඉහත සඳහන් සේවය සැපයීම.

පූර්වෝක්ත සේවාවන් සඳහා එකිනෙකට රු. 75 බැගින් ටෙන්ඩර් මුදලක් තැන්පත් කිරීමෙන් පසුව, මේ සම්බන්ධව සම්පූර්ණ විස්තර දැනගත හැකි, කොළඹ පහළ වැව පාරේ තැ. පෙ. 553 යුද හමුදා මූලස්ථානයෙන් 1965 ජූලි මස 2 වැනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍රිකා ලබාගත හැකිය.

ආර්. ඩී. ජයතිලක,
කර්නල්,
යුද හමුදා ආඥපති.

1965 ජූනි මස 4 වැනි දින,
යුද හමුදා මූලස්ථානයේ දීය,
කොළඹ.

6–400—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—රාජාංගනය වම් ඉවුරු ව්‍යාපාරය

තඹුත්තේගම, රාජාංගනය වම් ඉවුරු ව්‍යාපාරයේ 1 වැනි යායේ 1 වැනි සැතපුම යටතේ වූ අංක 1 දරණ බෙදුම් ඇල නිර්මාණය කිරීම සඳහා ටෙන්ඩර්, 1965 ජූනි මස 29 වැනි අඟහරුවාද පෙරවරු 10 වන තෙක්, කුරුණෑගල, මහනුවර පාරේ, වයඹ කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් භාර ගනු ලැබේ. ටෙන්ඩර් භාර ගැනීම නතර කල වහාම ඒවා එතැනදීම විවෘත කරනවා ඇත.

2. මෙම දෙපාර්තමේන්තුවේ රුපියල් 27,000 කට (රුපියල් විසිහත් දහසකට) හෝ ඊට වැඩි ගණනකට හෝ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන් පමණක් මෙම ටෙන්ඩර් ඉල්ලුම් කිරීමට සුදුස්සන් වනු ඇත.

3. මේ සඳහා ටෙන්ඩර් කළ යුත්තේ, තඹුත්තේගම, රාජාංගනය වම් ඉවුරු වාරිමාර්ග කාර්යාලයෙන් 1965 ජූනි මස 25 වැනි දින හෝ ඊට පෙර හෝ ඉල්ලුම් කිරීමෙන් කාර්යාලයීය වේලාවන් තුළදී ලබා ගත හැකි ටෙන්ඩර් ආකෘති පත්‍වලය. ටෙන්ඩර් පතක් නිකුත් කිරීමට කොන්ත්‍රාත්කරු සෑම අතින්ම සුදුසුදැයි සලකා බැලීම සඳහා අයදුම්කරු විසින් තමාගේ 'කොන්ත්‍රාත් සටහන් පොත' හා දැනට තමා යටතේ මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් වැඩක් ඇත්නම් ඒ වැඩ හා වැඩවල වටිනාකම පිළිබඳ ප්‍රකාශනයක්ද වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පතක් නිකුත් කරලීමට මත්තෙන් කොන්ත්‍රාත්කරු විසින් රාජාංගනය වම් ඉවුරු වාරිමාර්ග කාර්යාලයේදී හෝ දිවයිනේ පිහිටි ඕනෑම දිසාපති කාර්යාලයකදී හෝ මෙම සේවාව සඳහා රු. 50 ක (රුපියල් පණහක) මුදලක් ටෙන්ඩර් තැන්පතක් වශයෙන් තබා ඒ සඳහා නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මෙම ටෙන්ඩරය ගැන තවදුරටත් අවශ්‍ය සෑම විස්තරයක්ම රාජාංගනය වම් ඉවුරේ වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් කාර්යාලයීය වේලාවන් තුළදී ලබා ගත හැක.

ලක්ෂ්මන් උපාලි වීරකෝන්,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
රාජාංගනය වම් ඉවුර.

1965 ජූනි මස 2 වැනි දින,
තඹුත්තේගම, රාජාංගනයේ දී.

6–410—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—මහකනදරාව උප කොටස

මහකනදරාව උප කොටස යටතේ පහත සඳහන් වැඩ වෙනුවෙන් ටෙන්ඩර් පත් 1965 ජූනි මස 22 වැනි දින පෙරවරු 11 දක්වා අනුරාධපුර, උතුරු මැද කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉන්ජිනේරු තැන විසින් භාර ගෙන එවලේම එම ටෙන්ඩර් විවෘත කරනු ඇත.

ටෙන්ඩර් අංක එම්. කේ. එල්. 7—රඹෑවැව අළුත්වැඩියා කිරීම.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 42,000 කට හෝ ඊට වැඩියෙන් ලියාපදිංචිවී ඇති කොන්ත්‍රාත් කරුවන්ට පමණක් මෙම වැඩය වෙනුවෙන් ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැකිය.

1965 ජූනි මස 18 වැනි දින කාර්යාලීය වේලාවන් හිදී පස්වරු 4.30 දක්වා මහකනදරාව උප කොටසේ වාරිමාර්ග ඉන්ජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල ටෙන්ඩර් අයදුම් පත් සකස් කල යුතුයි. ටෙන්ඩර් පත් ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන කොන්ත්‍රාත් කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වැඩ සහ ඒවායේ වටිනාකම් දක්වෙන සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. ආකෘති පත්‍ර නිකුත් කිරීමට ප්‍රථම රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කල යුතුය.

මේ ටෙන්ඩරය ගැන සියළුම විස්තර කාර්යාලීය වේලාවන් හිදී වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

ක. කනගසුංදරම්,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
මහකනදරාව උ. කො.

1965.5.31 වැනි දින,
මිහින්තලේදී ය.

6–411—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—මොණරාගල උප කොටස

හඳපනාගල පුළුල් කිරීමේ ව්‍යාපාරයේ පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්, 1965 ජූනි මස 30 වෙනි බුද දින පෙරවරු 10 දක්වා ඌව කොට්ඨාශයේ, ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින්, බණ්ඩාරවෙල ප්‍රාදේශීය වාරිමාර්ග කාර්යාලයේදී භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත් විවෘත කිරීම එවේලෙහිම සිදු කෙරේ.

| වැඩ පිළිබඳ විස්තර | ලියාපදිංචි කළ මුදල් ප්‍රමාණය රු. ශ. |
|---|---|
| (අ) පෝෂ්‍ය ඇල තැනීම—සැ. 0, දම්. 0, සිට සැ. 0, දම්. 19 දක්වා. ... ... | 45,000 |
| (ආ) පෝෂ්‍ය ඇල තැනීම—සැ. 0, දම්. 19 සිට සැ. 1, දම්. 0 දක්වා. ... ... | රු. 43,000 |
| (ඇ) පෝෂ්‍ය ඇල තැනීම—සැ. 1, දම්. 0, සිට සැ. 2, දම්. 26 දක්වා. ... ... | රු. 39,000 |
| (ඈ) පෝෂ්‍ය ඇල තැනීම—සැ. 1, දම්. 26, සිට සැ. 2, දම්. 0, දක්වා. ... ... | රු. 27,000 |

එක් එක් ශ්‍රේණියන් ඉදිරියේ දක්වා ඇති මුදලට හෝ ඊට වැඩි ගණනකට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන් හට පමණක් අයැදුම් පත් ඉදිරිපත් කළ හැක.

3. 1965.6.28 වෙනි දින දක්වා කාර්යාලදීය වේලාවන් තුලදී පහත සඳහන් නිලධාරීන්ගෙන් ටෙන්ඩර් පෝර්ම ලබා ගත හැක. එම පෝර්ම පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුය :—

(අ) වාරිමාර්ග ඉංජිනේරු තැන—බදුල්ල උප කොටස, බදුල්ල.

(ආ) වාරිමාර්ග ඉන්ජිනේරු තැන, මහියංගනය උප කොටස, මහියංගනය.

(ඇ) වාරිමාර්ග ඉංජිනේරු තැන, මොණරාගල උප කොටස, මොණරාගල.

4. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වැඩ සහ ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශයක්, ඔවුන්ට ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය.

5. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම සඳහා පෝර්ම ලබා ගැනීමට ප්‍රථම සෑම ටෙන්ඩරයක් සඳහා ම රුපියල් 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉන්ජිනේරු තැනගේ කාර්යාලයේ තැන්පත් කළ යුතුය. නොමැති නම් ඕනෑම කච්චේරියක මුදල් තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළයුතු ය.

6. මේ ටෙන්ඩර් ගැන වැඩි විස්තර කාර්යාලයීය වේලාවන් තුලදී මොණරාගල වාරිමාර්ග ඉන්ජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

ටී. එල්. එම්. බලදාස,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
මොණරාගල උප කොටස.

මොණරාගල,
1965 ජූනි මස 4 දින.

6–440—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—මහකනදරාව උප කොටස

මහකනදරාව උප කොටස යටතේ පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර්පත් 1965 ජූලි මස 6 වැනි අඟහරුවාදා පෙරවරු 11 දක්වා අනුරාධපුර උතුරු මැද කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාර ගෙන එවලේම එම ටෙන්ඩර් විවෘත කරනු ඇත.

(1) හුරුළුවැව වැව ඉවුර පාර ගල් අල්ලා තාර දැමීම සඳහා
(2) හුරුළුවැව දකුනු ඉවුරේ ප්‍රධාන ඇල ඉවුරු පාර සැ. 0, සිට 2½ සැතපුම දක්වා ගල් අල්ලා තාර දැමීම සඳහා
(3) හුරුළු වැව දකුනු ඉවුරේ ප්‍රධාන ඇල ඉවුර පාර සැ. 2 1/2 සිට 5 වෙනි සැතපුම් දක්වා ගල් අල්ලා තාර දැමීම සඳහා.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 35,000 කට 1 වැනි වැඩ වෙනුවෙන් සහ රු. 45,000, 2 සහ 3 වැනි වැඩ වෙනුවෙන්ද ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට පමණක් මේ වැඩ සඳහා ටෙන්ඩර් ඉල්ලුම් පත් ඉදිරිපත් කළ හැක.

3. 1965 ජූලි මස 2 වැනි සිකුරාදා සවස 3 දක්වා කාර්යාල වේලාවන් තුලදී මහකනදරාව උප කොසේ වාරිමාර්ග ඉන්ජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල ටෙන්ඩර් පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් පත් ඉල්ලුම් කිරීමේ දී ඒ සඳහා ඉදිරිපත් වන කොන්ත්‍රාත්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වැඩ සහ ඒවායේ වටිනාකම දක්වෙන සහතිකයක්, ඉදිරිපත් කළ යුතුය. ආකෘති පත්‍ර නිකුත් කිරීමට ප්‍රථම රු. 50 ක ටෙන්ඩර් තැතන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයායේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය.

4. මේ ටෙන්ඩර් ගැන සියළුම විස්තර කාර්යාලයීය වේලාවන් තුලදී වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

ක. කනගසුන්දරම්,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
මහකනද්රාව උ. කො.

මිහින්තලේ,
5. 6. 65.

6–427—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—මින්නේරිය උප කොට්ඨාශය

පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත් 1965 ජූලි මස 6 වැනි කුජ දින පෙරවරු 10 දක්වා පොළොන්නරුවේ ඊසාන කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාර ගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලෙහිම එහිදී සිදු කෙරේ:—

| වැඩ විස්තරය | | ලියා පදිංචි ප්‍රමාණය | | ටෙන්ඩර් තැන්පත් මුදල |
|---|---|---|---|---|
| (1) ඇලහැර–ගිරිතලේ පාර අළුත්වැඩියා කිරීම 21 වැනි සැතපුමේ සිට 23 වැනි සැතපුම දක්වා | ... | රු. 31,000 0 | ... | රු. 50 0 |
| (2) ඇලහැර–ගිරිතලේ පාර අළුත්වැඩියා කිරීම 24 වැනි සැතපුමේ සිට 25 වැනි සැතපුම දක්වා | ... | රු. 23,000 0 | ... | රු. 25 0 |
| (3) ඇලහැර–ගිරිතලේ පාර අළුත්වැඩියා කිරීම 26 වැනි සැතපුමේ සිට 31 වැනි සැතපුම දක්වා | ... | රු. 47,000 0 | ... | රු. 50 0 |

2. ඉහත සඳහන් වැඩ සම්බන්ධයෙන් ඒ ඒ ලියා පදිංචි ප්‍රමාණයට හෝ ඊට වැඩි මුදලකට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති පමණක් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසු වෙති.

3. 1965 ජූනි මස 11 වැනි දින සිට 1965 ජූලි මස 2 වැනි දින දක්වා සාමාන්‍ය කාර්යාල වේලාවන් තුලදී පොළොන්නරුව, කවුඩුල්ල සහ මින්නේරිය යන උප කොටස් භාර වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල වලින් ලබා ගත හැකි ෆෝරමවල ටෙන්ඩර් අයදුම් පත් සකස් කල යුතුයි. ටෙන්ඩර් ෆෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් සහ දනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ සහ ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශනයන් ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා ඒ ඒ වාරිමාර්ග ඉංජිනේරුවරු වෙත ඉදිරිපත් කල යුතුය. ෆෝරම නිකුත් කිරීමට ප්‍රථම ඉහත සඳහන් වැඩ සම්බන්ධව ඒවාට ඉදිරියෙන් දී ඇති මුදල් ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් තැන්පත් කල යුතුය. ටෙන්ඩර් තැන්පත් මුදල් ඒ ඒ වාරිමාර්ග ඉංජිනේරුවරුන්ගේ කාර්යාලවල හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට, ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සි ඉදිරිපත් කල යුතුය.

4. ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ටෙන්ඩර් ෆෝරම ලබා ගැනීමට මුදල් තැන්පත් කිරීම අවශ්‍ය නැත.

මෙම වැඩය සඳහා අවශ්‍ය තාර පමණක් හිඟුරක්ගොඩ වාරිමාර්ග කාර්යාලය අසල පිහිටි ගබඩාවෙන් නිකුත් කරනු ලැබේ.

මෙම ටෙන්ඩර් ගැන වැඩි විස්තර සාමාන්‍ය කාර්යාල වේලාවන් තුලදී මින්නේරිය උප කොටස භාර වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

ජී. ඩබ්ලිව්. ඩී. එම්. ගුනරත්න,
වාරිමාර්ග ඉංජිනේරු,
මින්නේරිය උප කොටස.

වාරිමාර්ග කාර්යාලය,
හිඟුරක්ගොඩ, 1965 ජූනි 2 වැනි දින දිය.

6–426—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

1965.6.4 වැනි දින නිකුත් වූ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ ටැන්ඩර් කැඳවීම් දැන්වීමේ පළමුවන ඡේදයෙහි 5 වැනි අංකය, පහත දක්වෙන ලෙස පළවිය යුතුය :—

5. වැලිබැම්ම අමුණු ව්‍යාපාරය ... රු. 20,000 ... රු. 25.

එම්. එම්. සිවප්‍රගාසම්,
පුත්තලම උප කොට්ඨාශය භාර
වාරිමාර්ග ඉංජිනේරු තැන.

පුත්තලම, 1965.6.5.

6–455—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

අනුරාධපුර උප කොටසේ පහත සඳහන් වැඩ සඳහා ටැන්ඩර් පත්‍ර 1965 ජූලි මස 6 වැනි අඟහරුවාද පෙරවරු 10 දක්වා, උතුරු මැද කොටසේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාර ගනු ලැබේ. ටැන්ඩර් විවෘතකිරීම එහිදී එදිනම කරනු ලැබේ:—

| ටැන්ඩර් අංකය | | විස්තර | | | | | උවමනා ලියා පදිංචි වූ ප්‍රමාණය රුපියල් | | ටෙන්ඩර් තැන්පත් මුදල රුපියල් |
|---|---|---|---|---|---|---|---|---|---|
| ඒඑල්. 4 | ... | මහවිලච්චියට ප්‍රවිෂ්ට වීමේ පාරට ගල් සැපයීම | 1 වැනි සැතපුම ... | ... | ... | | 16,000 | ... | 25 |
| ඒඑල්. 5 | ... | එම | 2 වැනි සැතපුම ... | ... | ... | | 17,000 | ... | 25 |
| ඒඑල්. 6 | ... | එම | 6 වැනි සැතපුම ... | ... | ... | | 17,000 | ... | 25 |
| ඒඑල්. 7 | ... | එම | 7 වැනි සැතපුම ... | ... | ... | | 16,000 | ... | 25 |
| ඒඑල්. 8 | ... | නාච්චදූව පාරට ගල් සැපයීම | 4 වැනි සැතපුම | ... | ... | | 16,000 | ... | 25 |
| ඒඑල්. 9 | ... | එම | 5 වැනි සැතපුම | ... | ... | | 16,500 | ... | 25 |
| ඒඑල්. 10 | ... | කලාවැව යෝධ ඇලේ කොන්ක්‍රීට් ගොඩ නැග්මක් ඉදිකිරීම | | ... | ... | | 21,000 | ... | 25 |

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් ගණන්වලට හෝ ඊට වැඩි ගණන්වලට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ගෙන් මෙම වැඩ සඳහා ටෙන්ඩර් අයදුම් පත් භාර ගනු ලැබේ.

වර්ෂ 1965 ජූලි මස 2 වැනි සිකුරාද වනතෙක් (එදින ඇතුළුව) කාර්‍යාලීය වේලාවන් තුළදී අනුරාධපුර වාරිමාර්ග, පදවිය, මහකනදරාව වාරිමාර්ග ඉංජිනේරු කාර්‍යාලයන්ගෙන් ලබා ගත හැකි ෆෝරම වල පමණක් අයදුම් පත් ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් ෆෝරම කොළ සඳහා දනට ඔවුන් කරන වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වැඩ සහ ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශයක් ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ තිබේද, නැද්ද යන්න ගැන සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ෆෝරම නිකුත් කිරීමට ප්‍රථම ඉහත සඳහන් පරිදි තැන්පත් මුදල් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ දිවයිනේ ඕනෑම කච්චේරියක තැන්පත් කර ලබාගන්නා ලද කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

මේ සම්බන්ධයෙන් ගිවිසුම, වැඩ සැලසුම් ආදී වැඩි විස්තර කාර්‍යාලීය වේලාවන් තුළදී වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැක.

එම්. රතිනම්,
වාරිමාර්ග ඉංජිනේරු,
අනුරාධපුර උප කොටස.

1965 ජූනි මස 5 දින.

6–461—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

ගැනීමට නියමිත අවසාන දිනයේ එහි සඳහන් වේලාවේදී පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේදීය. පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන සමග කටයුතු පිළියෙල කරගෙන, තම තමන් විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර්වල අනු පිටපත් පරීක්ෂා කර බැලීමට ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ.

6. ටෙන්ඩර් ආකෘති පත්‍ර, රු. 100,000 කට අධික වටිනාකමකින් යුත් ගොඩනැගිලි කටයුතු සඳහා රජයේ ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත්කරුවන් පමණක් (අ) ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි සහ (ආ) එක් ගොඩනැගිල්ලකට එක් ටෙන්ඩරයක් වෙනුවෙන් රු. 100 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් 1965. 7. 1 වැනි දින දවල් 12 වන තෙක් ලබාගත හැකිය. ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කළ යුත්තේ ඕනෑම කච්චේරියක නැතහොත් කොළඹ මහා භාණ්ඩාගාරයෙහි ය. ජයග්‍රාහක ටෙන්ඩර්කරු විසින් ගිවිසුම් පත්‍රයට අත්සන් තැබූ පසු ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ලැබේ. ජයග්‍රාහක ටෙන්ඩර්කරුට ඔහුගේ ටෙන්ඩරය භාරගත් බව දන්වා දින 10 ක් ඇතුළතදී නියමිත ඇපය තැබීමට හෝ ගිවිසුම අත්සන් කිරීමට ඔහු අපොහොසත් වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කොට, ඔහුගෙන් රජයට ලැබිය යුතු වෙනත් දේ ලබා ගැනීමට හානියක් නොවන සේ ඔහුගේ නමද සේවය පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයෙහි ඇතුලත් කරනු ලැබේ. පහත සඳහන් ආයතන හා පුද්ගලයන් ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීමෙන් නිදහස් කරනු ලැබේ. (ආ) සමූපකාර තොග වෙළඳ ආයතනය (ඇ) වෙනත් ආණ්ඩුවල රාජ්‍ය වෙළඳ සංවිධාන—උදා.—ජාතික යන්ත්‍රෝපකරණ ආනයන සංස්ථාවේ සභාපති, (ඉ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ අනුමත කළ ග්‍රාම සංවර්ධන සමිති (ඊ) සමූපකාර සමිති රෙජිස්ට්‍රාර් විසින් ලියාපදිංචි කරන ලද සමූපකාර සමිති.

7. නියමිත ආකෘතියෙහි ඉදිරිපත් නොකැරුනු හෝ එම ආකෘතියෙහි සඳහන් කොන්දේසිවලට අනුකූල නොවූ හෝ කවර ටෙන්ඩරයකුදු සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් කරන ගාස්තු ප්‍රමාණයන් හා මිල ගණන් තීන්තෙන් පිරිසිදුව සඳහන් කළ යුතු අතර වෙනස් කළ හැම තැනක්ම ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොදා සහතික කළ යුතුය. ටෙන්ඩර් කරන මිළ ගණන් වචන හා ඉලක්කම් යන දෙආකාරයෙන්ම දක්විය යුතුයි.

8. ටෙන්ඩර්කරුවන් විසින් සිය ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේදී අදාල ප්ලෑන් හා ටෙන්ඩරයේ කොන්දේසි හදාරා ඇතැයි ද, අදාළ භූමි භාගයකට ගොස් එය පරීක්ෂා කරන ලදැයි ද, ඊට සම්බන්ධ හැම කරුණු ගැනම එනම් දේශීය තත්ත්වය, දේශීය කම්කරු තත්ත්වය, ගෙවීම් ප්‍රමාණ, ප්‍රවාහන පහසුකම් හා එම භූමි භාගයට යාම් ඊම් පහසුකම් ඇතුළු ස්වකීය ටෙන්ඩරයට කවරාකාරයකින් හෝ බලපාන සෙසු සියලුම තත්ත්වයන් මනාව අවබෝධ කර ගන්නා ලදැයි ද සලකනු ලැබේ.

9. භූමි භාගය එළි කිරීමේ කාර්යය සඳහා ටෙන්ඩර්කරුවන් විසින් ලංකාවට ගෙන්වීමට අදහස් කරන සියලුම යන්ත්‍ර, උපකරණ හා ද්‍රව්‍ය පිළිබඳ උප ලේඛනයක්ද ඔවුන්ගේ ටෙන්ඩර් සමග ඉදිරිපත් කළ යුතු අතර එම යන්ත්‍ර, උපකරණ සහ ද්‍රව්‍යවල නියමිත මිළ ගණන්ද රුපියල් වලින් දැක්විය යුතුය.

10. ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ මිළ ගණන්, ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනයේ සිට සති 12ක් ඉකුත් වනතෙක් භාර ගත හැකිවන පරිදි විවෘතව තැබිය යුතුය. ගොඩනැගිලි ඉදි කිරීම ටෙන්ඩරය භාරගත් දින සිට මාස 4 ක් ඇතුළතදී සම්පූර්ණ කිරීමට ටෙන්ඩර්කරු වගබලා ගත යුතුය. එසේ කිරීමට අසමත් වුවහොත් ප්‍රමාදය සඳහා දඩුවමක් වශයෙන් නොව ප්‍රමාණ කළ අලාභ වශයෙන් එම වැඩය සම්පූර්ණ කරන තෙක් එක ගොඩනැගිල්ලකට එක දිනකට රු. 20 ක මුදලක් බැගින් ටෙන්ඩර්කරු විසින් ගෙවිය යුතුය.

12. ටෙන්ඩරය පිළිගත් බව දැනුම් දී දින 10 ක් ඇතුළතදී ජයග්‍රාහක ටෙන්ඩර්කරු විසින් ගිවිසුමකට ඇතුලත් වී ටෙන්ඩර් කළ මුදලින් සියයට පහකට සමාන මුදලක්ද ඕනෑම කච්චේරියක කෘෂිකර්ම අධ්‍යක්ෂ ගේ නමින් තැන්පත් කළ යුතුය. මෙම මුදල ආපසු ගෙවනු ලබන්නේ කොන්ත්‍රාත්තුව සතුටුදායක අන්දමින් සම්පූර්ණ කළ පසුව පමණයි. කොන්ත්‍රාත්තුව නිසියාකාර ඉටු කිරීමට ජයග්‍රාහක ටෙන්ඩර්කරු අසමත් වුවහොත් ඔහුගේ ඇප තැන්පත් මුදල රාජසන්තක කොට, ඔහුගෙන් රජයට ලැබිය යුතු වෙනත් දේ ලබා ගැනීමට හානියක් නොවන සේ, ඔහුගේ නමද සේවය පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයෙහි ඇතුලත් කරනු ලැබේ. මුද්දර ආඥාපනතට අනුකූලව ගිවිසුමට සහ/හෝ බැඳුම්කරයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකමද ජයග්‍රාහක ටෙන්ඩර්කරු විසින් දැරිය යුතුය.

12. ඉහත සඳහන් කර්මාන්ත කරගෙන යාමේදී සියයට සියයක් ලාංකික කම්කරුවන්ම ඒ සඳහා යෙදවීමට ජයග්‍රාහක ටෙන්ඩර්කරු වගබලා ගත යුතුය. මෙම සංඛ්‍යාව වෙනස් කළ හැක්කේ ස්ථිර ලේකම්වරයාගේ අනුමතිය ලබාගෙන පමණකි. "ලාංකික" යන පදයෙන් අදහස් කරනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචිවීමෙන් ලංකාවේ රට වැසියකු වන කෙනෙකි. කාර්ය නියුක්ත කිරීමට හෝ ක්‍රියා කිරීම් මෙහෙයවීමට පුහුණු පුද්ගලයන් පිටරටින් ගෙන්වීම සංක්‍රමණ නීතිරීතිවලට යටත්ව කළ යුතුය. ඒ පිළිබඳ විධිවිධාන සලසා ගැනීමද ටෙන්ඩර්කරුවන් විසින්ම කරගත යුතුය.

13. 1934රේ අංක 19 දරණ කම්කරු වන්දි ආඥාපනත (අධිකාරය 117) යටතේ සේවකයකු විසින් හෝ සේවකයකු සම්බන්ධයෙන් ඉදිරිපත් කෙරෙන කවර වන්දියක් සම්බන්ධයෙන් වුවද රජය නිදහස් කිරීමට කොන්ත්‍රාත්කරු වගබලා ගත යුතුය.

14. ඇපකරුවකු හෝ වැඩි දෙනෙකු ඉදිරිපත් කරන ලෙස කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා නියම කළහොත් එසේ ඉදිරිපත් කිරීමට ජයග්‍රාහක ටෙන්ඩර්කරු සූදානම්ව සිටිය යුතුය. ටෙන්ඩර්කරු විසින් නම් කෙරෙන එම ඇපකරුවන් කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා විසින් අනුමත කරනු ලැබුවහොත්, කොන්ත්‍රාත්කරුගේ වියදමින් බැඳුම්කරයකට අත්සන් තැබීමට ඔවුන්ට සිදුවේ.

15. රාජකාරිය පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ රජයේ නම් ලැයිස්තුවෙහි නම් වශයෙන් හෝ වෙනත් පුද්ගලයකුගේ නමද සමග ඒකාබද්ධ වශයෙන් හෝ නම සඳහන් වන කවර පුද්ගලයෙකුගෙන් හෝ ටෙන්ඩර් භාර නොගන්නා අතර එවැන්නකු සමග කවර කොන්ත්‍රාත්තුවකට හෝ ඇතුලත් ද නොවනු ලැබේ.

16. කොන්ත්‍රාත්කරු වෙත භාරදිය යුතු සියලුම නිවේදන, පෞද්ගලික වශයෙන් ඔහුටම භාරදුනහොත් හෝ ගිවිසුමෙහි දී ඇති ලිපිනයට තැපෑලෙන් යැවුවහොත් හෝ ඔහුට භාර දුන්නාසේ සලකනු ලැබේ. කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාගේ අවසරය ලියවිල්ලකින් නොලබා කොන්ත්‍රාත්තුව හෝ එහි කොටසක් හෝ අතුරු බද්දට දීමද කොන්ත්‍රාත්කරු විසින් නොකළ යුතුය.

17. කොන්ත්‍රාත්කරු විසින් සේවයෙහි යොදනු ලබන ඕනෑම කම්කරුවකු, නැතහොත් සේවයෙහි යෙදීම ප්‍රඥාගෝචර නොවේ යැයි සැලකෙන කම්කරුවකු එසේ සේවයෙහි යෙදවීම නවතාලීමේ බලය රජය සතුවේ.

18. දෙපාර්තමේන්තුවේ යහපත තකා කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා විසින් නියමිත වැඩයෙන් කොටසක් අඩු කරනු ලැබූ අවස්ථාවක් වුවහොත්, කොන්ත්‍රාත්තුවේ නියත වශයෙන් දක්වා ඇති ප්‍රමාණය නොකරනු ලැබීම හේතු කොට ගෙන රජයෙන් කිසිම අලාභයක් ඉල්ලා සිටීමට ද කොන්ත්‍රාත්කරුට අයිතියක් නැත්තේය.

19. අසතුටුදායක වැඩ කටයුතු නිසා කොන්ත්‍රාත්තුවේ සඳහන් නියමයන් ඉටු නොකිරීම නිසා හෝ කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමේ අයිතිය ද කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා සතු වන්නේය.

20. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියලුම ටෙන්ඩර ප්‍රතික්ෂේප කිරීමේදී ටෙන්ඩරයක හෝ ටෙන්ඩරවල කොටස් පමණක් පිළිගැනීමේ අයිතියද රජය සතු වේ.

21. තව දුරටත් අවශ්‍ය තොරතුරු පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉංජිනේරු) ගෙන් ලබාගත හැකිය. මේ පිළිබඳව විමසීම් එවිය යුත්තේ ඔහුගේ කාර්යාලීය පදවි නාමයට විනා පෞද්ගලික නාමයට නොවේ.

ඩී. සී. එල්. අමරසිංහ,
වැඩ බලන කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1965 ජූනි 2 වැනි දින,
පේරාදෙණියේ දීය.

6–413—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

පේරාදෙණියේ ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින්, පහත සඳහන් ස්ථානවල පහත සඳහන් දෑ සඳහා ටෙන්ඩර් පත්‍ර 1965 ජූනි මස 23 වන දින පස්වරු 2.30 වනතෙක් භාරගනු ලැබේ.

1. කුණ්ඩසාලේ රජයේ කොකෝ මධ්‍යස්ථානයේ දොඩම් ගොල්ල කොටසේ කොකෝවා අක්කර 37 ගලවා ශුද්ධ කිරීම සහ සියළු දර මිළයට ගැනීම.

(අ) කොකෝ ගස් 4,690ක් සම්පූර්ණයෙන් මුලින් උදුරා අස් කිරීම.

(ආ) එරබදු ගස් 464ක් පමණ සම්පූර්ණයෙන් කපා අස්කිරීම.

(ඇ) ගම්මිරිස් වැල් නැති ග්ලිරිසීඩියා ගස් 410ක් පමණ සම්පූර්ණයෙන් මුලින් උදුරා අස් කිරීම.

(ඇ) වෙනත් ගස් වගී 100ක් පමණ සම්පූර්ණයෙන් මුලින් උදුරා ඉවත් කිරීම.

2. හිඟුරක්ගොඩ රජයේ ගොවිපලේ අඹගස් 300ක් කපා මුල් ගලවා දර ඉවත් කිරීම සහ දර මිළයට ගැනීම.

(අ) හිඟුරක්ගොඩ රජයේ ගොවිපලේ කළමනාකාර තැන හෝ ඔහුගේ නියෝජිතයා විසින් පෙන්නුම් කරන අඹ ගස් 300ක් බිම හෙලා අඩියක් ගැඹුරක ඇති මුදුන් මුල සම්පූර්ණයෙන් ඉවත් කිරීම.

(ආ) කඳ, මුල් සහ අතු ගොවිපලෙන් පිටතට ගෙනයා යුතුයි.

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### (නියමිත මිල යෝජනා ක්‍රමය හා වී කෙටීම)

කොළඹ 7, එඩින්බරෝ චන්ද්‍රවංශ අංක 42 ස්ථානයෙහි ගොවිජන සේවා දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් මරදානේ පියුනිසියා ගබඩාවට බුසල් 2½ (දෙකහමාර) හොඳ පුරන ගිස්ගෝනි 50,000 ක් සැපයීම සඳහා කැඳවනු ලබන ටෙන්ඩර් 1965 ජූනි 25 වැනි සිකුරාදා අ. භා. 2.30 වන තෙක් බාරගනු ලැබේ.

2. දිවයිනේ කච්චේරියකට හෝ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ අංක 60 හෝ හෝර්ටන් පෙදෙසෙහි ගණකාධිකාරී තැනට රු. 200 ගෙවා ලබාගන්නා ලද කුවිතාන්සියක් ඉදිරිපත් කොට දෙපාර්තමේන්තුවේ අංක 42, එඩින්බරෝ චන්ද්‍රවංශ කාර්යාලයේ ටෙන්ඩර් ශාඛාවෙන් 1965 ජූනි 25 වැනි දින දවල් 12 වන තෙක් නිකුත් කරනු ලබන ටෙන්ඩර්පත් ලබාගෙන අනු පිටපතක්ද සහිතව පුරවා එවිය යුතුයි.

3. වැඩි විස්තර පහත සඳහන් කාර්යාලයෙන් හෝ මරදානේ පියුනිසියා ගබඩාවේ සැපයීම් අංශයේ ගණකාධිකාරී තැනගෙන් විමසා දැනගත හැක.

කේ. සිත්තම්බලම්,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

1965 ජූනි 11 වැනි දින,
කොළඹ 7, තැ. පෙ. 537,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ දීය.

6-466—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ, මැකලම් පාරේ පිහිටි ප්‍රවාහන අංශයේ ඇති පාවිච්චි කළ මෝටර් වාහන මිළදී ඉවත් කර ගෙන යාම සඳහා කොළඹ 1, චැතැම් වීදියේ අංක 62 දරණ තැන අලෙවි කිරීමේ කොමසාරිස් විසින් 1965 ජූලි මස 5 වැනි සඳුදා අ. භා. 2.30 දක්වා ටෙන්.ඩර් භාර ගනු ලැබේ.

2. කොළඹ 1, චැතැම් වීදියේ අංක 62 දරණ තැන පිහිටි අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රු. 150 ක් බැඳ කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1965 ජූලි මස 5 වැනි සඳුදා දවල් 12 හ දක්වා ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

3. වැඩි විස්තර කොළඹ 1, චැතැම් වීදියේ අංක 62 දරණ තැන අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් හෝ මැකලම් පාරේ පිහිටි ප්‍රවාහන අංශයෙන් දැන ගැනීමට පිළිවන.

පී. එච්. ඩී. විජේසූරිය,
වැඩබලන අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1965.6.4 දා, කොළඹ 1,
අංක 62, චැතැම් වීදියේ,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේදීය.

6-408—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

---

## සමාජ සේවා වැඩ—මාතර දිස්ත්‍රික්කය

### අඟුල් ඔරු එකක් සාදා භාර දීම

පහත සඳහන් විස්තර අනුව අඟුල් ඔරුවක් සාදා භාරදීම සඳහා ටැන්ඩර් කැඳවනු ලැබේ :—

(අ) අඟුල් ඔරුවේ එක් ඔරුවක් අඩි 16 අඟල් 6 ක්ද, අනෙක අඩි 15 අඟල් 6 ක්ද දික් විය යුතුයි. මෙම ඔරු දෙක අඩි 7ක් දික්වූද, අඩි 4ක් පළල්වූද තට්ටුවකින් එකට සම්බන්ධ කළ යුතුයි. තට්ටුව සඳහා අඟල් 2×2½" කිතුල් පීප්ප යෙදිය යුතුයි. හබලක්ද සැපයිය යුතුයි.

(ආ) ඔරුවල දිගට සරිලන පරිදි ඇතුළත වට ප්‍රමාණය අඩි 3 කටද, පිටත වට ප්‍රමාණය අඩි 3, අඟල් 8 කටද අඩු නොවිය යුතුයි.

(ඇ) ඔරු සෑදිය යුත්තේ 'කොස්', 'බැදි දෙල්' හෝ 'කොළොන්' හෝ දැව වර්ග වලින් එක වර්ගයකිනි. හබල් ද ශක්තිමත් දැව වර්ගයකින් සෑදිය යුතුය.

(ඈ) අඟුල් ඔරුව සාදා නිමවූවායින් පසුව එය තොටු පළවල්වල යොදවා තිබෙන අඟුල්වලට සමාන විය යුතුයි. එහෙත් බංකු සෑදීම අනවශ්‍යය.

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් සමන්විත විය යුතු අතර ටෙන්ඩර් පත්‍ර එක ලියුම් කවරයක බහා සීල් තබා "මාතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත, කච්චේරිය, මාතර" යනුවෙන් ලිපිනය ලියා ලියුම් කවරයේ වම් පැත්තේ ඉහළ කෙළවරෙහි "අඟුල් ඔරුවක් සාදා භාර දීම" යනුවෙන්ද ලියා, කච්චේරියේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ දැමීම හෝ කාර්යාල සහකාර තැනට භාර දීම හෝ ලියා පදිංචි තැපෑලෙන් හෝ කළ හැකිය. මෙම ටෙන්ඩර් පත්‍ර ආණ්ඩුවේ ඒජන්ත වෙත ලැබිය යුත්තේ 1965 ජූනි 30 වැනි බදාදා දවල් 12 ට පෙරය.

3. 1965 ජූනි 11 වැනි සිකුරාදා සිට 1965 ජූනි 25 වැනි සිකුරාදා දවල් දොළහ වන තෙක් මාතර කච්චේරියෙන් නිකුත් කරනු ලබන ටෙන්ඩර් ආකෘති පත්‍ර පමණකි මේ සඳහා ප්‍රයෝජනයට ගත යුත්තේ. සැලැකිල්ලට භාජනය කරනු ලබන්නේ එසේ ඉදිරිපත් කරනු ලැබූ ටෙන්ඩර් පත්‍ර පමණකි.

4. ටෙන්ඩර් පත්‍රයන්හි කරනු ලබන සෑම වෙනස් කිරීමකටම ටෙන්ඩර්කරු විසින් තමාගේ කෙටි අත්සන යෙදිය යුතුය.

5. ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලබන්නේ, මාතර කච්චේරියේ රුපියල් 25 ක මුදලක් තැන්පත් කර ඒ වෙනුවට ලබා ගන්නා ලද කුවිතාන්සියක් ඉදිරිපත් කරන අයට පමණකි. තම ටෙන්ඩර් පත්‍රය භාරගත් බැව් දන්වා දින 10ක් ඇතුළත යම් කෙනෙකු කොන්ත්‍රාත්තුවට හෝ බැඳුම්කරයට හෝ අත්සන් කිරීම පැහැර හැරියහොත් ඒ අය තැන්පත් කළ ඇප මුදල රාජසන්තක වේ. ටෙන්ඩර්කරු විසින් සපයන ලිපිනයට ලියා පදිංචි කළ තැපැලෙන් ලියා යැවීම හෝ එම ස්ථානයෙහි තැබීම හෝ ටෙන්ඩරය පිළිගත් බව ටෙන්ඩර්කරුට දැනුම් දීමක් හැටියට සලකනු ලැබේ. අනෙක් සෑම ඇප මුදලක්ම කොන්ත්‍රාත්තුව අත්සන් කිරීමෙන් පසු ආපසු ගෙවනු ලැබේ.

6. ආණ්ඩුවේ ඒජන්ත තැන විසින් නියම කරනු ලබන කාලසීමාව තුළදී වැඩය කරන බවට තෝරා ගත් ටෙන්ඩර්කරු ආරක්ෂිත ඇප මුදලක් තැන්පත් කළ යුතුය.

7. ඇපකරුවන් අවශ්‍ය වුවහොත් තෝරා ගත් ටෙන්ඩර්කරු විසින් ඔවුන් ඉදිරිපත් කිරීමට සූදානම් විය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රයක් හෝ සියල්ලම හෝ කොටසක් හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය මාතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත තැන සතුය.

9. 1965 ජූනි 30 වැනි බදාදා පස්වරු 1 ට මාතර කච්චේරියේ කාර්යාල සහකාර ඉදිරිපිටදී ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරනු ලබන විට ටෙන්ඩර්කරුවන්ටද පැමිණ සිටිය හැක.

10. **සැලකිය යුතුයි.**—ඔරු සාදා අවසාන වූවාට පසු ඒවා පරීක්ෂා කර අනුමත කරනු ලැබේ. එසේ අනුමත කළාට පසු ලී ආරක්ෂිත ආලේපයක් ගැල්විය යුතුයි.

ඇෆ්. සී. පීටර්ස්,
මාතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1965 ජූනි 1 වැනි දින,
මාතර කච්චේරියේ දීය.

6-416—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

---

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

### මුද්‍රණාලයේ කැපී ඉවතලන කඩදාසි

කඩදාසි කැලි හො. 15ක් පමණ දැනට විකිණීම සඳහා, කොළඹ 2, මැලේ වීදියේ, විභාග දෙපාර්තමේන්තුවේ තබා ඇත. මෙම කඩදාසි කැලි තොගය මිලදී ගැනීමට කැමති අයට මෙම කාර්යාලයේ දී පෙරවරු 9 සිට පස්වරු 4 දක්වාත්, සෙනසුරාදා දිනවල පෙරවරු 9 සිට පෙරවරු 11.30 දක්වා කාලය තුළ දී ඒවා පරීක්ෂා කර බැලීමට පුළුවන.

මිල ගණන් සඳහන් කරන ලද ඉල්ලුම් පත්‍ර සීල් තබා ලියා පදිංචි කරන ලද තැපැලෙන් එවිය යුතු අතර ඒවා බහා එවන කවරයේ වම් පැත්තේ මුදුන් කෙළවරේ "OFF-CUTS" යන්න සඳහන් කොට 1965 ජූනි මස 25 වැනි දින දවල් 2ට පෙර ලැබෙන සේ එවිය යුතුයි.

භාරගත් ටෙන්ඩරය එවන අය දැනුම්දීමෙන් පසු මුදල් ගෙවා පැය 24ක් තුළ දී කඩදාසි තොගය ගෙන යා යුතුයි.

1965 ජූනි මස 3 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

එච්. එල්. විමලසූරිය,
වැඩ බලන විභාග කොමසාරිස්.

6-423—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

## රජයේ විදුලි දෙපාර්තමේන්තුව

### කුරුණෑගල රෝහලේ අලුත් ශල්‍යාගාර ගොඩනැගිල්ලට ඇදන් ගෙනයන විදුලි සෝපානක් සපයා ඉදිකිරීම

ඉහත සඳහන් වැඩය සඳහා ටෙන්ඩර් පත්‍ර වර්ෂ 1965 ක්වූ අගෝස්තු මස 10 වන අඟහරුවාදා පූ. භා. 10 දක්වා ඉඩම්, වාරිමාර්ග සහ විදුලිය පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන් (තැ. පෙ. 500, කොළඹ) විසින් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධව ලියකියවිලි කොළඹ මැකලම් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කාර්යාලයෙහි දී කියවා බලා ගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 100ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් ද, රු. 5ක මුදලක් ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වශයෙන් ද, රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ගෙවා ලබාගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 ය ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ. ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වන රු. 5 ගේ මුදල ආපසු ගෙවනු නොලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහත කී අයුරු ලබාගත් පෝර්ම වලයි. එකී 1965 අගෝස්තු මස 6 වන දින අ. භා. 2 වන තෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

4. එකී 1965 ක්වූ අගෝස්තු මස 10 වන අඟහරුවාදා පූ. භා. 10ට ගාලු මුවදොර මහා ලේකම් කාර්යාලයේ නො. 355 හේ කාමරයේ පිහිටි ඉඩම්, වාරිමාර්ග සහ විදුලි බල පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ඇස්. ඩබ්ලිව්. පීරිස්,
වැඩ බලන විදුලි කර්මාන්ත ප්‍රධාන කළමනාකාරතැන,

තැ. පෙ. 540, කොළඹ 10.
1965 ක්වූ ජූනි මස 11 දින දීය.

6–405—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

---

## ජලසම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුව

### හම්බන්තොට ජලසම්පාදන ක්‍රමය, මහලේ වාය දක්වා දීර්ඝ කිරීම

හම්බන්තොට ජලසම්පාදන ක්‍රමයේ ජලය බෙදා හැරීමේ ප්‍රධාන ජලනලය මහලේ වාය දක්වා දීර්ඝ කිරීම සඳහා එවනු ලබන ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර, කොළඹ 1, යෝර්ක් වීදියේ හේමාස් ගොඩනැගිල්ලේ පළවෙනි මහලේ අංක 751/1 දරන ස්ථානයේ පිහිටි පළාත් පාලන අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1965 ජූලි මස 9 වැනි සිකුරාදා පෙරවරු 10 දක්වා භාරගනු ලැබේ. එදිනම පෙරවරු 10.10 ට ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර විවෘත කරනු ලබන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩල කාමරයට පැමිණ සිටිය හැකිය.

2. මෙම දෙපාර්තමේන්තුවේ නිර්මාණ හා නඩත්තු පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු තැන වෙතින් ලබාගත යුතු ටෙන්ඩර් ආකෘති පත්‍ර මගින් අනුපිටපතක් ද සහිතව ටෙන්ඩර් ඉදිරිපත් කල යුතුය. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරුද එකී නිලධාරී තැනගෙන් ලබාගත හැකිය. මේ කර්මාන්තය සඳහා පී. වී. සී. ජලනල පාවිච්චි කරන ලෙස ටෙන්ඩර් කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

3. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වෙනත් ඕනෑම රජයේ දෙපාර්තමේන්තුවක හෝ රුපියල් 50,000 ක් දක්වාවූ වැඩ සඳහා ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන් හෝ පී. වී. සී. ජලනල නිෂ්පාදනය කරන්නන් මේ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සන් වන්නෝය. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට ප්‍රථම තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ සාක්ෂි හා ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 50 ක් තැන්පත් කර ඇති බවට කුවිතාන්සියක් ද 1965 ජූලි මස 2 වැනි සිකුරාදා දවල් 12 ට ප්‍රථමයෙන් ඉහතකී නිලධාරි තැන වෙත ඉදිරිපත් කල යුතුය. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමේ අවසාන දිනය වනතෙක් නොසිට හැකි පමණ ඉක්මණින් ඒවා ලබා ගන්නා ලෙස ටෙන්ඩර්කරුවන් වෙත දන්වා සිටිනු ලැබේ.

4. පහත දැක්වෙන ආයතන හා සමිතිවලින් ටෙන්ඩර් තැන්පත් මුදලක් අවශ්‍ය වන්නේ නැත :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන, නිදසුනක්—"චෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්".

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, හා

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කල යුතු මුදල රත්මලානේ ජල සම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුවේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කල හැකිය.

6. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කරන විට මේ සමාන වැඩ වෙනත් තැන්වල කර ඇති බවටත්, යෝජිත වැඩය භාර ගැනීම සඳහා සම්පූර්ණයෙන් සුදුසුකම් ඇත්තාවූ සේවකයින් තමන් වෙත සිටින බවටත් සාක්ෂි ඉදිරිපත් කල යුතුය.

ආර්. වී. පෙරුමයිනාර්,
වැඩ බලන ජලසම්පාදන හා ජලාපවහන අධ්‍යක්ෂ.

1965 ක්වූ ජූනි මස 5 වැනි දින,
රත්මලානේ ජලසම්පාදන හා ජලාපවහන
දෙපාර්තමේන්තුවේ දීය.

6–484—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

---

## කිරි මණ්ඩලය

### (1) චොකලට් කුඩු; සහ (2) රස සාර සහ පාට වර්ග සැපයීම

කිරි මණ්ඩලයේ සභාපති විසින් ඉහත සඳහන් ද්‍රව්‍ය සැපයීම පිණිස, 1965 ජූලි මස 14 වැනි බදාදා පෙරවරු 10 තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

එක් ටෙන්ඩර පත්‍රයකට රු. 150 බැගින් ආපසු ගතහැකි තැන්පත් මුදලක් ගෙවීමෙන් ටෙන්ඩර කිරීමට අවශ්‍ය පෝර්ම කොළ කිරි මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයෙන් ලබාගත හැක. පෝර්ම කොළ 1965 ජූලි මස 13 වැනි අඟහරුවාදා පස්වරු 3 දක්වා නිකුත් කරනු ලැබේ.

සභාපති,
කිරි මණ්ඩලය.

කිරි මණ්ඩලය,
නාරාහේන්පිට,
කොළඹ 5, 65.6.11.

6–482—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

---

යොමු අංකය : එෆ්.ටී.බී. 37/65.

## සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

### ටෙට්‍රාසයික්ලින් හයිඩ්‍රොක්ලෝරයිඩ්ආදිය සැපයීම

මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි සඳහන් පරිදි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකතැනට ටෙට්‍රාසයික්ලින් හයිඩ්‍රොක්ලෝරයිඩ් ආදිය සැපයීම සඳහා එවන ටෙන්ඩර් පත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් 1965.9.21 වෙනි අඟහරුවාදා උදේ 10 දක්වා බාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුවේ. ඒ සඳහා අවශ්‍ය ටෙන්ඩර් ආකෘති පත්‍ර කොළඹ ඩීන්ස් පාරේ, අංක 355 දරණ ගොඩනැගිල්ලේ පිහිටි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂතැනගේ කාර්යාලයෙන් (කොන්ත්‍රාත් සහ සැපයීමේ අංශයෙන්) ලබාගත හැක. මෙම දැන්වීමේ 5 වැනි, 6 වැනි ඡෙදයන්හි සඳහන් කරුණු අනුව 1965.9.20 වෙනි සඳුදා උදේ 10 දක්වා ඉල්ලුම්කරුවන් වෙත ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

3. සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත් සීල් තබන ලද කවරයක බහා, සභාපතිතැන, ටෙන්ඩර් මණ්ඩලය, සෞඛ්‍ය අමාත්‍යාංශය, තැ. පෙ. 500, පළමුවෙනි මහළ, මහා ලේකම් ගොඩනැගිල්ල, ගාලු මුවදොර, කොළඹ යන ලිපිනයට එවිය යුතුවේ. සීල් තබන ලද ටෙන්ඩර්පත් බහාලන කවරයේ වම් කෙළවරේ උඩ "ටෙට්‍රාසයික්ලින් හයිඩ්‍රොක්ලෝරයිඩ්, 1965.9.21 උදේ 10" ට යනුවෙන් සඳහන් කළ යුතුවේ.

4. ටෙන්ඩර්පත් ගාලු මුවදෙර මහා ලේකම් ගොඩනැගිල්ලේ පිහිටි සෞඛ්‍ය අමාත්‍යාංශයේ කාමර අංක 155හේ ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීම හෝ ලියාපදිංචි කළ තැපැලෙන් හෝ එවීම කළ හැක. එහෙත් ටෙන්ඩර්කරුවන්ගේ හෝ ඔවුන්ගේ නියෝජිතයින්, තමන්ට අවශ්‍යයයි හැඟේනම් සිල් තබන, ලද ටෙන්ඩර් පත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ උප ලේකම්තැන වෙත පුද්ගලිකව ගෙනැවිත් බාරදීමද කළ හැක. එසේ බාරදෙන සීල් තබන ලද කවරයේ එය කිනම සැපයීමක් සඳහාද යන වග හා ටෙන්ඩර්කුරුගෙ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුවේ. එම ටෙන්ඩර් පත් බාර ගැනීම සඳහා ඉහතකී නිලධාරිතැනට බලය ඇත. සිල් තබන ටෙන්ඩර් පත් බාරගත් බවට කුවිතාන්සියක් එවිට ටෙන්ඩර්කරු වෙත ඔහු විසින් නිකුත් කරනු ලැබේ.

5. සුප්‍රසිද්ධ නිෂ්පාදන සමාගමක ඒජන්තවරයෙකුට හෝ වෙළඳ නියෝජිතයෙකුට වුවද ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. එහෙත් අයදුම්කරු නම කරන ලද නිෂ්පාදන සමාගමේ නියෝජිත ඒජන්තවරයෙකු බව සහතික කළ යුතු වේ. (මේ සඳහා නියෝජිතත්වය ඔප්පු කිරීමක් ඉදිරිපත් කළ යුතුවේ.)

6. 1955 ඔක්තෝබර් 28 වෙනි දින අංක 10,854 දරන ලංකා ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ සඳහන් අයුරු, සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 1949 සහ අංක 25 දරණ ආහාර සහ ඖෂධ පනත යටතේ පනවන ලද රෙගුලාසි අනුව, ඖෂධ විකිණීම සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තැනගෙන් ලබාගත් වලංගු බලපත්‍රයක් ඇති, බලයලත් වෙළඳුන්ගෙන් පමණක් මෙම සැපයීම සඳහා ටෙන්ඩර් පත් බාරගනු ලැබේ. ලාංකික සම්බන්ධතා ඇති රටවල් වූ ඇල්මේනියාව, ඕස්ත්‍රියාව, බල්ගේරියාව, චීන මහජන සමූහ ආණ්ඩුව, චෙකොස්ලොවේකියාව, ටායිවාන්, ජර්මන් පෙඩරල් සමූහ ආණ්ඩුව, ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහ ආණ්ඩුව, හන්ගේරියාව, ජපානය, කොරියාව, පෝලන්තය, රුමේනියා මහජන සමූහ ආණ්ඩුව, ස්පාඤ්ඤය, සෝවියට් රුසියාව, යුගෝස්ලේවියාව, වියට්නාම ප්‍රජාතන්ත්‍රවාදී සමූහ ආණ්ඩුව, ආදී රටවල්වලින් මෙම සැපයීම ආනයනය කර සැපයීමට බලාපොරොත්තු වන ටෙන්ඩර්කරුවන් වෙතොත්, ඔවුන් ලියා පදිංචි කරන ලද වෙළෙන්දන් විය යුතු අතර ආනයන පාලකතැන විසින් නිකුත් කරන ලද සාමාන්‍ය බඩු ගෙන්වීමේ වලංගු බලපත්‍රයක් ලත් ඇත්තෝ විය යුතුයි. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලීමේ දී ඉහත සඳහන් බලපත්‍රයක් හිමි බව ඔප්පු කළ යුතුවේ.

7. ටෙන්ඩර් කොන්දේසි සහ අනිකුත් විස්තර මෙම දැන්වීමේ 2 වැනි ඡෙදයේ සඳහන් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකතැනගේ කාර්‍යාලයෙන් (කොන්ත්‍රාත් සහ සැපයීමේ අංශය) ලබාගත හැක. මෙම කාර්‍යාලයෙන් ලබාගත් ආකෘති පත්‍ර, කොන්දේසි පත්‍ර ආදිය භාවිතකළ හැක්කේ ස්වදේශීය ටෙන්ඩර්කරුවන්ට පමණි.

8. මෙහි පළමුවැනි ඡෙදයෙහි සඳහන් පරිදි ටෙන්ඩර්කරු විසින් ස්වකීය ගණන් යෝජනාව ටෙන්ඩර් බාරගැනීමේ අවසාන දින සිට යටත් පිරිසෙයින් මාස 2ක් වත් විවෘතව තැබිය යුතුයි.

9. කෙලින් ම ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට කැමැති විදේශීය නිෂ්පාදන මූලිකවරුන් වෙත ඔවුන්ගේ ලංකා නියෝජිතයින් සහ ඒජන්තවරුන් විසින් ටෙන්ඩර් කොන්දේසි, උපලේඛන හා මෙම ටෙන්ඩරය පිළිබඳ සියලුම විස්තර පහත සඳහන් රටවල සිටින ලංකා ආණ්ඩුවේ නියෝජිතයින්ගෙන් ලබාගත හැකි බව දැන්විය යුතුවේ. මහා බ්‍රිතාන්‍යය, ඇමෙරිකා එක්සත් ජනපදය, ඉතාලිය, පකිස්ථානය, ජපානය, ප්‍රංශය, බටහිර ජර්මනිය, චීන මහජන සමූහ ආණ්ඩුව, සෝවියට් රුසියාව, කැනඩාව, නෙදර්ලන්තය, බෙල්ජියම, හන්ගේරියාව, බල්ගේරියාව, නැගෙනහිර ජර්මනිය, එක්සත් අරාබි සමූහ ආණ්ඩුව, බුරුමය, අයර්ලන්තය, අයිරානය, ඉරාකය, මාල දිවයින, උතුරු කොරියාව, ස්පාඤ්ඤය සහ ඉන්දියාව, බොම්බායේ සහ ඕස්ට්‍රේලියාවේ සිඩ්නිහි සිටින ලංකා වෙළඳ කොමසාරිස් හා ලංකාවේ සිටින විදේශීය ආණ්ඩුවල නියෝජිතවරු සහ ඉන්දියාවේ දිල්ලියේ සිටින ලංකාවේ විදේශීය නියෝජිතයින්ගෙන්.

10. ටෙන්ඩර්කරුවන් වෙත ටෙන්ඩර් ආකෘති පත්‍ර සමග නිකුත් කරන ටෙන්ඩර් කොන්දේසිවල 11 වැනි ඡෙදය කෙරෙහි ටෙන්ඩර්කරුවන්ගේ අවධානය යොමු කරනු ලැබේ. කොළඹ රජයේ බෙහෙත් ගබඩා අධිකාරීන්ට යැවිය යුතු මෙම බඩුවල ආදර්ශ භාණ්ඩ (සැම්පල්ස්) සම්බන්ධව විස්තර එම ඡෙදයෙහි සඳහන් කර ඇත. ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුත්තේ ටෙන්ඩර් පත් පමණි. ආදර්ශ භාණ්ඩ (සැම්පල්ස්) එහි තැන්පත් නොකළ යුතුයි. ටෙන්ඩර් පත් සමාප්ත කරන දිනයේ නියම වේලාවට ප්‍රමාදව ලැබුණු සැම්පල්ස් සැලකිල්ලට භාජනය කරනු නොලැබේ.

11. මෙහි 1 වැනි ඡෙදයේ සඳහන් ස්ථානයේ දී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේ සෑම ටෙන්ඩර්කරුවෙකුට ම එම ස්ථානයේ සිටීමට අවසර තිබේ. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ මිල ගණන් එහි පැමිණ සිටි ටෙන්ඩර්කරුවන්ට කියවනු ලැබේ. ලැබී තිබුන ටෙන්ඩරයක් පරීක්ෂාකර බැලීමට යම්කිසි ටෙන්ඩර්කරුවෙකුට අවශ්‍ය නම්, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන සමග කටයුතු පිළියෙල කර ගැනීමෙන් පසු එසේ පරීක්ෂා කර බැලීමට ඉඩදෙනු ලැබේ.

ඇස්. බාලක්‍රිෂ්ණන්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
කොළඹ, 1965.6.7.

## අදල උපලේඛනය

| විෂය අංකය | විස්තරය | ඇස්තමේන්තු කළ අවශ්‍යතා | අවශ්‍ය ඇසිරීම් |
|---|---|---|---|
| 1 ... | ටෙට්‍රාසයික්ලින් හයිඩ්‍රොක්ලෝරයිඩ් බි.පි. සෑම කැප්සූලයකම මි.ග්‍රෑ. 250 ක් අඩංගු විය යුතුය | කැප්සූල 30,00,000 ... | කැප්සූල 100 බැගින් අඩංගු කිරල ඇබගැසූ දැති මූඩිවලින් වැසූ බෝතල් තුළ |
| 2 ... | ෆෙනොක්සිමෙතිල් ප්‍රොකේන් පෙනිසිලින් ජී නික්ෂේපය බි.පි. සෑම වයලයකම ප්‍රොකේන් පෙනිසිලින් ජී ඒකක 3,00,000 හා ක්‍රිස්ටලින් පෙනිසිලින් ජී ඒකක 1,00,000 අඩංගු විය යුතුය | වයල් (කුප්පි) 25,00,000 ... | හැකි ඕනෑම පහසු ඇසිරීමක් |
| 3 ... | ක්‍රිස්ටලින් පෙනිසිලින් ජී බි.පි. සෑම වයලයක ම ඒකක 10,00,000 බැගින් අඩංගු විය යුතු | වයල් 28,00,000 ... | එම |
| 4 ... | ක්‍රිස්ටලින් පෙනිසිලින් ජී බි.පි. සෑම වයලයක ම ඒකක 5,00,000 අඩංගු විය යුතුය | වයල 18,50,000 ... | එම |
| 5 ... | සල්ෆඩයසින් බි.පි. 0·5 ග්‍රෑම් ... ... | පෙති 1,50,00,000 ... | පෙති 1,000 හේ දාර මුද්‍රා තැබූ ටින් තුළ |
| 6 ... | සල්ෆඩිමිඩින් බි.පි. 0·5 ග්‍රෑම් ... ... | පෙති 3,50,00,000 ... | එම |
| 7 ... | තලිල්සල්ෆතයසෝල් බි.පි. 0·5 ග්‍රෑම් ... ... | පෙති 75,00,000 ... | එම |
| 8 ... | මෙතොක්සමින් හයිඩ්‍රොක්ලෝරයිඩ් බි.පි.සී. 1963 නික්ෂේපනය. සෑම ඒකකයකම මි.ග්‍රෑ. 20 බැගින් අඩංගු විය යුතුය. ඉන්ට්‍රාවීනස් සහ ඉන්ට්‍රාමැස්කුලර් යන දෙවිධියේම ප්‍රයෝජනයට සුදුසු සහ එලෙස ලේබල් කළ යුතු | 1,60,000 ඇම්පියල $\times$ 1 සිසි | ඇම්පියුල 25හේ පෙට්ටි තුළ |

**බාරදීමේ ක්‍රමය :**

මෙහි අංක 1 සිට 8 දක්වා වූ විෂයයන් ඉතා කිට්ටු සමාන තොග 3 කින් කොළඹ, රජයේ බෙහෙත් ගබඩාවට ගෙනැවිත් බාර දිය යුතු වෙයි. පළමු වෙනි තොගය ඇනවුම් කළ දින සිට මාස 3 ක් ඇතුළත ද, ඉතිරි තොග 2, ඉන්පසු එන මාස 3 කට වරක් ද සැපයිය යුතුය.

ටෙන්ඩර්කරු ණයවර ලිපියක් විවෘත කරන ලෙස ආණ්ඩුවෙන් ඉල්ලා සිටින්නේ නම් මෙම සැපයීමේ ඇහිරීම් සහ අනිකුත් සියළුම ගාස්තු සහිතව සඳහන් කරන ලද මිළ ගණන සහ කොළඹට ගෙන ඊමේ ගාස්තු සහිත මිල, බෙහෙත් නිෂ්පාදන රටේ මුදලින් හා ලංකා මුදලින් ද සඳහන් කළ යුතු වෙයි. නාවික මාරුකිරීම්වලට ඉඩ දෙනු නොලැබේ.

මෙම සැපයීමේ සියලුම විෂයයන් සහ ඒවා බහා එවන සෑම භාජනයක ම '' ඔටුන්න ලකුණ '' සහ '' සී/සී. එම්එස් 2498/64–65 '' යනුවෙන් සඳහන්ව තිබිය යුතුය.

6–500—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

යොමු අංකය : එජ්. ටී. සී. 23/65.

## සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

### සෝඩියම් ලැක්ටේට් ආදිය සැපයීම

මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි සඳහන් පරිදි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තැනට සෝඩියම් ලැක්ටේට් ආදිය සැපයීම සඳහා එවන ටෙන්ඩර් පත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1965.9.14 වෙනි අඟහරුවාදා උදේ 10 දක්වා බාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුවේ. ඒ සඳහා අවශ්‍ය ටෙන්ඩර් ආකෘති පත්‍ර කොළඹ ඩීන්ස් පාරේ අංක 355 දරණ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) කාර්යාලයෙන් ලබාගත හැක. මෙම දැන්වීමේ 5 වැනි 6 වැනි ඡේදයන්හි සඳහන් කරුණු අනුව 1965.9.13 වෙනි සඳුදා උදේ 10 දක්වා ඉල්ලුම්කරුවන් වෙත ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

3. සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත් සීල් තබන ලද කවරයක බහා, සභාපති තැන, ටෙන්ඩර් මණ්ඩලය, සෞඛ්‍ය හා නිවාස අමාත්‍යාංශය, තැ.පෙ. 500, පළමුවෙනි මහළ, මහා ලේකම් ගොඩනැගිල්ල, ගාලු මුවදොර, කොළඹ, යන ලිපිනයට එවිය යුතුවේ. සීල් තබන ලද ටෙන්ඩර් පත් බහාලන කවරයේ වම් කෙළවරේ උඩ ''සෝඩියම් ලැක්ටේට් ආදිය සැපයීම සඳහා ටෙන්ඩර් 1965.9.14 උදේ 10 ට'' යනුවෙන් සඳහන් කළ යුතුවේ.

4. ටෙන්ඩර් පත් ගාලු මුවදොර මහා ලේකම් ගොඩනැගිල්ලේ පිහිටි සෞඛ්‍ය අමාත්‍යාංශයේ, කාමර අංක 155හේ ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීම හෝ ලියා පදිංචි කළ තැපෑලෙන් හෝ එවීම කළහැක. එහෙත් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින්, තමන්ට අවශ්‍ය යයි හැඟේ නම් සීල් තබන ලද ටෙන්ඩර්පත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ උප ලේකම් තැන වෙත පුද්ගලිකව ගෙනැවිත් බාරදීමද කළ හැක. එසේ බාරදෙන සීල් තබන ලද කවරයේ එය කිනම් සැපයීමක් සඳහාද යනවග හා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතු වේ. එම ටෙන්ඩර් පත් බාර ගැනීම සඳහා ඉහතකී නිලධාරි තැනට බලය ඇත. සීල් තබන ලද ටෙන්ඩර් පත් බාරගත් බවට කුවිතාන්සියක් එවිට ටෙන්ඩර්කරු වෙත ඔහු විසින් නිකුත් කරනු ලැබේ.

5. සුප්‍රසිද්ධ නිෂ්පාදන සමාගමක ඒජන්ත වරයෙකුට හෝ වෙළඳ නියෝජිතයෙකුට වුවද ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. එහෙත් අයදුම්කරු නම් කරන ලද නිෂ්පාදන සමාගමේ නියෝජිත ඒජන්ත වරයෙකු බව සහතික කළ යුතු වේ. (මේ සඳහා නියෝජිතත්වය ඔප්පු කිරීමක් ඉදිරිපත් කළ යුතුවේ.)

6. 1955 ඔක්තෝබර් 28 වෙනි දින අංක 10,854 දරණ ලංකා ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ සඳහන් අයුරු, සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 1949 සහ අංක 25 දරණ ආහාර සහ ඖෂධ පනත යටතේ පනවන ලද රෙගුලාසි අනුව, ඖෂධ විකිණීම සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තැනගෙන් ලබාගත් වලංගු බල පත්‍රයක් ඇති, බලයලත් වෙළඳුන්ගෙන් පමණක් මෙම සැපයීම සඳහා ටෙන්ඩර් පත් බාරගනු ලැබේ. ලාංකික සම්බන්ධතා ඇති රටවල් වූ ඇල්බේනියාව, ඕස්ත්‍රියාව, බල්ගේරියාව, චීන මහජන සමූහ ආණ්ඩුව, චෙකොස්ලොවේකියාව, ටායිවාන්, ජර්මන් ෆෙඩරල් සමූහ ආණ්ඩුව, ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහ ආණ්ඩුව, හන්ගේරියාව, ජපානය, කොරියාව, පෝලන්තය, රුමේනියා මහජන සමූහ ආණ්ඩුව, ස්පාඤ්ඤය, සෝවියට් රුසියාව, යුගෝස්ලේවියාව, වියට් නාම් ප්‍රජාතන්ත්‍රවාදී සමූහ ආණ්ඩුව, ආදී රටවල්වලින් මෙම සැපයීම ආනයනය කර සැපයීමට බලාපොරොත්තු වන ටෙන්ඩර්කරුවන් වෙතොත්, ඔවුන් ලියා පදිංචි කරන ලද වෙළෙන්දන් විය යුතු අතර ආනයන පාලක තැන විසින් නිකුත් කරන ලද සාමාන්‍ය බඩු ගෙන්වීමේ වලංගු බලපත්‍රයක් ලත් ඇත්තන් විය යුතුයි. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලීමේ දී ඉහත සඳහන් බලපත්‍රයක් හිමි බව ඔප්පු කළ යුතුවේ.

7. ටෙන්ඩර් කොන්දේසි සහ අනිකුත් විස්තර මෙම දැන්වීමේ 2 වැනි ඡෙදයෙ සඳහන් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තැනගේ කාර්යාලයෙන් (කොන්ත්‍රාත් සහ සැපයීම් අංශය) ලබාගත හැක. මෙම කාර්යාලයෙන් ලබාගත් ආකෘති පත්‍ර, කොන්දේසි පත්‍ර ආදිය භාවිතාකල හැක්කේ ස්වදේශීය ටෙන්ඩර් කරුවන්ට පමණි.

8. මෙහි පළමුවැනි ඡේදයෙහි සඳහන් පරිදි ටෙන්ඩර්කරු විසින් ස්වකීය ගණන් යෝජනාව ටෙන්ඩර් බාරගැනීමේ ආවසන දින සිට යටත් පිරිසෙයින් මාස 2ක් වත් විවෘතව තැබිය යුතුයි.

9. කෙලින්ම ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට කැමති විදේශීය නිෂ්පාදක මූලිකවරුන් වෙත ඔවුන්ගේ ලංකා නියෝජිතයින් සහ ඒජන්තවරුන් විසින් ටෙන්ඩර් කොන්දේසි, උපලේඛන හා මෙම ටෙන්ඩරය පිළිබඳ සියලුම විස්තර පහත සඳහන් රටවල සිටින ලංකා ආණ්ඩුවේ නියෝජිතයින්ගෙන් ලබාගත හැකි බව දැන්විය යුතුවේ. මහා බ්‍රිතාන්‍යය, ඇමෙරිකා එක්සත් ජනපදය, ඉතාලිය, පකිස්ථානය, ජපානය, ප්‍රංශය, බටහිර ජර්මනිය, චීන මහජන සමූහ ආණ්ඩුව, සෝවියට් රුසියාව, කැනඩාව, නෙදර්ලන්තය, බෙල්ජියම, හන්ගේරියාව, බල්ගේරියාව, නැගෙනහිර ජර්මනිය,එක්සත් අරාබි සමූහ ආණ්ඩුව බුරුමය, අයර්ලන්තය, අයිරානය, ඉරාකය, මාල දිවයින, උතුරු කොරියාව, ස්පාඤ්ඤය, සහ ඉන්දියාව බොම්බායේ සහ ඕස්ට්‍රේලියාවේ සිඩ්නි හි සිටින ලංකා වෙළඳ කොමසාරිස් සහ ලංකාවේ සිටින විදේශීය ආණ්ඩුවල නියෝජිතවරු සහ ඉන්දියාවේ දිල්ලියේ සිටින ලංකාවේ විදේශීය නියෝජිතයින්ගෙන්.

**10. ටෙන්ඩර්කරුවන් වෙත ටෙන්ඩර් ආකෘති පත්‍ර සමග නිකුත් කරන ටෙන්ඩර් කොන්දේසිවල 11 වැනි ඡෙදය කෙරෙහි ටෙන්ඩර්කරුවන්ගේ අවධානය යොමු කරනු ලැබේ. කොළඹ රජයේ බෙහෙත් ගබඩා අධිකාරීන්ට යැවිය යුතු මෙම බඩුවල ආදර්ශ භාණ්ඩ (සැම්පල්ස්) සම්බන්ධව විස්තර එම ඡේදයෙහි සඳහන් කර ඇත. ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුත්තේ ටෙන්ඩර් පත් පමණි. ආදර්ශ භාණ්ඩ (සැම්පල්ස්) එහි තැන්පත් නොකළ යුතුයි.** ටෙන්ඩර් පත් සමාප්ත කරන දිනයේ නියම වේලාවට ප්‍රමාදව ලැබුණු සැම්පල්ස් සැලකිල්ලට භාජනය කරනු නොලැබේ.

11. මෙහි 1 වැනි ඡේදයේ සඳහන් ස්ථානයේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේ සෑම ටෙන්ඩර්කරුවෙකුටම එම ස්ථානයේ සිටීමට අවසර තිබේ. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ මිල ගණන් එහි පැමිණි සිටි ටෙන්ඩර්කරුවන්ට කියවනු ලැබේ. ලැබී තිබුණ ටෙන්ඩරයක් පරීක්ෂාකර බැලීමට යම්කිසි ටෙන්ඩර්කරුවෙකුට අවශ්‍ය නම්, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන සමග කටයුතු පිළිසෙල කර ගැනීමෙන් පසු එසේ පරීක්ෂා කර බැලීමට ඉඩ දෙනු ලැබේ.

ඇස්. බාලක්‍රිෂ්ණන්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක වෙනුවට.

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
කොළඹ, 1965 ජූනි 3.

### අදාල උප ලේඛනය

| විෂය අංකය | විස්තරය | ඇස්තමේන්තු කළ අවශ්‍යතා | අවශ්‍ය ඇසිරීම |
|---|---|---|---|
| 1 | සෝඩියම් ලැක්ටේට් ඉන්ජෙක්ෂන් යූ. එස්. පී. XVI (1960) ඉන්ජෙක්ෂන් සඳහා වූ වතුරෙහි සෝඩියම් ලැක්ටේට් 1.900ඩබලිව/වී (1/6 මෝලර්) අඩංගු නහරගත කිරීමට සුදුසු හා එල්ලා තැබීමට උපකරණ සහිතව | බෝතල් 8,000 × 500සීසී ... | සුදුසු ඇහිරීම් ක්‍රමයක් |
| 2 | ප්‍රෝටීන් හයිඩ්‍රොලිසේට් 5%යූ. ඒස්. පී. ඉන්ජෙක්ෂන් XVI (1960) සහ 5%ඩබ./වී. ඩෙක්ස්ට්‍රෝස් සොලිව්ෂන් නහරගත කිරීමට සුදුසු එල්ලා තැබීමට උපකරණ සහිතව ... ... ... | බෝතල් 7,500 × 500සීසී ... | එම |
| 3 | ඩෙක්ස්ට්‍රෝස් සහ හාෆ් නෝර්මල් සේලයින් ඩෙක්ස්ට්‍රෝස් 5% ඩබ./වී. සහ සෝඩියම් ක්ලෝරයිඩ් 0.45%ඩබ./වී. අඩංගු ඉන්ජෙක්ෂන් සඳහා වූ වතුරවල, නහරගත කිරීමට සුදුසු එල්ලා තැබීමට උපකරණ සහිතව... | බෝතල් 50,000 × 500සීසී ... | එම |
| 4 | ඩැරෝස් සොලිව්ෂන් සෝඩියම් ලැක්ටේට් 0.59%ඩබ./වී. සෝඩියම් ක්ලෝරයිඩ් 0.4%ඩබ./වී. පොටෑසියම් ක්ලෝරයිඩ් 0.26%ඩබ./වී. ඉන්ජෙක්ෂන් සඳහා වූ වතුරවල, බී. පී. නහරගත කිරීමට සුදුසු එල්ලා තැබීමට ක්‍රමයක් සහිතව ... ... ... | බෝතල් 9,000 × 500සීසී ... | එම |

| විෂය අංකය | විස්තරය | ඇස්තමේන්තු කළ අවශ්‍යතා | අවශ්‍ය ඇසිරීම |
|---|---|---|---|
| 5 | සෝඩියම් ලැක්ටේට් කොම්පවුන් බී. පී. ඉන්ජෙක්ෂන් (ස්ටරයිල් හාට් මන්ස් සොලිව්ෂන් ඉන්ජෙක්ෂන්) නහරගත කිරීමට සුදුසු ... | බෝතල් 7,500 × 500සීසී ... | සුදුසු ඇහිරීම් ක්‍රමයක් |
| 6 | ස්ටරයිල් නෝමල් සේලයින් 0.9%ඩබ./වී. ඉන්ජෙක්ෂන් බී. පී. (සෝඩියම් ක්ලෝරයිඩ් ඉන්ජෙක්ෂන් බී. පී.) නහරගත කිරීමට සුදුසු එල්ලා තැබීමට ක්‍රමයක් සහිතව ... ... ... | බෝතල් 2,40,000 × 500සීසී ... | එම |
| 7 | ස්ටරයිල් ඩෙ‍්‍ර්ක්ස්ට්‍රෝස් ඉන්ජෙක්ෂන් බී. පී.5% ඩබ:/වී. නහරගත කිරීමට සුදුසු සෑම බෝතලයක එල්ලා තැබීමට උපකරණ සහිතව ... | බෝතල් 4,00,000 × 500සීසී ... | එම |
| 8 | ඉන්ජෙක්ෂන් 6%ඩබ./වී. ඩෙක්ස්ට්‍රොන් සොලිව්ෂන් 0.9%ඩබ./වී. සෝඩියම් ක්ලෝරයිඩ් සොලිව්ෂන් නහරගත පාලනයට සුදුසු එල්ලා තැබීමට උපකරණ සහිත්ව ... ... ... | බෝතල් 6,000 × 500සීසී ... | එම |
| 9 | ඩෙක්ස්ට්‍රෝස් ඉන්ජෙක්ෂන් බී. පී. 25%සෑම ඇම්පියුලයකම සොලුයුෂන් 25 සීසී අඩංගු නහරගත කිරීමට සුදුසු... ... ... | ඇම්පියුල 4,50,000 ... | ඇම්පියුල 100යේ පෙට්ටි තුළ |
| 10 | ඩෙක්ස්ට්‍රෝස් ඉන්ජෙක්ෂන් බී. පී. 50%ඩබ./වී. සෑම ඇම්පියුලයකම 50සීසී අඩංගු නහරගත කිරීමට සුදුසු ... ... ... | ඇම්පියුල 2,25,000 ... | එම |
| 11 | ඉවත දැමිය හැකි ගිවින් කට්ටල-දියර ඉවත ගලා යන සහ වාතය ඇතුලට ගලා එන නලයක් තිබිය යුතු ... ... ... | 30,00,000 පමණයි ... | සුදුසු පහසු ඇහිරීම් ක්‍රමයක් |

**භාරදීමේ ක්‍රමය.**—මෙහි අංක 1 සිට 11 දක්වා වූ විෂයන් ඉතා කිට්ටු සමාන තොග 3කින් කොළඹ රජයේ බෙහෙත් ගබඩාවට ගෙනැවිත් බාර දිය යුතුය. පළමු වන තොගය ඇනයුම් කළ දින සිට මාස 3ක් ඇතුළත ද, ඉතිරි තොග 2 ඉන්පසු එවන මාස 3කට වරක් ද සැපයිය යුතු වෙයි.

ටෙන්ඩර්කරු ණයවර ලිපියක් විවෘත කරන ලෙස ආණ්ඩුවෙන් ඉල්ලා සිටින්නේ නම්, මෙම සැපයීමේ ඇහිරීම් සහ අනිකුත් සියළුම ගාස්තු සහිතව සඳහන් කරන ලද මිල ගණන සහ කොළඹට ගෙන ඊමේ ගාස්තු සහිත මිල බෙහෙත් නිෂ්පාදන රටේ මුදලින් හා ලංකා මුදලින් ද සඳහන් කළ යුතු වෙයි. නාවික මාරු කිරීම්වලට ඉඩ දෙනු නොලැබේ.

මෙම සැපයීමේ සියළුම විෂයන් සහ ඒවා බහා එවන සෑම භාජනයකම ''ඔටුන්න ලකුණ'' හා සී/සීඑම්එස් 2529/65-66 යනුවෙන් සඳහන් කළ යුතුය.

6-501—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව—ගාල්ල කොට්ඨාශය

### කිරි නොමැති පිසු ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1965 ඔක්තෝබර් 1 වනද සිට 1966 සැප්තැම්බර් 30 වනද දක්වා දින (දෙකම ඇතුළත්ව) කාලය තුළ, මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැති පිසු ආහාර සැපයීම සඳහා ලාංකිකයන් ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සිල් තබන ලද ටෙන්ඩර් පත්‍ර ගාල්ලේ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි කාර්‍යාලයේ දී සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම හා විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලට ද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා, එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම හෝ සමිතිවල ලියා පදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුයි.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්‍යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්‍යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබා ගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට සෑළකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරිනට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල් අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට මේ සමඟ ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා '' සෞඛ්‍ය සේවා අධිකාරි, ගාල්ල'', කියා එවිය යුතුයි. සිල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා දැයි පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර්පත් මෙම කාර්‍යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියා පදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරි/ලේකම් තැනට භාරදෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුණ බවට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

6. **ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන්වූ වහාම ඒවා මෙම කාර්‍යාලයේ දී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කලින් පිළියෙල කරගත් දිනයක මා විසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි තීරණය.**—ටෙන්ඩර් පත් තෝරා ගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයේ '' බී '' උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තුවන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම්වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයෙහි '' සී '' උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් සඳහන් මිළ ගණන හෝ එවකට වෙළඳ පොලේ පවතින මිළ ගණන හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් පවතී නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාලසීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාලසීමාව ඉකුත්වනතුරු වලංගුවේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුයි.

11. **බඩුබාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩුබාහිරාදිය ගබඩාකර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩකඩ සළසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකුවීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදියයුතු ද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසි ද ටෙන්ඩර් කරුවන් විසින් සැළකිය යුතුය.

ඒ. නාගේන්ද්‍රන්,
සෞඛ්‍ය සේවා අධිකාරි, ගාල්ල.

1965 ජූනි 1 වෙනි දින,
ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරි කාර්‍යාලයේදීය.

උපලේඛනය

| (1) | (2) | (3) | (4) | (5) | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | ආහාර ප්‍රමාණය දළ වශයෙන් | | | | | | | |
| | | | | සේවකයින්ට | | | | නොගෙවන රෝගීන්ට | | | |
| ආයතනය | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. | ඇප මුදල රු. | ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය සහ වේලාව | මාළු | මස් | කරවල | එළවළු | මාළු | මස් | කරවල | එළවළු |
| අම්බලන්ගොඩ රෝහල ... | 100... | 400 | 1965.7.15 පෙ.ව. 10 ට | 250... | 250... | 250... | 1,000... | 700... | 800... | 800... | 3,100 |
| බද්දේගම ගැමි රෝහල සහ මාතෘ නිවාසය | 100... | 800 | | 100... | 100... | 100... | 400... | 1,250... | 1,300... | 1,250... | 5,100 |
| බොරකන්ද ගැමි රෝහල ... | 100... | 600 | | 100... | 100... | 100... | 500... | 1,150... | 1,100... | 1,050... | 4,300 |
| හික්කඩුව ගැමි රෝහල සහ මාතෘ නිවාසය | 100... | 600 | | 200... | 150... | 200... | 750... | 850... | 850... | 900... | 3,450 |
| හිනිදුම රෝහල ... ... | 300... | 800 | | 300... | 300... | 350... | 1,300... | 1,550... | 1,300... | 1,350... | 5,750 |
| ඉමදූව ගැමි රෝහල සහ මාතෘ නිවාසය | 100... | 800 | | 350... | 300... | 350... | 1,300... | 1,800... | 1,800... | 1,750... | 7,200 |
| ඉදුරුව ගැමි රෝහල සහ මාතෘ නිවාසය | 100... | 600 | | 200... | 200... | 200... | 750... | 700... | 700... | 650... | 2,750 |
| උණවටුන රෝහල ... ... | 100... | 800 | | 300... | 300... | 300... | 1,200... | 1,550... | 1,600... | 1,500... | 6,250 |

6–341/1—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

### ජාතික කිරි ව්‍යාපාරය—පිරිසිදු එළකිරි එහා මෙහා ගෙනයාම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයන් හා සේවා.**—වර්ෂ 1965 ඔක්තෝබර් මස 1 වනදා සිට 1966 සැප්තැම්බර් මස 30 වෙනිද දක්වා (දෙදින ඇතුළුව) කාලය තුල මේ සමඟ ඇති උපලේඛනයෙහි පළමුවන තීරයෙහි සඳහන් වන ආයතනයන්ට දුම්රිය ස්ථානවල/සෞඛ්‍ය කාර්‍යාලවල සිට කිරි මධ්‍යස්ථානවලට එළකිරි ගෙනයාම සඳහා ලාංකිකයන් ගෙන් සහ ලාංකික වෙළඳ සමාගම් විසින් එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—රුපියල් 100 ක තැන්පත් මුදලක්, මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල මඩකලපුව, කොළඹ, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන තැන්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්‍යාලවලින් හෝ ලබා ගත හැක. නියමිත පෝරමයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් ෆෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ සැළකිය යුතු කාලයට පළමු තම වත්කම, මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දැන්විය යුතුය. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—එහා මෙහා ගෙන යා යුතු පිරිසිදු එළකිරි ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට මේ සමඟ ඇති උපලේඛනයෙහි 3 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා '' සෞඛ්‍ය සේවා අධිකාරි, ගාල්ල '' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහාද යන්න පැහැදිළිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම් පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිළිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්‍යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම මගේ ලේකම්/ගණකාධිකාරි මහතාට දීමෙන් ඒ ලැබුනු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමේ හෝ ලියා පදිංචි තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි, පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**— ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නාම සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන්ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කටයුතු පිළියෙල කර ගැනීම හෝ ම විසින් බලය පවරනු ලැබූ නියෝජිතයකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිල ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිල ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත් වනතුරු වලංගුවේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිල ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු ම විසින් නියම කරන ඇප මුදල් තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුයි.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් හැර පිළිපැදිය යුතු ද වන්නේය.

11. **වෙනත් විස්තර.**—තවදුරටත් විස්තර දැන ගැනීම සඳහා මෙහි දෙවන ඡේදයෙහි සඳහන් කුමන කාර්යාලයකින් හෝ ඉල්ලුම් පත්‍රයක් මගින් පුළුවන.

1965 ජූනි මස 1 වැනි දින,
ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේදීය.

ඒ. නාගේන්ද්‍රන්,
ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරි.

## උපලේඛනය

| 1<br>සේවය | 2<br>ප්‍රදේශය | 3<br>ප්‍රමාණය පයින්ට් | 4<br>අවසාන දිනය |
|---|---|---|---|
| ගාලු කඩවත් සතර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කාර්යාලයේ සිට ගාලු කඩවත් සතර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | ගාල්ල ... | 12,510 ... | 20.7.65 |
| බද්දේගම සෞඛ්‍ය කාර්යාලය භාර නිලධාරි තැනගේ කාර්යාලයේ සිට බද්දේගම සෞඛ්‍ය කාර්යාල භාර නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට ... | බද්දේගම ... | 12,895 ... | 20.7.65 |
| අම්බලන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කාර්යාලයේ සිට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට ... ... | අම්බලන්ගොඩ ... | 10,800 ... | 20.7.65 |
| ඉඳුරුවේ සෞඛ්‍ය කාර්යාලය භාර නිලධාරිතැනගේ කාර්යාලයේ සිට ඒ නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට ... ... | ඉඳුරුව ... ... | 7,401 ... | 20.7.65 |
| ඇල්පිටිය සෞඛ්‍ය කාර්යාලය භාර නිලධාරි තැනගේ කාර්යාලයේ සිට ඒ නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට ... ... | ඇල්පිටිය ... | 6,045 ... | 20.7.65 |
| උණවටුනේ සෞඛ්‍ය කාර්යාලය භාර නිලධාරි තැනගේ කාර්යාලයේ සිට ඒ නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට ... ... | උණවටුන ... | 8,700 ... | 20.7.65 |

6–341/2—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ජාතික කිරි ව්‍යාපාරය—පිටි කිරි සහ සීනි එහා මෙහා ගෙනයාම

1965 ඔක්තෝබර් 1 වෙනිදා සිට 1966 සැප්තැම්බර් 30 වෙනිදායින් අවසන් වෙන වර්ෂය තුළ මේ සමග ඇති උපලේඛනයේ ටෙන්ඩර් පිළිබඳ දක්වා ඇති පිටිකිරි සහ සීනි, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ගේ කාර්යාලවල සහ ගබඩාවල සිට/සෞඛ්‍ය කාර්යාල භාර නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කාර්යාල සහ ගබඩාවල සිට දිස්ත්‍රික් පරිපාලකවරයින්ගේ කාර්යාල සහ ගබඩාවල සිට/දුම්රිය ස්ථානවල සිට/පිටිකිරි සහ සමුපකාර සංගම්වල සිට/සීනි, කිරි මධ්‍යස්ථානවලට ගෙනයාම සඳහා උපලේඛනයේ සඳහන් එක් එක් සේවය සඳහා වෙන වෙනම සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් ලාංකිකයන්ගෙන් සහ ලාංකික වෙළඳ සමාගම්වලින් භාරගනු ලැබේ? සෞඛ්‍ය මධ්‍යස්ථානවල සිට හෝ වෛද්‍ය ආයතනවල සිට නියමිත ගාස්තුවලට අඩක් හෝ නියමිත ගාස්තුවට අඩුවෙන් දුම්රිය ස්ථානවලට නරක් වූ කිරිපිටි ප්‍රවාහණය කිරීමද මීට ඇතුළත් ය.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයෙහි දෙවන ඡේදයෙහි සඳහන් පරිදි, රු.100ක තැන්පත් මුදලක්, මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට කලින් දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන තැන්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට කලින් ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ සැලකිය යුතු කාලයකට කලින් තම වත්කම, මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන් ට හෝ දැන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡේදයේ සඳහන් ඕනෑම තැනකින් ලබා ගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම් හෝ මුදල් තත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දැන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල් අහිමිවන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—එහා මෙහා ගෙන යායුතු පිටිකිරි සහ සීනි දළ වශයෙන් දැන ගැනීමට මේ සමග ඇති උපලේඛනයෙහි 3 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා ''සෞඛ්‍ය සේවා අධිකාරි, ගාල්ල'' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවන් සඳහාද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන් ම එහි වම් පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ලේකම්/ගණකාධිකාරි මහතාට දීමෙන් ඒ ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියා පදිංචි තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි, පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටිය ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරන ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරු කර ගැනීමට මා සමඟ කටයුතු පිළියෙල කර ගැනීම හෝ ම විසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාල සීමාව ඉකුත්වනතුරු වලංගුවේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබද ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් මුදල්.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මා විසින් නියම කරන ඇප මුදල් තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුයි.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන් වීමට බලාපොරොත්තු වන්නන්, එහි අඩංගු කොන්දේසි හොඳින් දැන ගත යුතුවාක් හැර පිළිපැදිය යුතු ද වන්නේය.

11. **වෙනත් විස්තර.**—තවදුරටත් විස්තර දැන ගැනීම සඳහා මෙහි දෙවන ඡේදයෙහි සඳහන් කුමන කාර්යාලයකින් හෝ ඉල්ලුම් පත්‍රයක් මගින් පුළුවන.

ඒ.නාගේන්ද්‍රන්,
සෞඛ්‍ය සේවා අධිකාරි, ගාල්ල.

1965 ජූනි මස 1 වෙනි දින,
ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරි කායර්‍යාලයේ දීය.

### උපලේඛනය

| (1) සේවය | (2) ප්‍රදේශය | (3) දෙමසකට වතාවක් සැපයිය යුතු පිටිකිරි හා සීනි ප්‍රමාණය දළ වශයෙන් — පිටිකිරි හො. | සීනි හො. | (4) අවසන් දිනය |
|---|---|---|---|---|
| ගාල්ලේ කොට්ඨාශය— | | | | |
| හික්කඩුව දුම්රිය ස්ථානයේ සිට පිටිකිරි බද්දේගම ගහබොඩ පත්තු සමුපකාර සංගමයේ සිට සීනි, බද්දේගම සෞඛ්‍ය කාර්යාලයට සහ බද්දේගම සෞඛ්‍ය කාර්යාලය භාර නිලධාරි තැනගේ කොට්ඨාශයේ තිබෙන කිරි මධ්‍යස්ථානවලට ගෙන යාමට ... | බද්දේගම ... | $2\frac{3}{4}$ ... | 1 ... | 20.7.65 |
| ගාල්ලේ දුම්රිය ස්ථානයේ සිට පිටිකිරි සහ ගාල්ල සමුපකාර සංගමයේ සිට සීනි, උණවටුන සෞඛ්‍ය කාර්යාලයට සහ උණවටුන සෞඛ්‍ය කාර්යාලය භාර නිලධාරි තැනගේ කොට්ඨාශයේ තිබෙන කිරි මධ්‍යස්ථානවලට ගෙන යාමට ... ... | උණවටුන ... | $20\frac{1}{2}$ ... | $7\frac{3}{4}$ ... | 20.7.65 |

6-341/3—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව—ගාලු දිස්ත්‍රික්කය

### කිළිටි රෙදි සේදීම

**සේවය සහ ටෙන්ඩර්කරුවන්ගේ සුදුසුකම්**—1965 ඔක්තෝබර 1 වැනි දින සිට 1966 සැප්තැම්බර් 30 වනදයින් (දින දෙකත් ඇතුළුව) අවසන් වන වර්ෂය තුළ මෙහි පහත සඳහන් උපලේඛනයේ පළමුවෙනි වගන්තියෙහි දක්වා තිබෙන ආයතනයන්හි කිළිටි රෙදි සේදීම සඳහා ලාංකිකයන් හා ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරි විසින් භාරගනු ලැබේ.

2. **ටෙන්ඩර් තැන්පත් මුදල්.**—(i) මෙම උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට, කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත යුතුයි. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම් වලට අයිති සමිතිවලට ද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්ලිය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි කළ අංකය පැහැදිලිව සඳහන් කළ යුතු ය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් ද ආයතනයන් භාර වෛද්‍ය නිලධාරීන්ගෙන් ද ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාර ගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතු යි.

ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතු යි.

3. **වත්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට සැළකිය යුතු කාලයකට පළමු තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට සතුටු ආයතන භාර වෛද්‍ය නිලධාරියාට හෝ දැන්විය යුතු යි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡේදයේ දෙවන කොටසේ සඳහන් ඕනෑ ම තැනකින් ලබාගත හැක.

වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල් අහිමිවන්නට ඉඩ තිබේ.

4. **සෝදන කෑලි ප්‍රමාණය පිළිබඳ විස්තර.**—දළ වශයෙන් මාසයකට සේදිය යුතු කෑලි ප්‍රමාණය මේ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි වගන්තියෙහි දක්වා ඇත.

5. **ටෙන්ඩර් පත් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා ''සෞඛ්‍ය සේවා අධිකාරි, ගාල්ල'' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවද යන්න පැහැදිලිව සඳහන් කළයුතුවාත් මෙන්ම, එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතු ය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරී/ලේකම් මහතාට (හෝ මාහට) දීමෙන් ඒ ලැබුණු බවට ඔහු/හෝ මවිසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියා පදිංචි කළ තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 6 තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමහ කටයුතු පිළියෙල කරන ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායෙන් පිටපත් පරීක්ෂා කළ හැකි ය.

8. **ටෙන්ඩරයන්හි සඳහන් කරන ලද මිළ ගණන් වළංගු කාල සීමාව**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාල සීමාව ඉකුත් වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම්, එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් ඇප මුදල්.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතු ය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන් වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාත් හැර, පිළිපැදිය යුතුද වන්නේ ය.

11. **අනික් විස්තර.**—(i) කොන්ත්‍රාත්කරුවන්ට ගබඩා, විදුලි බලය, ජලය ආදී පහසුකම් සැලසුවහොත් ඊට යන වියදම් ආදිය පළාතේ ආදායම් පාලක නිලධාරි තුමා තක්සේරු කළ ගණන්වලට අනුව වවුචරයෙන් කපාගනු ලැබේ.

(ii) **කිළිටු රෙදිවල විෂබීජ නැති කිරීම සහ එහා මෙහා ගෙන යෑමේ වියදම්.**—යම් අවස්ථාවක කිළිටි රෙදි සේදීමට පළමු ඒවායේ විෂබීජ නැති කිරීම සඳහා වෙන ස්ථානයකට ගෙනයාමට සිදුවුවහොත් ඒවා එහා මෙහා ගෙන යාමට කිසිම ගාස්තුවක් ගෙවනු නොලැබේ.

(iii) **පළාත් පාලන මණ්ඩලවල පිහිටා ඇති ආයතනයන් සඳහා ටෙන්ඩර්.**—පළාත් පාලන මණ්ඩල තුළ ඇති ආයතනයකට ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක්කේ, ඒ ඒ මණ්ඩලවල නීතිවලට අනුව (නීති ඇතොත්) රෙදි පිරිසිදු කරන ස්ථාන හිමි අයට පමණි.

(iv) ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් කොටසක් හෝ සෑම කොටසක් ම ඒවාට නියමිත තැන්පත් මුදල බැඳීමෙන් පසු සඳහන් කළ හැකි ය.

ඒ. නාගේන්ද්‍රන්,
සෞඛ්‍ය සේවා අධිකාරි, ගාල්ල.

1965 ජූනි මස 1 දින,
ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේදී ය.

### උපලේඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර තැන්පත් මුදල රු. | (3) ඇප මුදල රු. | (4) මසකට රෙදි සේදිය යුතු වාර ගණන | (5) මසකට සේදිය යුතු කැලි ගණන සාමාන්‍ය | (6) ටෙන්ඩර් භාර ගැනීම අවසාන වන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|
| ගාල්ලේ මහා රෝහල— | | | | | |
| (i) වෙනි කොටස—ශල්‍යකර්මාගාරය, මාතෘ හා ළදරු වාට්ටු, අංක 23–25, 28, 29, තිඹිරිගෙය සහ සිහි කිරීම් වාට්ටු 11 | 50 ... | 100 ... | දිනපතා ... | 14,950 | 65.7.20 පෙරවරු 10 |
| (ii) වෙනි කොටස—ඇක්ස්රේ සහ කායික වෛද්‍ය අංශයන්, ලේ බැංකුව, රෝග නිරෝධායන පරීක්ෂණාගාරය, මුළුතැන්ගෙය, ප්‍රවේශ කාර්‍යාලය, අනියම් ලෙඩුන්ගේ කාමරය, බාහිර ලෙඩුන් අංශය, දන්ත, ඇස්, කණ, නාසය, උගුර පිළිබඳ සහ වෙනත් චිකිත්සාගාර, රෝහල් පොලිසි මුළුව, බෙහෙත් හල, අදින කාමරය සහ ඕවර් සියර් | 50 ... | 100 ... | 4 ... | 1,300 | |
| (iii) වෙනි කොටස—වාට්ටු, 1–9 සහ රෝගීන් වෙන්කර තබන වාට්ටුව | 50 ... | 100 ... | 4 ... | 3,300 | |
| (iv) වෙනි කොටස—වාට්ටු 11–12, 14–19 ... ... | 50 ... | 100 ... | 4 ... | 3,900 | |
| (v) වෙනි කොටස—වාට්ටු 27 තලාපිටිය මාතෘ නිවාසය ... | 50 ... | 100 ... | 10 ... | 1,900 | |
| (vi) වෙනි කොටස—වාට්ටු 26 ක්ෂය රෝග වාට්ටු 21, 22 සහ සිහි කිරීම් වාට්ටු 1 ඕ. පී. ඩබ්ලිව්. පිරිමි සහ ගැහැණු | 50 ... | 100 ... | 4 ... | 1,650 | |

6—341/4—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ජාතික කිරි ව්‍යාපාරය—පිරිසිදු එළකිරි එහා මෙහා ගෙනයෑම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයන් හා සේවා.**—වර්ෂ 1965 ඔක්තෝබර් මස 1 වෙනිද සිට 1966 සැප්තැම්බර් මස 30 වෙනිද දක්වා (දෙදිනම ඇතුළුව) කාලය තුළ මේ සමඟ ඇති උපලේඛනයෙහි පළමුවන තීරයෙහි සඳහන් වන ආයතනයන්ට, දුම්රිය ස්ථානවල/සෞඛ්‍ය කාර්යාලවල/ආණ්ඩුවේ ගොවිපොලවල සිට කිරි මධ්‍යස්ථානවලට පිරිසිදු එළකිරි ගෙනයාම සඳහා ලාංකිකයන්ගෙන් සහ ලාංකික වෙළඳ සමාගම් විසින් එවනු ලබන සිල් තැබූ ටෙන්ඩර් පත්‍ර කෑගල්ලේ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේදී භාර ගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයෙහි දෙවන ඡෙදයෙහි සඳහන් පරිදි රු. 100 ක තැන්පත් මුදලක්, මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුය.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුලත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය, පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන තැන්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි වරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝරමයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝරම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝරම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට සැලකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝරම ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරින්ට හෝ දන්විය යුතුය. මේ සඳහා උවමනා පෝරම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ (ii) සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්වය විදහාපෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ

4. **ප්‍රමාණයන්.**—ප්‍රවාහනය කළ යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැනගැනීමට, මේ සමඟ ඇති උප ලේඛනයෙහි 3 වැනි තීරය බලන්න.

5 **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා '' සෞඛ්‍ය සේවා අධිකාරි, කෑගල්ල '' කියා එවිය යුතුයි. සිල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙලවරේ එය කවර සේවාවක් සඳහාද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම, එහි වම් පස පහත කෙලවරේ ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයෙහි තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ලේකම් මහතාට දීමෙන් ඒ ලැබුනු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6 ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.—මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර්පත් භාර ගැනීම අවසන්වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7 ටෙන්ඩර් පත් විවෘත කිරීම.—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන්ද පැමිණ සිටින ටෙන්ඩර් කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳව සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාලසීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුල වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9 තැන්පත් මුදල්.—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10 ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවෙකු වීමට බලාපොරොත්තු වන්නන්, එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය.

11 වෙනත් විස්තර.—තව දුරටත් විස්තර දැනගැනීම සඳහා මෙහි දෙවන ඡෙදයෙහි සඳහන් කුමන කාර්යාලයකින් හෝ ඉල්ලුම් පත්‍රයක් මගින් පුළුවන.

සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලය,
කෑගල්ල,
1965 මැයි මස 28 වැනි දින.

ඩී. ඒ. දාමෝදරම්,
කෑගල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරි තැන.

## උපලේඛනය

| සේවය | ප්‍රදේශය | ප්‍රමාණය දළ වශයෙන් මසකට පයින්ට්ස් ප්‍රමාණය | අවසන් දිනය |
|---|---|---|---|
| 1. කෑගල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ කාර්යාලයේ සිට කෑගල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට ... ... | කෑගල්ල ... | 15,965 | 1965 ජූලි 15 වැනි දින පෙ.ව. 10 ට |
| 2. කෑගල්ලේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ කාර්යාලයේ සිට කෑගල්ලේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට ... | කෑගල්ල ... | 14,353 | |
| 3. මාවනැල්ලේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ කාර්යාලයේ සිට මාවනැල්ලේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට ... | මාවනැල්ල ... | 15,748 | |
| 4. දෙහිඕවිට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ කාර්යාලයේ සිට දෙහිඕවිට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට ... | දෙහිඕවිට ... | 19,654 | |
| 5. අඹේපුස්ස දුම්රිය ස්ථානයේ සිට වරකාපොල සෞඛ්‍ය කාර්යාලයට, වරකාපොල සෞඛ්‍ය කාර්යාලයේ සිට වරකාපොල සෞඛ්‍ය කාර්යාල භාර නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට ... ... ... | වරකාපොල ... | 13,981 | |

6–359—65.2.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ජාතික කිරි ව්‍යාපාරය—පිරිසිදු එළකිරි එහා මෙහා ගෙනයාම

ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයන් හා සේවා.—වර්ෂ 1965 ඔක්තෝබර් 1 දින සිට 1966 සැප්තැම්බර් 30 වැනිද දක්වා (දෙදින ඇතුළුව) කාලය තුළ මේ සමඟ ඇති උපලේඛනයෙහි පළමුවන තීරයෙහි සඳහන් වන, ආයතනයන්ට, සෞඛ්‍ය කාර්යාලවල සිට කිරි මධ්‍යස්ථාන වලට පිරිසිදු එළ කිරි ගෙනයාම සඳහා ලාංකිකයන්ගෙන් සහ ලාංකික වෙළඳ සමාගම් විසින් එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර කොළඹ සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. (අ) ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.—මෙහි උපලේඛන යෙහි දෙවන ඡෙදයෙහි සඳහන් පරිදි, රු. 100ක තැන්පත් මුදලක් මා නමට කච්චේරියේ තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

(ii) ටෙන්ඩර් පත්‍ර.—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12වන තුරු මෙම කාර්‍යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, ගාල්ල, යාපනය, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන තැන්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාල වලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. වත්කමේ විස්තර.—මෙම දෙපාර්තමේන්තුවේ දැනට කොන්ත්‍රාත්තුවක් නොදරණ අය ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ සැළකිය යුතු කාලයකට පළමු තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දැන්විය යුතුය. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි වීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරණ ලෙස දැන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. ප්‍රමාණයන්.—සැපයිය යුතු එළකිරි ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට මේ සමඟ ඇති උපලේඛනයෙහි 3 වැනි තීරය බලන්න.

5. ටෙන්ඩර් එවිය යුතු අන්දම.—සියලුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා "සෞඛ්‍ය සේවා අධිකාරි කොළඹ" කියා එවිය යුතුයි. සීල් කරණ ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙලවරේ එය කවර සේවාවන් සඳහාද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම, එහි වම්පස, පහත කෙලවරේ ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්‍යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරි මහතාට දීමෙන් එය ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරණු ලබන කුවිතාන් සියක් ගැනීමෙන් හෝ ලියා පදිංචි තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැකිය.

6. ටෙන්ඩර්පත් භාරගන්නා අවසාන දිනය.—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10ට ටෙන්ඩර්පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර්පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර් කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර් කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර් කරුවෙකු ඉදිරිපත් නරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමහ කටයුතු පිළියෙල කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ ක්යෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයේ සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර් කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාල සීමාව ඉකුත්වන තුරු වලංගුවේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුල වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු නියමිත ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුයි.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දෙසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවෙකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දනගත යුතුවාත් හැර පිළිපැදිය යුතුද වන්නේ ය.

11. **වෙනත් විස්කර.**—තවදුරටත් විස්තර දන ගැනීම සඳහා දෙවන ඡේදයේ සඳහන් කුමන කාර්යාලයකින් හෝ ඉල්ලුම් පත්‍රයක් මගින් පුළුවන.

සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලය,
කොළඹ, 1965, ජූනි 7.

ඇල්. ආර්. ජේ. වොට්සන්,
කොළඹ සෞඛ්‍යසේවා අධිකාරී.

## උපලේඛනය—කොළඹ කොට්ඨාශය

| සේවය | ප්‍රදේශය | ප්‍රමාණය දළ වශයෙන් මසකට පයින්ට් ප්‍රමාණය | අවසන් දිනය |
|---|---|---|---|
| 1. ගම්පහ දුම්රිය පොලේ සිට ගම්පහ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි තැනගේ කායඝාලයේ සිට සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට ... ... | ගම්පහ | ... 17,794 | 1965.7.16 වැනි දින පෙ.ව. 10ට |
| 2. කොච්චිකඩේ සෞඛ්‍ය කායඝාලයේ සිට කොච්චිකඩේ සෞඛ්‍ය කායඝාලය භාර නිළධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථාන වලට | කොච්චිකඩේ | ... 13,000 | |
| 3. වල්පිට රජයේ ගොවිපලේ සිට කොච්චිකඩේ සෞඛ්‍ය කායඝාලය භාර නිලධාරි තැන ගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | කොච්චිකඩේ | ... 3,000 | |
| 4. වේයන්ගොඩ දුම්රිය පොලේ සිට කිරිඳිවැල සෞඛ්‍ය කායඝාලයට සහ කිරිඳිවැල සෞඛ්‍ය කායඝාලයේ සිට කිරිඳිවැල සෞඛ්‍ය කායඝාලය භාර නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට ... | කිරිඳිවැල | ... 12,834 | |
| 5. මීගමු සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ කායඝාලයේ සිට මීගමු සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | මීගමුව | ... 7,000 | |
| 6. මීරිගම දුම්රිය පොළේ සිට සෞඛ්‍ය කායඝාලයට සහ මීරිගම සෞඛ්‍ය කායඝාලයේ සිට මීරිගම සෞඛ්‍ය කායඝාලය භාර නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | මීරිගම | ... 13,020 | |
| 7. හෝමාගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැන ගේ කායඝාලයේ සිට හෝමාගම සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි තැනගේ කොට්ඨාශයේ තිබෙන කිරි මධ්‍යස්ථාන වලට ගෙනයාම ... ... ... | හෝමාගම | ... 6,000 | |
| 8. මිණුවන්ගොඩ සෞඛ්‍ය කායඝාලයේ සිට මිණුවන්ගොඩ සෞඛ්‍ය කායඝාලය භාර නිලධාරි තැනගේ කොට්ඨාශයේ පිහිටි කිරි මධ්‍යස්ථානවලට ගෙන යාමට ... ... ... | මිණුවන්ගොඩ | ... 9,000 | |
| 9. පාදුක්කේ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි තැනගේ කායඝාලයේ සිට පාදුක්කේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි—මධ්‍යස්ථාන වලට ... ... ... | පාදුක්ක | ... 8,400 | |
| 10. ජාඇල සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි තැනගේ කායඝාලයේ සිට ජාඇල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථාන වලට | ජාඇල | ... 11,223 | |
| 11. කැළණියේ සෞඛ්‍ය කායඝාලයේ සිට කැළණියේ සෞඛ්‍ය කායඝාලය භාර නිළධාරි තැනගේ කොට්ඨාශයේ පිහිටි කිරි මධ්‍යස්ථානවලට ගෙය යාමට | කැළණිය | ... 35,670 | |

6-462—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—කොළඹ කොට්ඨාශය

### කිළිටි රෙදි සේදීම

**සේවය සහ ටෙන්ඩර්කරුවන්ගේ සුදුසුකම්.**—1965 ඔක්තෝබර් පළමුවැනි දින සිට 1966 සැප්තැම්බර් 30 වනදයින් (දින දෙකත් ඇතුළුව) අවසන් වන වර්ෂය තුළ, මෙහි පහත සඳහන් උපලේඛනයේ පළමුවෙනි වගන්තියෙහි දක්වා තිබෙන ආයතනයන්හි කිළිටි රෙදි සේදීම සඳහා ලාංකිකයන් හා ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර කොළඹ සෞඛ්‍ය සේවා අධිකාරී විසින් භාරගනු ලැබේ.

2. **ටෙන්ඩර් තැන්පත් මුදල්.**—(i) මෙම උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලට ද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්ලිය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි කළ අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් ද ආයතනයන් භාර වෛද්‍ය නිලධාරීන්ගෙන් ද ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩර්යක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි.

ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට සැළකිය යුතු කාලයකට පළමු තම වත්කම, මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු ආයතන භාර වෛද්‍ය නිලධාරියාට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ දෙවන කොටසේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක.

වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වූවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

4. **සෝදන කැලි ප්‍රමාණය පිළිබඳ විස්තර.**—දළ වශයෙන් මාසයකට සේදිය යුතු කැලි ප්‍රමාණය මේ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි වගන්තියෙහි දක්වා ඇත.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා " සෞඛ්‍ය සේවා අධිකාරි, කොළඹ " කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම, එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර්පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරි/ලේකම් මහතාට (හෝ මාහට) දීමෙන් ඒ ලැබුණු බවට ඔහු හෝ මවිසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි කළ තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙණෙන උපලේඛනයේ 6 තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන්වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර් කරුවන්ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කටයුතු පිළියෙළ කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායින් පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි සඳහන් කරන ලද මිළ ගණන් වළංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාල සීමාව ඉකුත් වන තුරු වළංගු වේ. කොන්ත්‍රාත්කරුගේ පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම්, එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන් වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් හැර, පිළිපැදිය යුතුද වන්නේය.

11. **අනික් විස්තර.**—(i) කොන්ත්‍රාත්කරුවන්ට ගබඩා, විදුලි බලය, ජලය ආදී පහසුකම් සැලසුවහොත් ඊට යන වියදම් ආදිය පළාතේ ආදායම් පාලක නිලධාරි තුමා තක්සේරු කළ ගණන්වලට අනුව වවුචරයෙන් කපාගනු ලැබේ.

(ii) **කිළිටු රෙදිවල විෂබීජ නැති කිරීම සහ එහා මෙහා ගෙන යාමේ වියදම්.**—යම් අවසථාවක කිළිටි රෙදි සේදීමට පළමු ඒවායේ විෂබීජ නැති කිරීම සඳහා වෙන ස්ථානයකට ගෙනයාමට සිදුවුවහොත් ඒවා එහා මෙහා ගෙනයාමට කිසිම ගාස්තුවක් ගෙවනු නොලැබේ.

(iii) **පළාත්පාලන මණ්ඩලවල පිහිටා ඇති ආයතනයන් සඳහා ටෙන්ඩර්.**—පාළාත්පාලන මණ්ඩල තුළ ඇති ආයතනයකට ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක්කේ, ඒ ඒ මණ්ඩලවල නීති වලට අනුව (නීති ඇතොත්) රෙදි පිරිසිදු කරන ස්ථාන හිමි අයට පමණි.

(iv) ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් කොටසක් හෝ සෑම කොටසක්ම ඒවා නියමිත තැන්පත් මුදල බැඳීමෙන් පසු සඳහන් කළ හැකිය.

ඇල් ආර්. ජේ. වොට්සන්,
කොළඹ, සෞඛ්‍ය සේවා අධිකාරි.

සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලය,
කොළඹ, 1965 ජූනි 7 වැනි දින.

## උපලේඛනය

| ආයතනය | ටෙන්ඩර් තැන්පත් මුදල රුපියල් | ඇප මුදල රුපියල් | මසකට රෙදි සේදිය යුතු වාර ගණන | මසකට සේදිය යුතු කැලි ගණන සාමාන්‍ය | ටෙන්ඩර් භාර ගැනීම අවසාන වන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|
| (1) උතුරු කොළඹ රෝහල, රාගම | | | | | |
| කොටස් අංක 1— | | | | | |
| වාට්ටු අංක 1, 3, 4, 5, 6, 8, 9, 12, 13, 14, 15, 16 සී. එච්. 1 සී. එච්. 2—ඕ. පී. ඩී. ඇක්ස්රේ දෙපාර්ත මේන්තුව, රසායනාගාරය, මුළුතැන්ගෙය, හෙදි නිවාසය කාර්යාලය හා දන්ත චිකිත්සාගාරය ... | 100 ... | 200 ... | 10 ... | 14,530 | |
| කොටස් අංක 2— | | | | | |
| වාට්ටු අංක 2 හා 10 (ළමා වාට්ටු) ... | 100 ... | 200 ... | 30 දිනපතා ... | 4,813 | |
| කොටස් අංක 3— | | | | | |
| ගර්භනී මාතෘ වාට්ටු අංක 17, 18 හා ප්‍රසූතිකාගාරය, ශල්‍යාගාරය ... ... ... | 100 ... | 200 ... | 30 දිනපතා ... | 12,421 | 1965.7.17 වැනි දින පෙ. ව. 10 ට |
| (2) දකුණු කොළඹ රෝහල, කළුබෝවිල | | | | | |
| කොටස් අංක 1— | | | | | |
| වාට්ටු අංක 1, 2, 3, 4, 5, 9, 7, 11, සහ 14 ඕ. පී. ඩී., පාලන අංශය, හෙදි නිවාසය, මුළුතැන් ගෙය, වෛද්‍ය නිවාස, මෘත ශරීරාගාරය, නව රසායනාගාරය, චිකිත්සාගාර, ඇක්ස්රේ දෙපාර්තමේන්තුව, ගිලන් රථ ගරාජය ... ... | 100 ... | 200 ... | 4 ... | 8,150 | |
| කොටස් අංක 2— | | | | | |
| ගර්භනී මාතෘ වාට්ටු, ශල්‍යාගාර, ළමා වාට්ටු ... | ...100 ... | 200 ... | 30 දිනපතා ... | 11,826 | |
| (3) වතුපිටිවල රෝහල | | | | | |
| වාට්ටු අංක 1, 2, 3, 4, 5, 8, 6 ළමා වාට්ටුව, 7 ගර්භනී මාතෘ වාට්ටු ... ... ... | 100 ... | 200 ... | 4 ... | 5,332 | |

| විෂය අංකය | විස්තරය | ඇස්තමේන්තු කළ අවශ්‍යතා | අවශ්‍ය ඇසුරුම් |
|---|---|---|---|
| 4. | … මෝර්ෆින් හයිඩ්‍රොක්ලෝරයිඩ් බී. පී. එක් කුප්පියක මෝර්ෆින් හයිඩ්‍රොක්ලෝරයිඩ් ග්‍රෑම් 1/4 අඩංගු (සම්පූර්ණ බී. බී. අඩංගු ප්‍රමාණය කි. ග්‍රෑ. 1 යි; ඇන්හයිඩ්‍රුස් පැතිඩින් බෙස් ග්‍රෑම් 320) … … … | සී. සී. 1.1 කේ කුප්පි 60,000 | … කුප්පි 100 යේ පෙට්ටි තුළ |
| 4, ඒ … | එම … | සී. සී. 1.1 කේ කුප්පි 15,000 | … කුප්පි 50 හේ පෙට්ටි තුළ |
| 4. බී … | එම … | සී. සී. 1.1 කේ කුප්පි 19,000 | … කුප්පි 25 හේ පෙට්ටි තුළ |
| 4. සී … | එම … | සී. සී. 1.1 කේ කුප්පි 6,000 | … කුප්පි 12 හේ පෙට්ටි තුළ |
| 5. | ලික් ඕපි. කොන්සෙන්ට්‍රෙටඩ් (1–6), සම්පූර්ණ අඩංගු ප්‍රමාණය කි. ග්‍රෑ. 111 ග්‍රෑ. 132) … … … | ද්‍රව රාත්තල් 350 … | … ප්ලුයිඩ් අවුන්ස 40 හේ බෝතල්වල |

බාරදීමේ ක්‍රමය :

විෂයයන් 1 සිට 5 දක්වා ඇති සම්පූර්ණ තොගය, ඇනයුම් කළ දින සිට මාස 3 ක් තුළදී එක තොගයෙන්ම, කොළඹ රජයේ බෙහෙත් ගබඩාවට ගෙනවිත් බාරදිය යුතුය.

ටෙන්ඩර්කරු ණයවර ලිපියක් විවෘත කරන ලෙස ආණ්ඩුවෙන් ඉල්ලා සිටින්නේ නම්, මෙම භාණ්ඩයන්ගේ මිළ හා කොළඹට ගෙන ඊමේ ගාස්තුව සහිතව, ඇහිරීමේ ගාස්තු සියල්ල ඇතුළුව, මිල, භාණ්ඩ නිෂ්පාදන රටේ මුදලින් හා ලංකා මුදලින් ද සඳහන් කළ යුතුය.

මෙම සැපයීමේ සියළුම විෂයයන් හා ඒවා අඩංගු සියළුම භාජනවල "ඔටුන්න ලකුණ" හා ඕපි/සිඑම්එස් 2447/64–65 යනුවෙන් සඳහන් කර තිබිය යුතුය.

6—502—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

වෂී 1965 ජූලි මස 2 වෙනි දින පෙරවරු 10.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර කොළඹ 7, ග්‍රීන්පාත් හි අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| පාසලේ නම | | කළයුතු වැඩය |
|---|---|---|
| කො/බ්ලූමැන්ඩල විද්‍යාලය | … | වහළ, ජලපහසුව සහ වැසිකිළි අළුත්වැඩියා. |
| කො/ලුම්බිණී මහාවිද්‍යාලය | … | සිලිම සහ ජලාපවහනය ඉරපරේරු. |

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකින් හෝ, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අධ්‍යක්‍ෂකගේ කාර්යාලයේ රු. 100ක තැන්පත් මුදලක් සඳහා කුවිතාන්සියක් කොළඹ 7, ග්‍රීන්පාත් හි අධ්‍යාපන නිලධරි තැන වෙත ඉදිරිපත් කිරීමේදී අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ රු. 15,000ට හෝ ඊට වැඩි මුදලකට ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වූ අයට 1965 ජූලි මස 1 දින පස්වරු 3.30 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. චෙක් පත් මුදල් ඕඩර්, තැපැල් ඕඩර් ආදිය භාරගනු නො ලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල් සඳහා මුදල් ගෙවීමේ කුවිතාන්සි කොළඹ 2, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යාපන අධ්‍යක්‍ෂක, පාසල් ගොඩනැගිලි අංශයෙන්, හෝ කොළඹ දකුණ අධ්‍යාපන නිලධාරිගෙන් හෝ ලබා ගත යුතුය. ඉහත සඳහන් මුදල් ප්‍රමාණයන් සඳහා ලියා පදිංචි වූ බවට සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක් මුදල් ගෙවීමේ කුවිතාන්සි ලබාගත හැකි බව සිතට ගත යුතුය.

3. පූර්වෝක්ත 2 වැනි ඡේදයේ නියමිත වශයෙන් දැක්වෙන මුදල් ප්‍රමාණයන් සඳහා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිවී තිබේ නම් මෙකී වැඩ සඳහා අනුමත කළ සමිතිවලට ද ටෙන්ඩර් පත් ඉදිරිපත් කළහැකි වේ. අනුමත කළ සමිතිවලට විශේෂ ටෙන්ඩර් පත්‍ර නිකුත් /කරනු ලබන බැවින් ඔවුන්ගේ ටෙන්ඩරය එකී පෝර්මයේ ලියා ඉල්ලුම් කළ යුතුය. ටෙන්ඩර් තැන්පත් මුදල් ගෙවීමෙන් අනුමත කරනු ලැබූ සමිති නිදහස් ය. යථෝක්ත 2 වෙනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයන් සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසු පමණක් ඒවැට විශේෂ ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

4. සියළුම විස්තර හා තොරතුරු ලබාගත හැකි වූද, ඔවුන්ගේ කාර්යාලයෙහිදී සැලැස්ම බලාගත හැකි වූ ද කොළඹ දකුණ අධ්‍යාපන නිලධාරියාගෙන් පූර්වෝක්ත 2 හා 3 ඡේදයන්හි සඳහන් කර තිබෙන ටෙන්ඩර් පත්‍ර ලබාගෙන පිටපත් 2කින් යුක්තව ලියාපදිංචි කළ තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය. තැපැල් මගින් එවනු ලබන ටෙන්ඩර් පත්‍ර කොළඹ 7, ග්‍රීන්පාත් හි අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. ප්‍රාදේශීය ටෙන්ඩර්කරුවන් විසින් ලියාපදිංචි කළ තැපෑලෙන් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අකමැති වන්නේ නම්, ටෙන්ඩර්කරුගේ සේවා විස්තර, නම ලිපිනය කවරයේ දැක්වෙන සේ සීල් තැබූ ටෙන්ඩර් තමන් විසින් හෝ තමාගේ නියෝජිතයකු විසින් හෝ කොළඹ 7, ග්‍රීන්පාත් හි අධ්‍යාපන කායබීලයේ කාර්යාල සහකාර තුමා වෙත පුද්ගලිකව ඉදිරිපත් කොට එතුමාගෙන් ටෙන්ඩරය භාරදුන් බවට ලියවිල්ලක් ලබාගත යුතුය.

5. 1965 ජූලි මස 2 දින පෙරවරු 10.30ට කොළඹ 7, ග්‍රීන්පාත් අධ්‍යාපන කාර්යාලයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමේදී ටෙන්ඩර්කරුවන්ට එහි පෙනී සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලබන නිලධාරි තැන විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ මිල ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් වෙත දැනුම් දෙනු ලැබේ.

6. ටෙන්ඩර් පත්‍ර අවසන් වන දින සිට සති 6ක කාල පරිච්ඡේදයක් දක්වා තමන් ඉල්ලුම් කළ මිල ගණනට වැඩය භාර ගැනීමට ටෙන්ඩර්කරුවන් කැමති විය යුතුය.

7. තවදුරටත් අවශ්‍ය විස්තර, ටෙන්ඩර් ලියකියවිලි පරීක්‍ෂා කිරීම් පිණිස කොළඹ 7. ග්‍රීන්පාත් අධ්‍යාපන කාර්යාලයේ කාර්යාලයෙන් ලබාගත හැකි ය.

8. ළුළුසෙවිලි කළයුතු ගොඩනැගිලිවලට මෙරට ළුළු යෙදිය යුතුය. මෙම ළුළුවල තරාතිරම නියත වශයෙන් දැන ගැනීමට පරීක්‍ෂණයක් අවශ්‍ය නම්, එය පැවැත්වීම සපයන්නාගේ වියදමෙන් විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ලංකා ආයතනය මගින් කරගත හැකි වේ.

ඇම්. ඒ. පෙරේරා,
ස. අධ්‍යාපන අධ්‍යක්‍ෂක.

අධ්‍යාපන කායබීලය, කොළඹ 7,
1965 ජූනි මස 7 දින.

6–491/1—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

වෂී 1965 ජූලි මස 2 වෙනි දින පෙරවරු 10.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| පාසලේ නම | | කළයුතු වැඩය |
|---|---|---|
| කො/නාලන්දා මහා විද්‍යාලය | … | වහළ අළුත්වැඩියාව. |

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකින් හෝ, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අධ්‍යක්‍ෂකගේ කාර්යාලයේ රු. 100ක තැන්පත් මුදලක් සඳහා කුවිතාන්සියක් කොළඹ 7, ග්‍රීන්පාත් හි අධ්‍යාපන නිලධාරි තැන වෙත ඉදිරිපත් කිරීමේදී අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ රු. 25,000ට හෝ ඊට වැඩි මුදලකට ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වූ අයට 1965 ජූලි මස 1 දින පස්වරු 3.30 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. චෙක් පත් මුදල් ඕඩර්, තැපැල් ඕඩර් ආදිය භාරගනු නො ලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල් සඳහා මුදල් ගෙවීමේ කුවිතාන්සි කොළඹ 2, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යාපන අධ්‍යක්‍ෂක, පාසල් ගොඩනැගිලි අංශයෙන්, හෝ කොළඹ දකුණ අධ්‍යාපන නිලධාරිගෙන් හෝ ලබා ගත යුතුය. ඉහත සඳහන් මුදල් ප්‍රමාණයන් සඳහා ලියා පදිංචි වූ බවට සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක් මුදල් ගෙවීමේ කුවිතාන්සි ලබාගත හැකි බව සිතට ගත යුතුය.

3. පූර්වෝක්ත 2 වැනි ඡේදයේ නියමිත වශයෙන් දැක්වෙන මුදල් ප්‍රමාණයන් සඳහා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ලියා පදිංචිවී තිබේ නම් මෙකී වැඩ සඳහා අනුමත කළ සමිතිවලට ද ටෙන්ඩර් පත් ඉදිරිපත් කළහැකි වේ. අනුමත කළ සමිතිවලට විශේෂ ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන බැවින් ඔවුන්ගේ ටෙන්ඩරය එකී ෆෝර්මයේ ලියා ඉල්ලුම් කළ යුතුය. ටෙන්ඩර් තැන්පත් මුදල් ගෙවීමෙන් අනුමත කරනු ලැබූ සමිති නිදහස් ය. යථෝක්ත 2 වෙනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයන් සඳහා ලියා පදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසු පමණක් ඒවාට විශේෂ ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ.

4. සියළුම විස්තර හා තොරතුරු ලබාගත හැකි වූද, ඔවුන්ගේ කාර්යාලයෙහිදී සැලැස්ම බලාගත හැකි වූ ද අධ්‍යාපන නිලධාරි තැන ගෙන් පූර්වෝක්ත 2 හා 3 ඡේදයන්හි සඳහන් කර තිබෙන ටෙන්ඩර් පත්‍ර ලබාගෙන පිටපත් 2කින් යුක්තව ලියාපදිංචි කළ තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය. තැපැල් මගින් එවනු ලබන ටෙන්ඩර් පත්‍ර කොළඹ 7, ග්‍රීන්පාත් හි අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත ලියා පදිංචි කළ තැපෑ ලෙන් එවිය යුතුය. ප්‍රාදේශීය ටෙන්ඩර්කරුවන් විසින් ලියාපදිංචි කළ තැපෑලෙන් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අකමැති වන්නේ නම්, ටෙන්ඩර්කරුගේ සේවා විස්තර, නම ලිපිනය කවරයේ දක් වෙන සේ සීල් තැබූ ටෙන්ඩර් තමන් විසින් හෝ තමාගේ නියෝ ජිතයකු විසින් හෝ කොළඹ 2, මලයිවීදියේ අධ්‍යාපන කායඕලයේ කාර්යාල සහකාර තුමා වෙත පුද්ගලිකව ඉදිරිපත්කොට එතුමාගෙන් ටෙන්ඩරය භාරදුන් බවට ලියවිල්ලක් ලබාගත යුතුය.

5. 1965 ජූලි මස 2 දින පෙරවරු 10.30ට කොළඹ මලයි වීදියේ අධ්‍යාපන කාර්යාලයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමේදී ටෙන්ඩර්කරුවන්ට එහි පෙනී සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලබන නිලධාරි තැන විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ මිල ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් වෙත දැනුම් දෙනු ලැබේ.

6. ටෙන්ඩර් පත්‍ර අවසන් වන දින සිට සති 6ක කාල පරිච්ඡෙදයක් දක්වා තමන් ඉල්ලුම් කළ මිල ගණනට වැඩය භාර ගැනීමට ටෙන්ඩර්කරුවන් කැමති විය යුතුය.

7. තවදුරටත් අවශ්‍ය විස්තර, ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂා කිරීම් පිණිස කොළඹ 7; ග්‍රීන්පාත් අධ්‍යාපන කාර්යාලයේ කාර්යාලයෙන් ලබාගත හැකි ය.

8. උළුසෙවිලි කළයුතු ගොඩනැගිලිවලට මෙරට උළු යෙදිය යුතුය. මෙම උළුවල තරාතිරම නියත වශයෙන් දැන ගැනීමට පරීක්ෂණයක් අවශ්‍ය නම්, එය පැවැත්වීම සපයන්නාගේ වියදමෙන් විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ලංකා ආයතනය මගින් කරගත හැකි වේ.

ඇම්. ඒ. පෙරේරා,
ස. අධ්‍යාපන අධ්‍යක්ෂක.

අධ්‍යාපන කායඕලය, කොළඹ 7,
1965 ජූනි මස 7 දින.

6–491/2—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

කොළඹ, සිලිංකො මන්දිරේ ප්‍රවාහණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ "ටෙන්ඩර්" මණ්ඩලයේ සභාපති තැන විසින් වැල්ලව දුම්රිය අංගනය අසලදී අඟල් $1\frac{1}{2}$ කළුගල් කියුබ් 1,500ක් සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1965 ජූලි මස 7 වැනි බදාදා පෙරවරු 11 දක්වා බාර ගනු ලැබේ. පසුදින පෙරවරු 10 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට එහි පැමිණිය හැක.

2. කොළඹ මැක්ලම් පාරේ පිහිටි දුම්රිය දෙපාර්තමේන්තුවේ මාර්ග හා කර්මාන්ත අංශයේ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් (තැ. පෙ. අංක 370) මේ සඳහා ෆෝර්ම කොළ ලබාගෙන සම්පූර්ණ කර අනුපිට පතක් සමග එවිය යුතුයි. මේ සම්බන්ධයෙන් සියළු විස්තර මෙම නිලධාරි තැනගෙන් ලබාගත හැකිය.

3. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමට පෙර ඉහත සඳහන් සේවාවන් බාරගෙන සාර්ථක අන්දමින් කරගෙනයාමට මුදල් අතින් හැකියා වක් තිබෙන බව පෙන්වීමට ටෙන්ඩර්කරුවන් විසින් අවශ්‍ය ලිය කියවිලි ඉදිරිපත් කළ යුතුයි.

1965 ජූනි මස 23 වෙනි බදාදා පස්වරු 4 දක්වා ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල වන රු. 100 සහ ටෙන්ඩර් ගාස්තු වශයෙන් රු. 10 ක් ද තැන්පත් කර ලබාගත් රිසිට්පත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම ලබාගත හැක.

මෙම මුදල් තැන්පත් කළ යුත්තේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි තැනගේ කායඕලයේ දීය.

එන්. ඒ. වෛත්‍යලිංගම්,
ප්‍රධාන ඉංජිනේරු තැන,
ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව.

(තැ. පෙ. අංක 370).
1965 ජූනි මස 5 දින,
කොළඹ දීය.

6–498—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු කායඕලීය "ටෙන්ඩර්" මණ්ඩලයේ සභාපති තැන විසින් අඟල් $1\frac{1}{2}$රේ කළුගල් කියුබ් 600ක් මදවච්චිය සහ වෙඩිඩිකුලම අතරදී සැ. 145 වැනි කනුව අසල ඇති දුම්රිය දෙපාර්තමේන්තුවට අයිති ගල්වලෙන් සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1965 ජූලි මස 9 වැනි සිකුරාදා පස්වරු 2.30 දක්වා බාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට එහි පැමිණිය හැකිය.

2. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමට පෙර ඉහත සඳහන් සේවාවන් බාරගෙන සාර්ථක අන්දමින් කරගෙන යාමට මුදල් අතින් හැකියා වක් තිබෙන බව පෙන්වීමට ටෙන්ඩර්කරුවන් විසින් අවශ්‍ය ලියවිලි ඉදිරිපත් කළ යුතුයි.

3. ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල වන රුපියල් 50 සහ ටෙන්ඩර් ගාස්තු වශයෙන් රුපියල් 10 ක් ද කොළඹ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරිගේ කායඕලයේ තැන්පත් කර ලබාගත් රිසිට් පත පහත සඳහන් ඉංජිනේරු තැන වෙත ජූනි මස 25 වැනි දින පස්වරු 4 ට පෙර ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම ලබාගත හැකිය.

මේ සඳහා තවත් විස්තර හා ටෙන්ඩර් ෆෝර්මද කොළඹ මැක්ලම් පාරේ පිහිටි දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු තැනගේ කායඕලයෙන් ලබාගත හැකිය.

එන්. ඒ. වෛත්‍යලිංගම්,
ප්‍රධාන ඉංජිනේරු තැන, ල. දු. දෙ.

තැ. පෙ. අංක 370,
කොළඹ, 1965 ජූනි මස 5 වැනි දින දීය.

6–492—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු කාර්යා ලීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් අඟල් $1\frac{1}{2}$රේ කළුගල් කියුබ් 500 ක් එඬේරමුල්ලේ දී සැපයීම සඳහා ටෙන්ඩර් 1965 ජූලි මස 9 වැනි සිකුරාදා පස්වරු 2.30 දක්වා බාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී ටෙන්ඩර් කරුවන්ට එහි පැමිණිය හැකිය.

2. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමට පෙර ඉහත සඳහන් සේවාවන් බාරගෙන සාර්ථක අන්දමින් කරගෙන යාමට මුදල් අතින් හැකියා වක් තිබෙන බව පෙන්වීමට ටෙන්ඩර් කරුවන් විසින් අවශ්‍ය ලිය විලි ඉදිරිපත් කළ යුතුයි.

3. ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල වන රුපියල් 50 සහ ටෙන්ඩර් ගාස්තු වශයෙන් රුපියල් 10 ක් ද කොළඹ, දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරිගේ කාර්යාලයේ තැන්පත් කර ලබාගත් රිසිට් පත්‍ර පහත සඳහන් ඉංජිනේරු තැන වෙත ජූනි මස 25 වැනි දින පස්වරු 4ට පෙර ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම ලබාගත හැකිය.

මේ සඳහා තවත් විස්තර හා ටෙන්ඩර් ෆෝර්මද කොළඹ, මැක්ලම් පාරේ පිහිටි දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකිය.

එන්. ඒ. වෛත්‍යලිංගම්,
ප්‍රධාන ඉංජිනේරු තැන, ල. දු. දෙ.

තැ. පෙ. අංක 370,
කොළඹ, 1965 ජූනි 5 වැනි දින දීය.

6–493—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

කොළඹ, සිලිංකෝ මන්දිරේ ප්‍රවාහන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් අඟල් 1½ කොරල් ගල් කියුබ් 2,000ක් සැපයීම සඳහා ටෙන්ඩර් පත් 1965 ජූලි මස 7 වැනි බදාදා පෙරවරු 11 දක්වා බාරගනු ලැබේ. පසුදින පෙරවරු 10ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරනවිට ටෙන්ඩර් කරුවන්ට එහි පැමිණිය හැක.

2. කොළඹ, මැක්ලම් පාරේ පිහිටි දුම්රිය දෙපාර්තමේන්තුවේ මාර්ග හා කර්මාන්ත අංශයේ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් (තැ. පෙ. අංක 370) මේ සඳහා පෝර්ම කොළ ලබාගෙන සම්පූර්ණකර අනුපිට පතක් සමඟ එවිය යුතුයි. මේ සම්බන්ධයෙන් සියළු විස්තර මෙම නිලධාරි තැනගෙන් ලබාගත හැකිය.

3. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමට පෙර ඉහත සඳහන් සේවාවන් බාරගෙන සාර්ථක අන්දමින් කරගෙනයාමට මුදල් අතින් හැකියාවක් තිබෙන බව පෙන්වීමට ටෙන්ඩර්කරුවන් විසින් අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කළ යුතුයි.

1965 ජූනි මස 23 වෙනි බදාදා පස්වරු 4 දක්වා ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල වන රු. 200 සහ ටෙන්ඩර් ගාස්තු වශයෙන් රු. 10ක්ද තැන්පත්කර ලබාගත් රිසිට්පත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක.

මෙම මුදල් තැන්පත් කළ යුත්තේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි තැනගේ කාර්යාලයේදී ය.

එන්. ඒ. වෛත්‍යලිංගම්,
ප්‍රධාන ඉංජිනේරු තැන,
ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව.

1965 ජූනි මස 5 වැනි දින,
තැ. පෙ. අංක 370, කොළඹ.

6–494—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

ප්‍රවාහණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ "ටෙන්ඩර්" මණ්ඩලයේ සභාපති තැන විසින් කටුගස්තොට කම්කරු නිවාස ජෝඩු 3ක් ඉදිකිරීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1965 ජූලි මස 7 වැනි බදාදා පෙරවරු 11 දක්වා බාරගනු ලැබේ. එදිනම පස්වරු 2.30 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර් කරුවනට එහි පැමිණිය හැක.

2. කොළඹ මැක්ලම් පාරේ පිහිටි දුම්රිය දෙපාර්තමේන්තුවේ මාර්ග හා වැඩ අංශයේ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් (තැ. පෙ. 370) මේ සඳහා පෝර්ම කොළ ලබාගෙන සම්පූර්ණකොට අනු පිටපතක්ද සමග එවිය යුතුයි. මේ සම්බන්ධයෙන් සියළු විස්තර මෙම නිලධාරි තැනගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. 1965 ජූනි මස 23 වැනි බදාදා පස්වරු 4 දක්වා රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ වැඩ සඳහා රුපියල් 70,000 කට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ හෝ මෙම මුදලට වඩා වටිනාකම් ඇති කොන්ත්‍රාත් වැඩක් දුම්රිය දෙපාර්තමේන්තුවට සතුටුදායක අන්දමින් අවසන් කර ඇති කොන්ත්‍රාත් කරුවනට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැන වෙත (අ) තමාගේ ලියා පදිංචි කිරීම පිළිබඳ ලිය කියවිලිද (ආ) ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල වන රු. 100 සහ ටෙන්ඩර් ගාස්තු වශයෙන් රුපියල් 10ක්ද තැන්පත්කර ලබාගත් රිසිට් පත්‍ර ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම ලබාගත හැකිය.

මෙම මුදල් තැන්පත් කළ යුත්තේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි තැනගේ කාර්යාලයේදීය.

එන්. ඒ. වෛත්‍යලිංගම්,
ප්‍රධාන ඉංජිනේරු තැන,
ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව.

1965 ජූනි මස 5 දින,
තැ. පෙ. අංක 370,
කොළඹ දීය.

6–495—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

බද්දේගම පැරණි මාතෘ නිවාසය ප්‍රාදේශීය වෛද්‍යනිලධාරී තැනගේ නිවාසය බවට පත් කිරීම සඳහා එවන ටෙන්ඩර්පත් දකුණු කොට්ඨාශයේ, ගාල්ලේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ, අධිකාරි ඉංජිනේරු කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1965 ජූනි මස 23 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ.

2. ගාල්ලේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලාගැනීමට පුළුවන.

3. වර්ෂ 1965 ජූනි මස 18 වෙනි සිකුරාදා පස්වරු 4.30 වනතෙක් රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රු. 20,000 ට නොඅඩු ගණනකට ලියා පදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25 ක් තැන්පත්කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත්කළ විට මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

එම්. එන්. නයිනමරිකාර්,
දකුණු කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු.

රජයේ වැඩ දෙපාර්තමේන්තුව,
ගාල්ල, 1965 ජූනි මස 3 වැනිද.

6–434—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

පුත්තලමේ රෝහල දීර්ඝ කිරීම—ඉතිරි වැඩ සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි ප්‍රවාහණ හා රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1965 ජූලි මස 7 වෙනි බදාදා පෙරවරු 11 වන තෙක් භාර ගනු ලැබේ.

2. පුත්තලම ර. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1965 ජූනි මස 25 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 90,000ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ර. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

ඊ. ගුණරත්නම්,
රජයේ වැඩ අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 1965.6.7.

6–497—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

# තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම

## පොලිස් දෙපාර්තමේන්තුව

**1965 මැයි මස 1 වන දින සිට එක් වර්ෂයකට කයිවන්ෂ් නීතිවිරෝධි සංක්‍රමණිකයින් නවත්වා සිටින පොලිස් නිරෝධායන කඳවුරට පිසනලද කෑම සැපයීම සඳහා ටෙන්ඩර්වල ප්‍රතිඵල**

(අ) ලැබුණු ටෙන්ඩර්වල මුළු ගණන : 1

(ආ) සම්මතවූ ටෙන්ඩර්කරුගේ නම : කේ. වේලුපිල්ලේ, කලපුම්, කරෙයිනාගර්

(ඇ) භාරගත් ගණන :—

| | එක් අයෙකුට රු. ශ. |
|---|---|
| (1) (අ) උදේ තේ | 30 |
| (ආ) දවල් කෑම | 60 |
| (ඇ) සවස තේ | 10 |
| (ඈ) රෑ කෑම | 30 |
| එක් දිනකට හා එක් අයෙකුට | 1 30 |
| (2) අසනීපව සිටින්නන්ගේ කෑම | 20 (ශත) |

පොලිස් මූලස්ථානය,
කොළඹ, 1965 ජූනි මස 1 දින,

පොලිස් පති.

6–336—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

---

# බඩු බාහිරාදිය විකිණීම

## කැලෑ දෙපාර්තමේන්තුව

### දැව වෙන්දේසියේ විකිණීම

මැල්සිරිපුර හා කුරුණෑගල අඩවි වල ඇති කොස්, මැහොගනී, වනසපු, කෑන්ද, දමින්න, බුරුත, ඇද්දෙමට, මිල්ල, දෙල්, ගම්මාලු, හල්මිල්ල, හුරීමාර, තේක්ක, වෙලන්, හුලංහික්, ලුණුමිදෙල්ල, පිහිඹිය, වායා, කැටකෑලි, මාර, කුඹුක්, නා, පලු, වැවරණ හා හැළඹ කඳන් 967 කින් සමන්විත ඝන අඩි 8455.9 ක්ද, ලුනුමිදෙල්ල හා හුරීමාර ඉරූ ලී කෑලි 24 කින් සමන්විත ඝණ අඩි 25.5 ක්ද, දර යාර 45 ක්ද, 1965 ජූනි මස 17 වැනි දින උදය 10 ට කුරුණෑගල අඩවි කැලෑ කාර්යාලයේදී වයඹ දිසා කැලෑ නිලධාරි විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දැව ඉල්ලුම්කරුවන්ට දැව වෙන්දේසියට පෙර පරීක්ෂා කර බැලිය හැක.

වැඩි විස්තර සඳහා කුරුණෑගල අඩවි කැලෑ නිලධාරි හෝ වයඹ දිසා කැලෑ නිලධාරි විමසන්න.

ස. මුත්තයියා,
වයඹ දිසාභාර කැලෑ නිලධාරි.

65.5. 21 දින,
දිසා කැලෑ කාර්යාලය,
කුරුණෑගල.

6–425—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

---

## කැලෑ දෙපාර්තමේන්තුව

### දැව වෙන්දේසියේ විකිණීමයි

බුරුත, හල්මිල්ල, හුලන්හික්, රුහ, පලු යන වර්ගයෙන් කඳන් 100 කින් සමන්විත ඝන අඩි 938.2 ගොඩවල් 20 කින් යුත් දැව තොගයක් 1965 ජූනි මස 23 වැනි බදාදා උදය 10 ට කල්මුනේ මධ්‍යම දැව ගබඩාවේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉල්ලුම්කරුවන්ට දැව වෙන්දේසි කිරීමට පෙර පරීක්ෂාකර බැලිය හැක.

වැඩි විස්තර සඳහා පහත අත්සන් කරන මාගෙන් හෝ කල්මුනේ මධ්‍යම දැව ගබඩාකරුගෙන් විමසන්න.

කේ. අරුල්වෙල්වම්,
නැගෙනහිර දිසාවේ දිසා වන නිලධාරි.

1965. 5. 31 දින,
මඩකලපුව,
දිසා වන කාර්යාලයේදීය.

6–424—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

---

## කැලෑ දෙපාර්තමේන්තුව

### දැව වෙන්දේසියේ විකිණීමයි

පළමුවෙනි පන්තියේ රිටි 9 ක් ද තුන්වෙනි පන්තියේ රිටි 33ක් ද 1965 ජූලි මස 5 වෙනි සඳුද උදේ 10ට මඩකලපුවේ රිටි හා දර ගබඩාවේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉල්ලුම්කරුවන්ට දැව වෙන්දේසි කිරීමට පෙර පරීක්ෂා කර බැලිය හැක.

වැඩි විස්තර සඳහා පහත අත්සන් කරන මාගෙන් හෝ මඩකලපුවේ රිටි හා දර ගබඩා ඕවසියර්ගෙන් විමසන්න.

කේ. අරුල්වෙල්වම්,
නැගෙනහිර දිසාවේ දිසා වන නිලධාරි.

1965. 6. 4 දින,
මඩකලපුව.
දිසා වන කාර්යාලයේදීය.

6–488—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

---

## කැලෑ දෙපාර්තමේන්තුවේ දැව වෙන්දේසියේ විකිණීම

වවුනියාවේ රජයේ දැව ගබඩාවේ අංක 1 සහ 2 පංතියේ කඳන් තොග හතක් ඝන අඩි 1,552.9 පමණ ඉහත සඳහන් ස්ථානයේදීම 1965 ජූනි මස 22 දින උදේ 10 ට වවුනියාවේ දිශාභාර කැලෑ නිලධාරි විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දැව ඉල්ලුම්කරුවන්ට වෙන්දේසියට පෙර පරීක්ෂාකර බැලිය හැක. ඉල්ලුම්කරුවන් වෙන්දේසි අවස්ථාවේදී කියවනු ලබන කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කළ යුතුය.

වෙන්දේසිය පිළිබඳ වැඩි විස්තර පහත අත්සන් කරණ මගේ හෝ වවුනියාවේ රජයේ දැව ගබඩාවේ උප ගබඩා පාලකගෙන් ලබාගත හැක.

සී. දිසානායක,
වවුනියාවේ දිශාභාර වන නිලධාරි.

1965 ජූනි මස 2 දින,
වවුනියාවේ දිශා කැලෑ කාර්‍ය්‍යාලයේ දීය.

6–486—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

---

## මහරෝහල—කොළඹ

### ප්‍රසිද්ධ වෙන්දේසියක්

කොළඹ මහ රෝහලට අයත් හිස් ගෝනි 663 (හයසිය හැට තුනක්) 1965 ජූලි මස 8 වෙනි බ්‍රහස්පතින්දා පස්වරු 1 සිට වෙන්දේසියේ විකුණනු ලැබේ.

1. ජයග්‍රහක ලන්සුකරු විසින් වෙන්දේසිය අවසානයේදීම මුලු මුදලම ගෙවා එම හිස් ගෝනි ඉවතට ගෙන යායුතුයි.
2. මෙම වෙන්දේසිය අවලංගු කිරීමට හෝ කල් දැමීමට හෝ ඕනෑම ලන්සුවක් ප්‍රතික්ෂෙප කිරීමට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තැනට බලය ඇත.
3. මෙම හිස් ගෝනි මහජනයාගේ පරීක්ෂණය සඳහා කොළඹ මහ රෝහලේ ප්‍රධාන ගබඩාවේ 65.7.7 දින උදේ 9 සිට සවස 3.30 දක්වා තබා ඇත.

කේ. ඩී. ඇජ්. පියසිලි,
වෛද්‍ය අධිකාරි.
මහ රෝහල, කොළඹ.

6–334—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

## රේගුවේ වෙන්දේසියක්

පහත සඳහන් භාණ්ඩ කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ බෙල්ජ් තටාකයේ අංක 4 දරණ ගුදමේදී 1965 ජූනි මස 18 දින (සිකුරාදා) පෙ.ව. 10 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වීදුරු බඩු, උදුන් සහ අමතර කොටස්, නොයෙක් වර්ගවල සාරි, ඇලුමිනියම් සායම්, හනලණු, ලන්තෑරුම් ලාම්පු වල අමතුර කොටස්, රබර් බඩු, බාල්දි, රෙදි පිළි, යාන්ත්‍රික තෙල් සහ වෙනත් නොයෙක් බඩු වර්ග රාශියකි.

සාමාන්‍ය වැඩ කරන වේලාවල, 1965.6.15 සිට 1965.6.17 දක්වා ඉහත සඳහන් ස්ථානයේදී මෙම භාණ්ඩ පරීක්ෂා කර බැලීමට හැකි වේ.

මෙම වෙන්දේසිය සම්බන්ධව වැඩිමනත් විස්තර දැනගැනීමට අවශ්‍ය නම්, කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ලිපිකරුගෙන් දැනගත හැකිය. රේගු ප්‍රදේශයට ඇතුළුවීමට අවශ්‍ය අවසර පත්‍ර කොළඹ, වරාය කොමිෂන් සභාවේ අවසර පත්‍ර කාර්යාලයේ, අවසර පත්‍ර නිකුත් කරන නිලධාරි තැනගෙන් ලබාගත හැකිය.

බී. ඉ. ගුණතුංග,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය: ඒබී/ජේ ල් ස් /65/7.
1965 මැයි මස 31 වන දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දීය.

6–339—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

---

## පොලිස් දෙපාර්තමේන්තුව

**ප්‍රයෝජනයට නුසුදුසු බඩු බාහිරාදිය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

දැත්විමයි, පරණ තිල ඇඳුම්, සපත්තු, කොහු ගුදිරි, බයිසිකල්, ගුවන් විදුලි යන්ත්‍ර, හිස් චින් ආදිය උතුරු මැද දිසාව භාර සහකාර පොලිස් අධිකාරිතුමාගේ බඩු ගබඩාවේදී 1965 ජූනි මස 18 වැනි දින පෙරවරු 9.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බව සියලු දෙනාටම මෙයින් දැනුම් දෙනු ලැබේ.

චන්ද්‍රසේන සෙනවිරත්න,
සහකාර පොලිස් අධිකාරි, උතුරු මැද දිසාව,
අනුරාධපුරය.

65.5.28.

6–219—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

---

## රේගු වෙන්දේසියක්

1965 ජූනි මස 25 දින පෙරවරු 10 ට ත්‍රිකුණාමලයේ මඩකෝ ගුදමෙහිදී පහත සඳහන් බඩු ආදිය ප්‍රසිද්ධ වෙන්දේසියේදී විකුණනු ලැබේ.

එම බඩු ජූනි මස 23 හා 24 දිනවලදී පෙරවරු 10 සිට 12 දක්වා ඉහත සඳහන් ගුදමෙහිදී පරීක්ෂාකර බැලිය හැක.

මෝටර් රථ කොටස්
හිස් බෝතල්
ටයර්
යකඩ දල්
වීදුරු බඩු
ඉතැමල් බඩු ආදිය

ඇම්. බී. සේනානායක,
රේගු අයකැමි.

රේගු කාර්යාලය,
ත්‍රිකුණාමලය,
65.6.4.

6–441—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

---

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම

## රා තැබෑරුම් රේන්ද විකිණීම—මහනුවර දිස්ත්‍රික්කය, 1965–66

**1965 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1966 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා**

1965.5.7 දින අංක 14,390 දරණ ගැසට් පත්‍රයේ පළවී ඇති රා රේන්ද විකිණීම පිළිබඳ කොන්දේසි වලටත්, එම කාලයට බල පවත්වන සෑම සුරාබදු බලපත්‍ර සඳහා ඇති කොන්දේසි වලටත් යටත්ව, 1965.10.1 දින සිට 1966.9.30 දින දක්වා වූ කාලසීමාව තුළ පහත සඳහන් රා තැබෑරුම්වල පැපුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාදය මිලදී ගැනීම සඳහා මහනුවර දිස්ත්‍රික්කයේ දිසාපති විසින් ටෙන්ඩර් පත්‍රිකා බාරගනු ලැබේ.

2. දිවයිනේ ඕනෑම කච්චේරියකින් ලබා ගත හැකි පෝර්මයක සෑම ටෙන්ඩරයක්ම සකස්විය යුතු අතර ''ටෙන්ඩර් තැන්පත්'' මුදල වශයෙන් රුපියල් 2,500 ඕනෑම කච්චේරියක තැන්පත් කර ඒ සඳහා ලත් කුවිතාන්සියක් සෑම ටෙන්ඩරයකටම යා කළ යුතුයි. මෙම තැන්පත් මුදල් කච්චේරියකට ගෙවිය යුත්තේ මුදලින්ම හෝ බැංකුවක් විසින් ''ගෙවීම සඳහා'' යැයි සඳහන් කරන ලද චෙක්පතකින් හෝ ලංකා බැංකුවේ ''ආරක්ෂක චෙක්'' යන ස්වරූපයෙන් නිකුත් කරණ ලද චෙක්පතකින් හෝ බැංකුවකින් එම බැංකුවේ නමටම ලියනලද චෙක්පතකින් පමණක්ය.

3. සෑම ටෙන්ඩරයක්ම ටෙන්ඩර්කරුගේම නාමයෙන් විය යුතුයි. නියෝජිතයෙකුගේ මාර්ගයෙන් හෝ ලංකා පුරවැසි නොවන අයගෙන් හෝ ඉහතින් සඳහන්වූ රා රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ 6 වැනි කොන්දේසිය යටතේ නුසුදුස්සන් වූ අයගෙන් ලැබෙන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. එක් තැබෑරුමක් සඳහා එක් අයකුගෙන් එක් ටෙන්ඩරයක් පමණක් ලැබිය යුතු අතර සමූහ වශයෙන් එක් තැබෑරුමක් සඳහා කොටස්කරුවන් ගණන පස් දෙනෙකුට වැඩි නොවිය යුතුයි.

5. සෑම ටෙන්ඩරයක්ම, ටෙන්ඩර් කරනු ලබන තැබෑරුමේ නම සහ අංකය, අනුමත වූ තැබෑරුම් ලැයිස්තුවේ සහ ටෙන්ඩර් කැඳවීම් දැන්වීමේ සඳහන් පරිදි ලියුම් කවරයක වම්පස මුදුනේ සටහන්කර, එහි බහා, මුද්‍රා තබා, රා රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ 7 (2) වැනි කොන්දේසියේ සඳහන් ප්‍රකාරයට අනුකූලව මා වෙත ලැබෙන්න සැලැස්විය යුතුයි.

6. සාර්ථකවූ ටෙන්ඩර් පත්‍රිකා ඉදිරිපත් කළ අය එසේ මිලට ගත් බව ප්‍රකාශ කළාට පසුව එදිනම පස්වරු 4ට පෙර මහනුවර දිස්ත්‍රික්කයේ දිසාපති විසින් අණකරනු ලබන පරිදි මාස දෙකක රේන්ද මුදලට අඩු නොවන මුදලක් ගෙවිය යුතු අතර රා රේන්ද විකිණීමේ කොන්දේසි අනුගමනය කරන බවට අත්සන් තැබිය යුතුයි. මෙම ගෙවීමද, මුදලින්ම හෝ බැංකුවක් විසින් ''ගෙවීම සඳහා'' යැයි සඳහන් කරණ ලද චෙක්පතකින් හෝ ලංකා බැංකුවේ ''ආරක්ෂක චෙක්'' යන ස්වරූපයෙන් නිකුත් කරන ලද චෙක්පතකින් හෝ බැංකුවකින් එම බැංකුව නමින්ම ලියන ලද චෙක්පතකින් පමණක් ගෙවිය යුතුයි.

7. 1965.7.1 දින පහත දැක්වෙන එක් එක් තැබෑරුම සඳහා ඒ ඉදිරියෙන් දැක්වෙන වේලාවලදී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නවත්වනු ලැබේ. එම වේලාවට ටෙන්ඩර්කරුවන් සියළු දෙනාම පුද්ගලිකව පෙනී සිටිය යුතුයි.

8. තවදුරටත් අවශ්‍ය විස්තර මහනුවර දිසාපති කාර්යාලයෙන් ලබාගත හැක.

ඇස්. මාරලන්ද,
මහනුවර දිස්ත්‍රික්කයේ වැඩ බලන දිසාපති.

1965 ජූනි 3 වැනි දින,
මහනුවර දිසාපති කාර්යාලයේදී ය.

## 1965–66 සඳහා මහනුවර දිස්ත්‍රික්කයේ අනුමත කරන ලද රා තැබෑරුම් ලැයිස්තුව

| අනු ක්‍රමික අංකය | කොට්ඨාශය | තැබෑරුම පිහිටවිය යුතු කොට්ඨාශය | ටෙන්ඩර් වහනු ලබන වේලාව | තැබෑරුම් අරින වේලාව පෙ. ව. | තැබෑරුම් වසන වේලාව ප. ව. |
|---|---|---|---|---|---|
| (1) | මහනුවර නාගරිකයේ අංක 19, මහයාය සහ අංක 7, මාපනාවතුර ඡන්ද කොට්ඨාශය | (වටපුළුවේ රා තැබෑරුම) කටුගස්තොට පාරේ, එම පාර සහ තිරිකුණාමල වීදිය මංසන්ධියටත්, කටුගස්තොට පාර සහ වට්ටාරන් කැන්න පාර මංසන්ධිය අතර, මහනුවර නාගරිකයේ අංක 19 මහයාය සහ අංක 7, මාපනාවතුර ඡන්ද කොට්ඨාශයන් තුළ පිහිටි ප්‍රදේශයේ | 10.00 | 8.00 | 7.30 |
| (2) | උඩ පලාත ... ... ... | (වහුගේපිටිය රා තැබෑරුම) වහුගේපිටිය ගම තුල ... | 10.30 | 7.30 | 7.00 |
| (3) | පුස්සැල්ලාවේ සුළු නගර සභා කොට්ඨාශය .... | (පුස්සැල්ලාවේ රා තැබෑරුම) පුස්සැල්ලාවේ සුළු නගර සභාවේ සීමා තුල | 11.00 | 7.30 | 7.00 |
| (4) | පාත දුම්බර ... ... | (හුළුගගේ රා තැබෑරුම) හුළු ගඟ ගම තුල ... | 11.30 | 7.30 | 7.00 |

### (මහනුවර දිස්ත්‍රික්කයේ ටෙන්ඩර් නොකළ යුතු වතු කැන්ටීන්)

| | | | |
|---|---|---|---|
| (5) | උඩ පලාත ... ... ... | අංක 2 දරණ කැන්ටිම : ගලහා, පුපුරැස්ස වතුයායේ මායිම් තුල | විකිණීමේ වේලාව වතු අධිකාරි විසින් නියම කරන පරිදි |
| (6) | උඩ දුම්බර ... ... ... | අංක 3 දරණ කැන්ටිම : ඌරුගල, වුඩ්සයිඩ් වතුයායේ මායිම් තුල | එම |

සටහන.—දැනට පවතින රා තැබෑරුම් ස්ථාන, 1965–66 රේන්ද වර්ෂය තුළ සැපයීමට වගකීමක් නොමැතිය. සෑම ස්ථාන සඳහාම මහනුවර දිසාපති තුමාගේ පෙර අනුමැතිය ලබා ගත යුතුය.

6–430—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

---

## මඩකලපුව දිස්ත්‍රික්කය—1965/66 වර්ෂයේ රා තැබෑරුම් රේන්ද විකිණීම

1965.5.21 වැනි දින පවත්වන ලද ඉහත සඳහන් විකිණීම්වල ප්‍රතිඵල පහත දක්වෙයි.

| තැබෑරුමේ නම | ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය | මිලටගත් මුදල රු. | ශ. |
|---|---|---|---|
| අංක 1—ආරුමුගතාන්කුඩියිරුප්පු ... | එම්. කේ. රාධක්‍රිෂ්ණන් මහතා, අංක 44, මහ වීදිය, මඩකලපුව ... ... | 74,789 | 0 |
| අංක 2—කෝඩ්ඩමුනෝ ... | කේ. එස් ධර්මරත්න මහතා, අංක 82, බාර් පාර, මඩකලපුව ... ... | 1,68,681 | 0 |
| අංක 3—ආරපත්තේ ... | කේ. ක්‍රිෂ්ණපිල්ලේ මහතා, 3 වෙනි කොටස, ආරපත්තේ ... ... ... | 87,200 | 0 |
| අංක 4—මාන්කාඩු ... | කේ. ක්‍රිෂ්ණපිල්ලේ මහතා, 3 වෙනි කොටස, ආරපත්තේ ... ... | 1,21,666 | 0 |
| අංක 5—කෝඩ්ඩකල්ලාර් ... | කේ. කේ. බාලක්‍රිෂ්ණන් මහතා, රා. තැ. 5, කෝඩ්ඩෛකල්ලාර් ... ... | 67,000 | 0 |
| අංක 6—එරුවිල් ... ... | පී. පත්මනාදපිල්ලේ මහතා, එවරෙස්ට් කැෆි, එරාවූර් ... ... ... | 94,875 | 0 |

සී. ලුඩ්කන්ස්,
මඩකලපුව දිස්ත්‍රික්කයේ දිසාපති.

1965 ජූනි මස 3 වැනි දින,
මඩකලපුව දිසාපති කාර්යාලයේ දී ය.

6–459—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

---

## කුරුණෑගල දිස්ත්‍රික්කය—රා රේන්ද විකිණීම—1956/66

1965 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1966 සැප්තැම්බර් මස 30 වෙනි දින දක්වා ඇති කාලසීමාව තුල සියළුම සුරාබදු නීති යටතේ දැනට බලපවත්වන සාමාන්‍ය කොන්දේසි සහ 1965 මැයි මස 3 වෙනි දින අංක 14,390 දරණ රජයේ ගැසට් පත්‍රයෙහි පළකරන ලද 1965–66 මුදල් වර්ෂය සඳහා රා රේන්ද විකිණීමේ කොන්දේසි අනුව පැසුන රා පහත සඳහන් ප්‍රදේශයන්හි මිළදී ගැනීම සහ විකිණීම තනි අයිතිය සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයේ දිසාපති තැන විසින් 1965 ජූලි මස 2 වෙනි දින පහත සඳහන් වේලාවන්හි මෙම දිසාපති කාර්‍යාලයේදී ටැන්ඩර් පත් භාරගනු ලැබේ.

2. ලංකාවේ සෑම කච්චේරියකින්ම ලබා ගත හැකි ටැන්ඩර් ආකෘති පත්‍රයක ලියන ලද ටැන්ඩර් පතක්ද, එක් එක් තැබෑරුමකට පහත සඳහන් පරිදි ටැන්ඩර් තැන්පත් මුදල් ගෙවා එම ගෙවීම සඳහා ලබාගත් කච්චේරි කුවිතාන්සියකුත් සමග ඉදිරිපත් කළ යුතුයි :—

| රා තැබෑරුම | ටැන්ඩර් තැන්පත් මුදල |
|---|---|
| අංක 1—රා තැබෑරුම, ගිරිඋල්ල ... ... | රුපියල් 2,000 |
| අංක 2—රා තැබෑරුම, උඩුබද්දව ... ... | 1,000 |
| අංක 3—රා තැබෑරුම, පඹදෙණිය ... ... | 2,000 |
| අංක 4—රා තැබෑරුම, නාරම්මල ... ... | 2,000 |
| අංක 5—රා තැබෑරුම, කටුපිටිය ... ... | 1,000 |
| අංක 6—රා තැබෑරුම, කුරුණෑගල ... ... | 5,000 |

ලංකා බැංකුවෙන් නිකුත් කරන ලද හෝ බැංකුවෙන් මාරු කළ හැකි " ආරක්ෂක චෙක් " යනුවෙන් හැඳින්වෙන චැක්පත්වලින් හෝ බැංකුවකින් ගෙවිය හැකි " ගෙවීමට " යයි නම් කරන ලද චැක් පතකින් හෝ මුදල්වලින් හෝ එම මුදල තැන්පත් කළ යුතුය.

3. සෑම ටැන්ඩර් පත්‍රයක්ම, ටැන්ඩර්කරු විසින් ඔහුගේ නමින් ඉදිරිපත් කළයුතුය. ඉහත සඳහන් රා රේන්ද විකිණීමේ කොන්දේසිවල 6 වෙනි කොන්දේසිය යටතේ හෝ වෙනත් විදියකින් නුසුදුසුවූ හා ලාංකික නොවන තැනැත්තෙකුගෙන් හෝ නියෝජිතයෙකු මගින් ඉදිරිපත් කරන ලද ටැන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ.

4. එක් අයෙකු විසින් එක් තැබෑරුමක් සඳහා එක් ටැන්ඩර් පත්‍රයකට වඩා එවිය නොහැක. එක් තැබෑරුමක් සඳහා පස් දෙනෙකුට වැඩි අයවලුන් විසින්ද ටැන්ඩර් පත් ඉදිරිපත් නොකළ යුතුය.

5. ටැන්ඩර් පත්‍ර කැඳවීම සඳහා ඇති දැන්වීමේ සඳහන් පරිදි, අනුමත කරන ලද මෙහි පහත දැක්වෙන තැබෑරුම් ලැයිස්තුවේ සඳහන් අංකයද ටැන්ඩර් පත්‍රය ඉදිරිපත් කරන තැබෑරුමේ නමද, සීල් කරන ලද ලියුම් කවරයේ වම් පැත්තේ සඳහන් කර ටැන්ඩර් පත්‍රය එහි බහා එවිය යුතුය. ටැන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කරන වේලාවට ප්‍රථම, සෑම ටැන්ඩර් පත්‍රයක්ම සීල් කරන ලද ලියුම් කවරයේ බහා කච්චේරියේ ටැන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය. එසේ නොමැති නම් ටැන්ඩර් පත්‍රය භාර ගැනීම අවසන් කරන වේලාවට ප්‍රථම පහත අත්සන් කරන තැනැත්තාට ලැබෙන ලෙස ලියා පදිංචි කරන ලද සීඝ්‍රගාමී තැපෑලෙන් එවිය යුතුය.

6. වරප්‍රසාද මිලදී ගැනීම ප්‍රකාශ කළවිට සාර්ථක ලෙස ටෙන්ඩරයක් ඉදිරිපත්කළ ටෙන්ඩර්කරු මිළදී ගත් තැනැත්තා හැටියට ප්‍රකාශ කළ එම දිනයේ සවස 4 පසු නොවී කුමන වේලාවකද හෝ රේන්ද විකිණීමේ කොන්දේසි අත්සන් කර ඇප මුදල වශයෙන් දිසාපති තැන විසින් නියම කරන ලද මුදල දිසාපති තැනට ගෙවිය යුතුය. ලංකා බැංකුවෙන් නිකුත් කරන ලද හෝ බැංකුවෙන් මාරුකළ හැකි '' ආරක්ෂක චෙක් '' යනුවෙන් හැඳින්වෙන චැක්පත් වලින් හෝ බැංකුවකින් ගෙවිය හැකි '' ගෙවීමට '' යයි නම් කරන ලද චැක්පතකින් හෝ මුදල්වලින් හෝ එම මුදල තැන්පත් කළ යුතුය.

7. සෑම ටැන්ඩර්කරුවෙක්ම, ටෙන්ඩර්පත්‍ර භාරගැනීම අවසන්කරන වේලාවට කුරුණෑගල දිසාපති කායර්‍ාලයේ පෙනී සිටිය යුතුය.

8. වැඩි විස්තර කුරුණෑගල දිසාපති කාර්යාලයෙන් ලබා ගත හැක.

1965 ජූනි මස 4 වැනි දින,
කුරුණෑගල දිසාපති කායාර්ලයේදී ය.

පාලිත වීරමන්,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ දිසාපති ක.න.

| අනුක්‍රමික අංකය | කොට්ඨාශය | තැබෑරුම පිහිටවිය යුතු ප්‍රාදේශීය කොටස | තැබෑරුම විවෘත කරන වේලාව | තැබෑරුම වසන වේලාව | ටැන්ඩර් පත් භාර ගැනීම අවසන් කරන වේලාව |
|---|---|---|---|---|---|
| 1. ගිරිඋල්ල | ... ක. හ. ප. | ... මල්ගමුව ග්‍රාමය තුල | ... පෙ.ව. 8.00 | ... ප.ව. 7.00 | ... පෙ.ව. 9.30 |
| 2. උඩුබද්දව | ... ක. හ. ප. | ... උඩුබද්දව ග්‍රාමය තුල | ... පෙ.ව. 8.00 | ... ප.ව. 7.00 | ... පෙ.ව. 10.30 |
| 3. පඹදෙණිය | ... ද. දෙ. හ. ප. | ... පඹදෙණිය ග්‍රාමය තුල | ... පෙ.ව. 8.00 | ... ප.ව. 7.00 | ... පෙ.ව.11.30 |
| 4. නාරම්මල | ... ද. දෙ. හ. ප. | ... නාරම්මල ග්‍රාමය තුල | ... පෙ.ව. 8.00 | ... ප.ව. 7.00 | ... ප.ව. 1.30 |
| 5. කටුපිටිය | ... වැ.පි.හ.ප. | ... කටුපිටිය ග්‍රාමය තුල | ... පෙ.ව. 8.00 | ... ප.ව. 7.00 | ... ප.ව. 2.30 |
| 6. කුරුණෑගල | ... කුරුණෑගල නගර සභාව, කුරුණෑගල | ...කුරුනෑගල නගර සභාවේ අංක 1,9,11,12 දරණ කොට්ඨාශ සීමා තුල ... | පෙ.ව. 8.00 | ... ප.ව. 8.00 | ... ප.ව. 3.30 |

6–458—65.6.11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රය

සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරව සැම්ණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායක මුදල් භාරගනු නොලැබේ.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි " ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන් " හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි